# කිතාබ් අල් තවුහීද්

කර්තෘ :

ෂෙයික් මොහමඩ් ඉබ්න් අබ්දුල් වහබ්

සිංහල පරිවර්තනය: එම්.අයි.බී.ලතීෆ්

# كتاب التوحيد

للشيخ محمد بن عبد الوهاب

باللغة السنهالية

INTERNATIONAL ISLAMIC
PUBLISHING HOUSE

# කිතාබ් අල් තව්හීද්

කර්තෘ :

ෂෙයික් මොහමඩ් ඉබ්න් අබ්දුල් වහබ්

සිංහල පරිවර්තනය: එම්.අයි.බී.ලතීෆ්

# كتاب التّوحيد

باللغة السنهاليّة

للشيخ محمّد بن عبد الوهّاب

INTERNATIONAL ISLAMIC
PUBLISHING HOUSE

بسم الله الرحمن الرحيم

# IN THE NAME OF ALLAH
# THE MERCIFUL THE COMPASSIONATE

1992 A.D.- 1413H


الدار العالمية للكتاب الاسلامي

ص ب: ٥٥١٩٥ ـ الرياض ١١٥٣٤ ـ هاتف ٤٦٥٠٨١٨ ـ ٤٦٤٧٢١٣ ـ فاكس ٤٦٣٣٤٨٩

**INTERNATIONAL ISLAMIC PUBLISHING HOUSE**

P.O. Box 55195 Riyadh 11534 - Saudi Arabia - Tel. 4650818 - 4647213 - Fax 4633489

අල්ලාහ්ට දුන් ප්‍රතිඥාව සත්‍ය ලෙසින් ඉටු කළාවූ මිනිස්සු විශ්වාස කරන්නවුන් අතරේ සිටිති. ඔවුන්ගෙන් ඇතැමෙක් (සටනෙහි) මරණයට පත්වීමෙන් එය ඉටු කළෝය. තවත් සමහරෙක් එය බලාපොරොත්තු වන්නෝය. ඔවුහු කිසි විටෙක තමන්ගේ අධිෂ්ඨානය වෙනස් නොකළෝමය.
අල්කුර්ආන් 33:23

## පෙරවදන

මෙම කුඩා ග්‍රන්ථය දැවැන්ත ව්‍යාපාරයක ප්‍රබල බලවේගයක් වේ. මෙම පොතේ කර්තෘ වන මුහම්මද් ඉබ්න් අබ්දුල් වහබ්ගේ ජීවිත කාලය තුළදී (ක්‍රි.ව. 1703 සිට ක්‍රි.ව. 1792) ආරම්භවූ මෙම ව්‍යාපාරය පසුගිය ශත වර්ෂය තුළදී මුස්ලිම් ලෝකය පුරා සීඝ්‍රයෙන් පැතිර ගියේය. ලොවේ සෑම ප්‍රදේශයකම පැතිර ගිය මෙම ව්‍යාපාරය මුස්ලිම් ලොවේ නොයෙක් රටවල විවිධ නම් වලින් හා විවිධ ස්වරූපයෙන් ඉදිරියට ආවේය. එහෙත් එය සෑම ස්ථානයකම මුහම්මද් නබි (සල්) වහන්සේගේ සම්ප්‍රදායික ඉගැන්වීම්වලට අනුකූලව පැවතුනේය. තවද ශුද්ධ කුර් ආනයෙහි ජීවගුණයන්, ආඥාවන් හා නිර්දේශයන් මෙන්ම නබි (සල්) වහන්සේනේ සුන්නාවන්

මුස්ලිම්වරුන්ගේ හදවත්වලට කිඳා බැස්සවීමට මෙම ව්‍යාපාරය සමත්විය.

දිගු කලක් තිස්සේ මුස්ලිම්වරුන් පරිහානියට යමින් සිටින බවත් සතුරන් විසින් ඔවුන් අභිභවා නැගී සිටින බවත් අවබෝධකර ගැනීම තුළින් මෙම ව්‍යාපාරය බිහිවිය. ඉස්ලාම් දහමේ මූලික ප්‍රතිපත්තීන් අනුගමනය කිරීමෙහිලා දැක්වූ උදාසීනත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම තත්ත්වය උද්ගතවූ බව මෙම ව්‍යාපාරය විසින් සොයා ගන්නා ලදී. මුස්ලිම්වරුන්ගේ අධ්‍යාත්මික දිවිය සහ ආගමික විධික්‍රම තුළට සූෆි අදහස් රිංගවීම තුළින් තව්හිද් යටපත්විය.

මෙම රෝගය හෝ රෝග විනිශ්චය අළුත් දෙයක් නොවේ. 16 වන සියවසේදී ඔටෝමන් නායකත්වය යටතේ බෙසන්තියම, රුසියාව සහ යුරෝපයට එදිරිව ජයග්‍රාහී ඉදිරි පියවර තැබීමට පෙරාතුවද එක් අවධියක ඉස්ලාම් ලෝකය පරිහානියට පත්විය. ඊට පෙරාතුව ස්පාඤ්ඤයෙන් පලවා හරිනු ලැබූ මුස්ලිම්වරුනට විරුද්ධවාදීන්ගේ ප්‍රහාරයන්ට භාජනය වීමට සිදුවිය. මධ්‍යම ආසියාවේ මොන්ගෝලියන්වරුන් සහ ටාටාවරුන්ගේ ආක්‍රමණයන් ගණනාවකටම ඔහු භාජනය වූහ. අවසානයේදී ජෙන්ගිස් ඛාන් සහ ඔහුගේ පුත් හුලාගු විසින් නගරයෙන් නගරය විනාශ කරමින් දස ලක්ෂ සංඛ්‍යාත ජනතාව මරා දමමින් රටවල් දවා අළු කරමින් අති බිහිසුණු සමූලඝාතනයක් සිදු කළහ. මෙම භීෂණයේ අළු තුළින් ඉස්ලාමීය දහම් පඬිවරයෙකුගේ හඬ ඇසෙන්නට විය. තකියුද්දීන් අහමඩ් ඉබ්න් තයිමියා වන හෙතෙම මෙම රෝග නිධානය සහ ඊට සුදුසු

ප්‍රතිකර්මයක්ද සොයාගෙන ආගමික ප්‍රතිසංස්කරණයක් ඉදිරිපත් කළේය. ඔහුගේ ප්‍රතිසංස්කරණයන් පිළිබඳ ගඩ විරුද්ධවාදීන් විසින් මැඩපවත්වනු ලැබුවද උම්මාවේ බුද්ධිමත් හා ෂරියාහි ආරක්ෂකයින් වන උලමාවරුන්ගේ සිත් තුළ ඔහුගේ ඉගැන්වීම් හා ප්‍රතිපත්තීන් ජීවමාන විය. ඉබ්නු තයිමියාගේ අදහස්වලින් මුහම්මද් ඉබ්න් අබ්දුල්-වහබ් ආභාසයක් ලැබීම පුදුමයට කරුණක් නොවේ. ෂරියාවේ තවත් තරුණ සිසුන් ද එම මාර්ගයෙහි ගමන් කරන්නට ඇත. අති විශේෂ සිද්ධියක් වශයෙන් පෙනෙන්නේ ආලිම් සහ මුහම්මද් ඊබ්න් සෞද් කුමරු අතර සන්ධානයක් ඇතිවීමයි.

මෙය සිදුවූයේ මධ්‍යම අරාබියාවේ පිහිටි දාරියාහ් නමැති ගම්මානයේය. මෙය මුස්ලිම් ලෝකයේ හුදකලාවූ ප්‍රදේශයකි. එය කෙදිනක හෝ ආගමික ව්‍යාපාරයක මධ්‍යස්ථානයක්වී නොතිබූ ප්‍රදේශයකි. එය කෙදිනක හෝ ආගමික ව්‍යාපාරයක මධ්‍යස්ථානයක්වී නොතිබූ ප්‍රදේශයකි. නැගෙනහිර යුරෝපයෙහි, නැගෙනහිර මුස්ලිම් ජාතිකයින් සහ බටහිර ක්‍රිස්තියානින් අතරේ සිදුවූ ගැටුම් කිසිවක් ඔවුහු දැන නොසිටියහ. නැපෝලියන්ගේ ඊජිප්තු ආක්‍රමණයට පෙරාතුව මෙම ව්‍යාපාරය බිහිවී පරිනතභාවයට පත්විය. නවීන දාරියාහ් ගම්මානය ඉස්ලාමීය නවෝදයේ කේන්ද්‍රස්ථානය බවට පත්විය.

මෙම ප්‍රතිසංස්කරණයේ ප්‍රධානතම බලවේගය වූයේ ඉස්ලාමයේ අභ්‍යන්තරික ජීවගුණයයි. මෙහි හරය ගැබ්වී ඇත්තේ "ලාඉලාහ ඉල්ලල්ලාහ්" අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නැත යන කලිමා පාඨය තුළය. මෙයට තව්හිද් යයි

කියනු ලැබේ. අල්ලාහ් ඒකීයය, අද්විතීයය, අනභිබවනීයය, ඔහු මැවුම්කාරයාණන්ය, පෙර පැවති, දැනට පවත්නා සහ ඉදිරියේ පැවතිය හැකි සියළු දෙයෙහිම ආරම්භය මෙන්ම අවසානයද සිදුවනුයේ ඔහුගේ අභිමතය අනුවය. එබැවින් සියළු ප්‍රශංසා සහ නැමදුම් හිමිවිය යුත්තේ ඔහුට පමණි. ආඥාවේ සහ මගපෙන්වීමේ පරමාධිපත්‍යය ඔහු සතුය. ඔහු කෙරෙහි බිය බැති බව දැක්වීම මුස්ලිමෙකුගේ ප්‍රථම හා අවසාන යුතුකම වන්නේය. යමෙක් තව්හිද් මත අවලව පිහිටි සිටින්නේ නම් අල්ලාහ්ගේ ඒකීයභාවය කෙරෙහි පවත්නා විශ්වාසය බිඳකින් හෝ අඩුවිය නොයුතුය. අල්ලාහ් කෙරෙහි පවත්නා පක්ෂපාතීත්වය තව කෙනෙක් හා බෙදාගත නොයුතුය. එහෙත් දැනට සිදුවී ඇත්තේ සිදුවිය නොයුතු දෙයක් ය.

මෙම ග්‍රන්ථයේ නම තව්හිද් ය. තව්හිද් හි මූල ධර්මයන් මෙම පොතින් විශ්ලේෂණයට භාජනය කර ඇත. මෙම ග්‍රන්ථය ප්‍රතිසංස්කරණයේ මාධ්‍යයක් වශයෙන් උපයෝගිකර ගැනීම කර්තෘගේ බලාපොරොත්තුව වූ බැවින් ඔහු තමන් විසින් ඉදිරිපත් කරන මූලධර්මයන්ගේ හිතකර ප්‍රතිඵලයන් සාක්ෂාත්කර ගැනීමට වඩා වැඩි අවධානයක් යොමුකර ඇත්තේ වැරදි අවබෝධයක් පහකිරීම සඳහාය. මෙලොව සන්තුෂ්ටිය මෙන්ම මතුලොව තෘප්තියද හිමිවන්නේ දිව්‍යමය ආඥාවන් නොපිරිහෙලා ඉටු කරන විශ්වාසවන්තයිනටය, යන්න ඔහුගේ සහ සෙසු බැතිමත් මුස්ලිම්වරුන්ගේ අදහස වේ. මුහම්මද් ඉබ්න් අබ්දුල්-වහබ් විසින් මෙම කෘතියෙන් කරනු ලබන්නේ මූලධර්මයන් සම්බන්ධයෙන් පවත්නා වැරදි අවබෝධය විවේචනය කිරීමය. එම කාර්යයෙහිලා ඔහු භාවාත්මක හැඟිමකින් යුක්තව

සිය පැන මෙහෙයවා ඇති බැවින් මෙම පොත විධිමත් නිබන්ධනයකට වඩා සිසුවෙකුගේ කටු සටහන් පොතක ස්වරූපය ගනී. තව්හීද් හි ඇති ගැඹුරුකම නිසා එහි සෑම අංශයක්ම පරිපූර්ණ වශයෙන් සමීක්ෂණය කිරීම හෝ ගවේෂණය කිරීම අපහසුය. එබැවින් වැඩිදුර හැදෑරීම සඳහා වූ විෂයයන් ඉස්මතු වන කරුණු යටතේ දක්වා ඇත.

එසේවතුදු, මෙම පොතේ පරිච්ඡේදයකින්ම චින්තනය සඳහා කවුළුවක් විවෘතවේ. මුස්ලිම්වරුන්ගේ පරිහානියට ප්‍රධානතම හේතුව වූයේ තර්කානුකූල සාධාරණත්වය වෙනුවට මිථ්‍යා මත තුරුළුකර ගැනීමයි. මෙම ආකල්පය ඉබ්න් අබ්දුල් වහබ් හඳුන්වන්නේ තව්හීදය උල්ලංඝනය කිරීමක් වශයෙනි. එක් අවධියකදී බටහිර චින්තන රටාවෙහිද මෙවන් ප්‍රතිසංස්කරණයක් සිදුවිය. එහෙත් තර්කාන්විත සාධාරණත්වය සඳහා පල්ලිය සමඟ කරනු ලැබූ අරගලයෙන් ලත් ජයග්‍රහණයෙන් පසු ඔවුහු භෞතිකවාදය සහ ලෞකිකභාවය කරා ඇදී ගොස් අවසානයේදී ව්‍යාකුලත්වයට පත්වූහ. ඉස්ලාමයෙහි, මිථ්‍යා වාදයෙන් මිදීමේ අධිෂ්ඨානය ක්‍රියාත්මක වනුයේ තව්හීද් යටතේය. මුහම්මද් ඉබ්න් අබ්ද් අල් වහම් විසින් පැහැදිලි ලෙස මෙම පොතේ පෙන්වාදී ඇති අයුරු තවහීදය මුලින්ම මිථ්‍යා මත වලට විරුද්ධව ආරම්භ කරනු ලැබූ ව්‍යාපාරයෙකි. මුලදී එය පසුබෑමකට භාජනය වුවද දැන් එය සතුරා පරාජය කිරීම සඳහා බලසම්පන්නව නැඟී සිටී.

ඉස්මායිල් ආර්. අල්ෆාරූකී.
ටෙම්පල් විශ්ව විද්‍යාලය, ෆිලදෙල්ෆියාව.

# පටුන

පරිච්ඡේදය


1. තව්හීද් 16

2. තව්හීද්හි යහපත්කම සහ එහි මහිමයෙන් දුරුවී යන පාපයන් 22

3. තව්හීද් අනුව දිවි ගෙවන තැනැත්තා ප්‍රශ්න කිරීමකින් තොරව ස්වර්ගයට පිවිසේ 26

4. ෂිර්ක් පිළිබඳ බිය 32

5. අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නැත යනුවෙන් සාක්ෂි දැරීමට කරනු ලබන කැඳවීම 35

6. තව්හීදය සහ අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නැත යනුවෙන් සාක්ෂි දැරීම පිළිබඳ පැහැදිලි කිරීමක් 41

7. රෝග වැළඳීම වැළැක්වීම සඳහා හෝ රෝග නිවාරණය සඳහා සූෂි වස්තු ඇඳගැනීම ෂිර්ක් 45

8. යන්තර, මන්තර, ගුරුකම් භාවිතකරණය 49

9. ගස් ගල්වලට නැමදීම 52

10. අල්ලාහ් වෙනුවෙන් හැර කුර්බාන් කිරීම 57

11. වෙනත් අයෙකු නමින් ප්‍රාණ පූජාවක් සිදුකරන ස්ථානයක අල්ලාහ්ගේ නමින් කුර්බාන් නොකළ යුතු බව 62

12. අල්ලාහ් හැර අන්කිසිවෙකුට බාරයක්වීම ශිර්කයකි. 65

13. අල්ලාහ් හැර අන් කිසිවෙකුගේ රැකවරණය සෙවීම ෂිර්කයකි. 67

14. අල්ලාහ් හැර අන් කිසිවෙකුගේ රැකවරණය සෙවීම ෂිර්කයකි. 69

15. කිසිදෙයක් මැවීමේ ශක්තියක් නැති එහෙත් මවනු ලැබ ඇති දේ ඔවුහු මට සමානයන් කරන්නෝද? තමනට පවා උදව්කර ගන්නට ඔවුනට නොහැක.

16. විනිශ්චය දිනයේදී ඔවුන්ගේ සිත් තුළින් එය ඉවත්කරනු ලැබ ඔබේ ස්වාමීන්ද්‍රයාණන් විසින් කවර අන්දමින් ඔබ විනිශ්චය කරනු ලැබේදැ”යි විමසනු ලැබූවිට සාධාරණ අන්දමින්, අල්ලාහ් අති උත්කෘෂ්ටය, අති උදාරය. යි ඔවුහු කියන්නෝය. 73

17. මැදිහත්වීම 84

18. ඇත්තෙන්ම (මුහම්මද්), ඔබ ප්‍රිය කරන කෙනෙකු යහමග යවන්නට ඔබට නොහැකිය. එහෙත් අල්ලාහ් ඔහු සිතූ කෙනෙකු යහමග යවන්නේය. 88

19. දැහැමි පුද්ගලයන් පුද්ගලිකාභිවාදනයෙන් ඇදහීම විශ්වාස නොකිරීමේ හේතුකාරකය වේ. 92

20. දැහැමි පුද්ගලියන්ගේ මිනීවලවල් අබියසදී අල්ලාහ් නමදින සහ දැහැමි පුද්ගලයන්ට වැදුම් පිදුම් කරන අයවලුන් හෙළාදැකීම. 97

21. මුනිවරයින්ගේ මිනී වලවල්වලට අධික ලෙසින් භක්ති ප්‍රණාමය කිරීම තුළින් ඔවුන් වැදුම් පිදුම් ලබන දෙවි දේවතාවුන් බවට පරිවර්තනය වෙති. 102

22. නබි (සල්) වහන්සේ විසින් තව්හිදය සුරැකීම සහ ෂිර්කය කරා ඇති මාර්ගයක් වැසීම. 104

23. උම්මාවේ ඇතැම් සාමාජිකයින් විසින් පිළිමවලට වැදුම් පිදුම් කරන බව 107

24. අන වින හූනියම් 112

25. භූත විධි ක්‍රම 115

26. ජේන කියන්නෝ 118

27. නුෂ්රා හුනියම් බන්ධන ආදිය ඉවත් කිරීම 120

28. තහය්යුර් හෙවත් අශුභ ඵල කීම 122

29. ජ්‍යොතිශාස්ත්‍රය 126

30. අන්වා තුළින් වර්ෂාව පැතීම 128

31. අල්ලාහ් හැර (ඔහුට) සමානයක් කරගනු ලැබූ දැය දෙවියෙකු වශයෙන් ගත් අයද මිනිසුන් අතර ඇත. ඔවුහු ඒ සමානයන් කරගනු ලැබූ දැය, අල්ලාහ්ට ප්‍රිය කරන්නාක් මෙන් ප්‍රිය කරන්නෝය. 132

32. සාතාන්මය සිය අනුගාමිකයින්ගේ සිත් තුලට බිය ඇතුළු කරන්නේ, තොපි ඔවුනට බිය නොවවු. තොපි විශ්වාස කරන්නවුන් නම් මට බියවවු. 136

33. ඔබලා විශ්වාසය තබා සිටින්නවුන් නම් අල්ලාහ් කෙරෙහි බලාපොරොත්තු තබව. 139

34. අල්ලාහ්ගේ දඬුවමින් ඔවුහු මිදුනේද? අල්ලාහ්ගේ දඬුවමෙහි බියෙන් තුමු මිදෙන්නෝයයි නටුවන් මින නොහහින්නෝය. 141

35. අල්ලාහ්ගේ ක්‍රියාදාමයන් ඉවසා දරා සිටීම ඊමානය සඳහා අත්‍යාවශ්‍යවේ. 143

36. කුහකකම 146

37. ලෞකික ආශාවන්හි බැඳී සිටීම ෂිර්ක් වේ. 148

38. තහනම් කරනු ලැබ ඇති දේ නීත්‍යානුකූල කිරීම සඳහා ද එමෙන්ම නීත්‍යානුකූලවූ දෙයක් තහනම් කිරීම සඳහා ද ‘උලමා’ (ධර්මාචාර්ය) කෙනෙකුට හෝ පාලකයෙකුට යටත්වී ක්‍රියාකිරීම. ඔවුන් අල්ලාහ් සමඟ සමානයන් වශයෙන් සැලකීම වේ. 151

39. “මුඹ වෙතැ, පහල කරනු ලැබූ දැය ගැනද විශ්වාස කරන්නාහු යයි කියන අය ගැන මුඹ මෙනෙහි නොකළෙහිද? එය ප්‍රතික්ෂේප කළ යුතු යයි ඔවුන් අණකරනු ලැබූ කල්හි තාගුත් වෙතැ විනිශ්චය සෙවීමට ඔවුහු අදහස් කරන්නෝය.” 154

40. අල්ලාහ්තආලාගේ ඇතැම් නම් හා ගුණාංගයන් ප්‍රතික්ෂේප කිරීම 158

41. ඔවුහු අල්ලාහ්ගේ අනුග්‍රහය දනිති, එහෙත් ඔවුහු එය ප්‍රතික්ෂේප කරති. ඔවුන්ගෙන් වැඩි දෙනෙක් අකෘතඥයහ. 160

42. ”එහෙයින් තොප දැනුවත්ව අල්ලාහ්ට සමානයන් නොතබවු.” 162

43. තරගකරුවෙකු අල්ලාහ්ගේ නමින් පමණක් දිවුරීම. 165

44. අල්ලාහ් සහ ඔබ එසේ අධිෂ්ඨාන කර තිබීම කොතරම් පුදුම සහගතද යනුවෙන් කීම. 166

45. අල් දහ්රයට දොස් පැවරීම පූජනීයවූ දෙයකට අවමන් කිරීම වේ. 169

46. විනිසුරුවන්ගෙනුත් විනිසුරු වැනි නම්බුනාම. 171

47. අල්ලාහ්ගේ නාමයන්ට ගරු කිරීම සහ අවශ්‍ය වුවහොත් නම් වෙනස් කිරීම. 173

48. අල්ලාහ්, කුර්ආනය හෝ රසූල්වරයාණන් සරදමට ලක් කිරීම. 175

49. 'ඔහුට සිදුවූ විපතකින් පසුව දයාලු බවක් අප ඔහුට දැක්වී නම් මේ මගේ යහකම් වලින් ලබාගත් භාග්‍යයක් යයි ඔහු කියනු ඇත.' 177

50. "ඔහු ඔවුනට යහපත්වූ දරු සම්පත් ප්‍රදානය කළ කල්හි එම භාග්‍යය පිරිනමනු ලැබූ ඔහුට ඔවුන් සමානයන් තබති.' 181

51. ඉතාමත් ලක්ෂණ නම් අයත් වන්නේ අල්ලාහ්ටය. ඒ නම් වලින් ඔහුට අඬගසව්. එම නාමයන්ට නිගරු කරන අය පිටු දකිවු. 184

52. "අල්ලාහ්ට සාමය ඇතිවේවා" යනුවෙන් ශුභ පැතීම තහනම් කර තිබීම. 186

53. "අල්ලාහ් දෙවියන් වහන්ස, ඔබ වහන්සේ කැමති නම් මට සමාව දෙනු මැනව" යනුවෙන් යාඥා කිරීම. 187

54. "මගේ සේවකයා" හෝ "මගේ දාසයා" යයි යමෙකු ඇමතීම තහනම්කර තිබීම. 189

55. අල්ලාහ්ගේ නමින් යමක් ඉල්ලන තැනැත්තෙකුට ඉල්ලන දෙය දීම යුතුකමක් වේ. 191

56. අල්ලාහ්ගේ නාමයෙන් අයැද සිටිය හැක්කේ ස්වර්ගයේ වාසය ලබාදෙන ලෙස පමණි. 193

57. කොන්දේසි සහිතව යමක් කීම. 196

58. සුළඟට දොස් නොපවරනු. 198

59. සාවද්‍ය ලෙසින් අල්ලාහ් ගැන සැක පහල කිරීම තහනම් කිරීම. 199

60. 'කද්ර් ප්‍රතික්ෂේප කරන්නෝ' 202

61. "පිළිරූ තනන්නෝ" 204

62. “නිතර දිවුරීම” 207

63. “අල්ලාහ්ගේ සහ රසූල්වරයාගේ පොරොන්දු” 210

64. “අල්ලාහ්ගේ නමින් දිවුරීම” 213

65. අල්ලාහ් විසින් මවනු ලැබූ අයෙකුට විරුද්ධව ක්‍රියා කරන ලෙස අල්ලාහ්ගෙන් ඉල්ලා සිටිය නොයුතුය. 215

66. නබි (සල්) වහන්සේ විසින් තවුහිදය සුරැකීම සහ ෂිර්කය කරා ඇති මාර්ග ඇහැරීම. 217

67. අල්ලාහ් අගය කළයුතු ප්‍රමාණයට ඔවුහු ඔහු (අල්ලාහ්) අගය නොකරති. විනිශ්චය දිනයේදී මුළු මහත් පොලෝ තලය ඔහුගේ හස්තයේය. 219

********************

## 1 වන පරිච්ඡේදය

### තව්හීද්

අල්ලාහ්තආලා මෙසේ වදාරා ඇත. "මම ජින්නුන් ද, මනුෂ්‍යයන්ද මා නැමදීමට මිසක් නොමැව්වෙමි....." ඔවුන් විසින් අල්ලාහ් නැදිය යුතු බවත් තාගූත් අත්හැරිය යුත් බවත් දන්වා අප එක් එක් ජන කොට්ඨාශයකටම රසූල්වරයෙකු එවුවෙමු..... ඔහුට හැර අන් කිසිවෙකුට නැමදුම් නොකරවු. දෙමාපියනට කාරුණික වවු. අල්ලාහ් නමදිවු. ඔහුට කිසිවකින් සමානයක් නොතබවී.... වරෙවු! තොප කෙරෙහි තොපගේ ස්වාමින්ද්‍රයාණන් විසින් තහනම් කළ දෙය මම කියා පාන්නම්. එනම් ඔහුට කිසිවක් සමාන නොකරවු [1]

ඉබ්න් මසූද් විසින් පහත දැක්වෙන ශුද්ධ කුර්ආන් පාඨය කෙරෙහි ජනතාවගේ අවධානය යොමු කරයි. "වරෙවු! තොප කෙරෙහි තොපගේ ස්වාමින්ද්‍රයාණන් විසින් තහනම් කළ දෙය මම කියා පාන්නෙමි. එනම් ඔහුට කිසිවක් සමාන නොකරවු.... එය මගේ ඍජු මාර්ගයයි. [2]

මුආද් ඉබ්න් ජබල් මෙසේ වාර්තා කරයි! දිනක් මම මුහම්මද් නබි (සල්) වහන්සේ පසුපස සතෙක් පිට ගමන් කරමින් සිටියෙමි. එවිට උන්වහන්සේ මගෙන් මෙසේ විමසූහ. "මුආද්! අල්ලාහ්ට මිනිසුන් ගෙන් හිමිවිය යුත්තේ කුමක්ද එමෙන්ම මිනිසුනට හිමිවිය යුත්තේ කුමක්දැයි මම දන්නෙහිද?" එවිට ඔබ

ඒ ගැන හොඳාකාරව දැන සිටින්නේ අල්ලාහ් සහ ඔහුගේ දූතයාණන් යයි පිළිතුරු දුනිමි. එවිට උන්වහන්සේ තවදුරටත් මෙසේ වදාළහ. "අල්ලාහ්ට මිනිසුන්ගෙන් හිමිවිය යුත්තේ ඔහු පමණක් නැමදීම හා ඔහුට කිසිවෙක් සම නොකිරීම වේ. මිනිසුන්ට හිමිවිය යුත්තේ අල්ලාහ් සමඟ අන් කිසිවෙකු සම නොකරන අයෙකුට දඬුවම් නොපැනවීමයි." මෙය ඇසූ මම "අල්ලාහ්ගේ දූතයාණෙනි; එසේ නම් මෙම ශුභ පණිවුඩය මම ජනතාවට සැලකරන්නදැ"යි විමසුවෙමි. එයට පිළිතුරු වශයෙන් උන්වහන්සේ "එපා, ඔවුන්ට එවන් නිශ්චිත පොරොන්දුවක් දෙනු ලැබුවහොත් ඔවුන් ඒ කෙරෙහි පමණක් බලාපොරොත්තු තබමින් අල්ලාහ් කෙරෙහි ඉටුකළ යුතු මෙහෙවර පිළිබඳව උදාසීනවීමට ඉඩ තිබේ." යයි වදාළහ. ඉහත සඳහන් හදීසය සහී දෙකෙහිම වාර්තාවේ.

## ඉස්මතුවන කරුණු

1. ජින්වරුන් සහ මිනිස් වර්ගයා මැවීමේ ප්‍රඥාව.

2. අල්ලාහ්ට සේවය කිරීම තව්හීද්හි ගැබ්වී ඇත. තව්හීද්වලට පටහැනිවීම (අල්ලාහ්ට යමෙක් සම කිරීම) මගින් හටගන්නේ අල්ලාහ්ගෙන් දුරස්ථවීමයි.

3. යමෙක් තව්හීද් හි අවශ්‍යතාවයන් නොසපුරා ලන්නෙහි නම් හෙතෙම අල්ලාහ්ට සේවය කර නොමැත. "තවද තොපි මා නමදින දැය නොනැමදින්නනුය."[3] යන පාඨයේ අර්ථය දැකිය හැක්කේ තව්හීද් තුළය.

4. අනාගත වක්තාන් වහන්සේලා පහළ කිරීමේ ප්‍රඥාව.

5. අල්ලාහ්ගේ පණිවුඩය පොළෝ තලයේ වසන සෑම ජන කොට්ඨාශයක් වෙතම පතුරුවනු ලැබ ඇති බව.

6. අනාගත වක්තාන් වහන්සේලා සියළු දෙනාගේම දහම එකක්ම යන්න.

7. වැදගත්ය:- තාගුත් ප්‍රතික්ෂේප කිරීමෙන් තොරව මිසක් අල්ලාහ්ට සේවය කිරීම අංග සම්පූර්ණ නොවේ. "යමෙක් තාගුත් ප්‍රතික්ෂේප කොට අල්ලාහ් ගැන විශ්වාස කෙරේද......"[4] යන පාඨයේ අර්ථය ඉස්මතු වන්නේ මෙහිදිය.

8. සාමාන්‍ය වශයෙන් බලනවිට තාගුත් යනු අල්ලාහ් හැර අන් කිසිවෙකුට සේවය කිරීම වේ.

9. සූරා "අල් අනාම්" හි[5] අඩංගු පැහැදිලි පාඨයන් තරයේ වැදගත්කම කෙරෙහි අවධානය යොමු කෙරේ. තහනම් කරනු ලැබ ඇති දේවල් දහයක් මෙහි අඩංගුවේ. ඉන් පලමුවැන්න "ෂිර්ක්" එනම් සමාන කිරීම තහනම් කිරීමවේ.

10. සූරා "අල් ඉස්රා" (බනී ඉස්රාඊල්)[6] හි පැහැදිලිව
දක්වා ඇති පාඨයන් දහඅට. මෙහි පළමුවන පාඨයෙහි
මෙසේ සඳහන්වේ. "නැමදුම සඳහා අල්ලාහ් සමඟ තව
කෙනෙකු ඇදා නොගනිවූ. එසේ කළහොත් ඔබ බරපතල
වරදකට හා පරාජයට පත්වන්නෙහිය." මෙහි අන්තිම
පාඨයෙහි මෙසේ දැක්වේ. "අල්ලාහ් සමඟ අන් දෙවියෙකු
(නැමදුම සඳහා නොගනුව. එසේ කළහොත් ඔබ ගරහනු
ලැබ වර්ජනය කරන ලදුව නිරයට හෙළනු ලබන්නෙහිය."[7]
අල්ලාහ් සුබ්හානහුවතාආලා විසින් මෙම ප්‍රශ්නවල
බැරෑරුම්කම ගැන අපේ අවධානය මෙසේ යොමු කරන
සේක. "මෙය ඔබගේ ස්වාමීන්ද්‍රයාණන්ගේ ප්‍රඥාප්තීන්ගෙන්
ඔබලාට හෙළිකල දෙයින්ය. "[8]

11. මිනිසාගේ යුතුකම් දහය අඩංගු පාඨය යනුවෙන් හැඳින්වෙන
සූරා "අන් නිසා" හි අදාල පාඨය ආරම්භ වන්නේ මෙසේය:
"අල්ලාහ් පමණක් නමදිවූ. ඔහුට කිසිවකින් සමානයක්
නොතබවූ."[9]

12. අල්ලාහ්ගේ දූතයාණන්වූ මුහම්මද් නබි (සල්) වහන්සේ
විසින් සිය අවසාන මොහොතෙහි දැක්වූ අධිෂ්ඨානය
කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

13. අල්ලාහ් කෙරෙහිවූ අපේ යුතුකම්.

14. අප විසින් අල්ලාහ් කෙරෙහිවූ අපේ යුතුකම්, ඉටු කරනු ලැබුවහොත් අල්ලාහ්ගෙන් අපට හිමිවන අයිතීන්.

15. අවසාන කරුණ දූතයාණන් වහන්සේගේ ශ්‍රාවකයින් බොහෝ දෙනෙක් දැන නොසිටියහ.

16. මිනිසා විසින් අල්ලාහ්ට කරණු ලබන සේවය උපරිම වශයෙන් රදවා ගැනීම අරබයා මෙම කරුණ රහසක් වශයෙන් තබා ගැනීමට දී ඇති අවකාශය.

17. ශුභ පනිවුඩය මුස්ලිම්වරුනට දැනුම්දීමේ ඇති වටිනාකම.

18. අල්ලාහ්ගේ ක්ෂමාවදීමේ පොරොන්දුව මත විශ්වාසය තැබීමේ බිය.

19. අවබෝධ නොවන ප්‍රශ්නයන්ට පිළිතුරු දීමේදී "ඒ ගැන හොදාකාරව දැන සිටින්නේ අල්ලාහ් සහ ඔහුගේ දූතයාණන්ය." යනුවෙන් කීම.

20. දැනුම ඇතැම් අයට දීමටත් තවත් අයට නොදීමටත් ඇති හැකියාව.

21. තවත් කෙනෙකු පටවාගෙන කොටළුවෙකු පිට ගමන් කිරීමට තරම් නබි (සල්) වහන්සේ නිහතමානීවීම.

22. බරපටවන සතෙක් පිට දෙදෙනෙකු ගමන් කිරීමේ නීත්‍යානුකූලතාවය.

23. මුආද් ඉබ්න් ජබල්ගේ යහපත්කම

24. මෙම කරුණේ වැදගත්කම.

## පා සටහන්

[1] අල්කුර්ආනය 51:56, 16:36, 1:23, 4:36,6:151-153
අදාල කුර්ආන් පාඨයේ මුල් වාක්‍යය හෝ වාක්‍යයන් පමණක් මෙහි උපුටා දක්වා ඇත. - පරිවර්තක

[2] අල්කුර්ආනය 6:15-153

[3] අල්කුර්ආනය 109:3

[4] අල්කුර්ආනය 2:256

[5] අල්කුර්ආනය 6:151:153

[6] අල්කුර්ආනය 17:22-39

[7] අල්කුර්ආනය 17:39

[8] අල්කුර්ආනය 17:39

[9] අල්කුර්ආනය 4:36

## 2 වන පරිච්ඡේදය

### තව්හිද්හි යහපත්කම සහ එහි මහිමයෙන් දුරුවී යන පාපයන්

අල්ලාහ්තආලා මෙසේ වදාළහ. "අල්ලාහ් ගැන විශ්වාස තබවින් එකී විශ්වාසය සමානයන් තැබීම මගි නොකෙළෙසෙන්නාවූ අයට......"¹ අල්ලාහ්ගේ දූතයාණ පහත සඳහන් අයුරු වදාරා සිටි බව උබාදා ඉබ්න් අල් සාමි වාර්තා කරයි. "අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නැ ඔහුට සමානයෙක් නැත, මුහම්මද් ඔහුගේ සේවකයා ස දූතයාය. ඊසා (ජේසුස්) ඔහුගේ සේවකයා සහ දූතයාය, ඔ විසින් මේරි (මරියා) සහ ඔහුගේ ශුද්ධාත්මයට ආශ පැනැවීමෙහිය, ස්වර්ගය සහ නිරය සත්‍යය යනුවෙන් යමෙ සාක්ෂි දරන්නේද එම හේතුව මත අල්ලාහ් ඔහු ස්වර්ගය ඇතුල් කරන්නේය. මෙම හදීසය සහි දෙකෙහිම වාර්තාවී ඇ අතර නබි (සල්) වහන්සේ මෙසේ වදාල බව ඉත්බාන් වාර්ත කරයි. "අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නැත. යනුවෙ සාක්ෂි දරමින් අල්ලාහ්ගේ මුහුණ පමණක් බලන අයෙකු නිරය යැවීමට අල්ලාහ් ඉඩ දෙන්නේ නැත."

අල්ලාහ්ගේ දූතයාණන් මෙසේ වදාල බව අබූ සයිද් අ කුද්රි වාර්තා කරයි. "අල්ලාහ් සිහිපත්වූ හෝ බැහැදකින අවස්ථාවන්හි සජ්ජායනය කිරීම සඳහා යාඥාවක් තමන්ට උගන්වන මෙන් මූසා (මෝසස්) අල්ලාහ්ගෙන් අයැද සිටි අවස්ථාවක අල්ලාහ් මෙසේ පිළිතුරු දුන්නේය. "මූසා! අල්ලාහ්

හැර අන්කිසි දෙවි කෙනෙක් නැත" යනුවෙන් පවසනු. එවිට මූසා "ස්වාමීන්ද්‍රයාණෙනි! ඔබේ සේවකයන් සියළු දෙනාම උසුරුවන්නේ එම පාඨයම නොවේදැයි" විමසුවේය. එයට පිළිතුරු දෙමින් අල්ලාහ් මෙසේ වදාලයහ:

"මූසා! ආකාශ හත සහ ඒවායේ අඩංගු සියළු දේද එමෙන්ම පෘථිවි හත සහ ඒවායේ අඩංගු සියළු දේද" අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නැත." යන පාඨය සමඟ කිරා බැලුව හොත් එම පාඨය පෙරකී සියළු දෙයකටම වඩා බරින් වැඩිවනු ඇත." ඉබ්න් හිබාන්ද මෙම හදීසය වාර්තා කර ඇත. අල්ලාහ්ගේ දූතයාණන් මෙසේ වදාල බව අනාස් තුමා වාර්තාකළේ යයි අල් තිර්මිදි පවසයි: "අල්ලාහ් මෙසේ වාදළහ. "මනුෂ්‍යයිනි! මේ ලෝකයේ ඇති තරම් මලු පවින් පුරවාගෙන ඔබලා මාවෙත පැමිණියද මා හා යමෙක් සම නොකරණ බවට ඔබලා සාක්ෂි දරා ඇත්නම් මම අනුකම්පාවෙන් සහ සමවෙන් එම මලු පුරවාගෙන ඔබලා වෙත එන්නෙමි."

## ඉස්මතුවන කරුණු

1. අල්ලාහ්ගේ සමාවේ සහ අනුග්‍රහයේ පරිපූර්ණත්වය.

2. තව්හිද් සඳහා අල්ලාහ් විසින් පිරිනමනු ලබන ත්‍යාගයන් රාශිය.

3. පව් ක්ෂමා කිරීම සඳහා එහි ඇති බලය.

4. සූරා 'අල් අනාම්' හි ඇති පැහැදිලි කිරීම්.

5. උබාදා විසින් වාර්තා කරනු ලැබ ඇති හදීසයේ අඩංගු ප්‍රශ්න පහ.

6. ඉත්බාන්ගේ සහ උබාදාගේ හදීස්වලින් "අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නැත" යන්නෙහි අර්ථය පැහැදිලිවනාතර රැවටීමට භාජනය වූවන්ගේ සාවද්‍යතාවය පිළිබිඹු කරයි.

7. ඉත්බාන්ගේ හදීසයේ අඩංගු කරුණු කෙරෙහි අවධානය යොමුකිරීම.

8. "අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නැත" යනුවෙන් සාක්ෂි දැරීම ගැන නබි (සල්) වහන්සේ විසින් මතක් කරදීම.

9. සෑම මැවිල්ලකටම වඩා එය උසස් බව පෙන්වීම.

10. පොළෝ හතක් ද එමෙන්ම ආකාශ හතක් ද ඇති බවට තිබෙන්නාවූ සාක්ෂි.

11. පොළෝ හතෙහිම ජීවීන් ඇති බව.

12. දිව්‍යමය ලක්ෂණයන් තහවුරු කිරීම.

13. අනාස්ගේ හදිසය වැටහෙන්නේ නම් ඉත්බාන්ගේ හදිසය ද වැටහෙන බව "අල්ලාහ් හැර අන්කිසි දෙවිකෙනෙක් නැත" යනුවෙන් සාක්ෂි දරමින් අල්ලාහ්ගේ මුහුණ පමණක් බලන අයෙකුට අපායට යැමට අල්ලාහ් ඉඩ නොදෙයි. මෙයින් අල්ලාහ්ගේ දූතයාණන් අදහස් කරන්නේ නාමික වශයෙන් පමණක් නොව ඇත්ත වශයෙන්ම ෂිර්ක් පිටුදැකීමයි.

14. ඊසා සහ මුහම්මද් යන දෙදෙනාම අල්ලාහ්ගේ සේවකයන් සහ දූතයන් යනුවෙන් හැඳින්වීම.

15. අල්ලාහ්ගේ වදන ඊසා වෙත පහළ කිරීම.

16. ඊසා අල්ලාහ්ගෙන් පහළවූ ශුද්ධාත්මයක් බව.

17. ස්වර්ගය සහ නිරය පිළිබඳව විශ්වාස කිරීමේ යහගුණය.

18. උබාදාහ්ගේ හදිසයෙන් සනාථවන පරිදි සාක්ෂි දැරීම වෙනුවෙන් ලැබෙන කුසල්.

19. තරාදි තට්ටු දෙකේ කිරීම.

20. අල්ලාහ්ගේ මුහුණ යන්නෙහි අර්ථය.

පා සටහන්

[1] අල්කුර්ආන් 6:82

## 3 වන පරිච්ඡේදය

## තව්හීද් අනුව දිවිගෙවන තැනැත්තා ප්‍රශ්න කිරීමකින් තොරව ස්වර්ගයට පිවිසේ.

අල්ලාහ්තආලා මෙසේ වදාළහ. "ඇත්තෙන්ම, ඉබ්‍රාහීම් අල්ලාහ්ට කීකරුවූ ආදර්ශමත් තැනැත්තෙකි. හනීෆ් කෙනෙකි. ඔහු සමානයන් තබන්නෙකු නොවේ.[1] අල්ලාහ් විසින් සිය සේවකයන් හඳුන්වනු ලබන්නේ "තම හිමිහට සමානයන් නොතබන්නාවූ අය"[2] වශයෙනි.

හුසේන් ඉබ්න් අබ්ද් අල් රහ්මාන් මෙසේ වාර්තා කරයි. "දිනක් මම සයිද් ඉබ්න් ජුබයිර්ගේ නිවසේ සිටින විට අල්ලාහ්ගේ දූතයාණන් මෙසේ විමසනු මට ඇසුනි. "ඊයේ උල්කාපාතයක් දුටුවේ කවරෙක්ද?" එවිට මම "විසකුරැ සතෙකු විසින් දෂ්ඨ කිරීම හේතුකොට ගෙන මා නැමදුමෙහි යෙදී නොසිටි අවස්ථාවක උල්කාපාතය දුටු බව පැවසුවෙමි. එම අවස්ථාවෙහි මා කුමක් කළේදැයි උන්වහන්සේ අතුරැ ප්‍රශ්ණයක් නැඟුහ. එය සුව කිරීම සඳහා මා අධ්‍යාත්මික ප්‍රතිකාරයෙහි (රුක්‍යා) පිළිසරණ සෙවූ බව කීවෙමි. එසේ කිරීමට මා පෙළඹුනේ කෙසේදැයි උන්වහන්සේ ඇසූහ. ෂාබි විසින් සැලකර සිටින ලද බුරෙයිදා ඉබ්න් අල් හුසෙයිබ්ගේ කියමනක් අනුව එනම් "ඇස්වහ කටවහ හෝ ගෝනුස්සෙකු විසින් දෂ්ඨ කරනු ලැබූ අවස්ථාවකදී හැර අධ්‍යාත්මික ප්‍රතිකාරයෙහි (රුක්‍යා) පිළිසරණ නොසෙවිය යුතුය." යන කියමන අනුව එසේ කළ බව

පැවසුවෙමි. එවිට උන්වහන්සේ "මෙම දැනුම ඔබට ලැබී තිබීම වටිනේය." යි පිළිතුරු දුන්හ. අල්ලාහ්ගේ දූතයාණන් මෙසේ වදාල බව ඉබ්න් අබ්බාස් වාර්තා කරයි: සියළුම රටවල ජනතාව මා ඉදිරියේ ප්‍රදර්ශනය කරනු ලැබීය. අනාගත වක්තෘන් වහන්සේලා එක් එක් අය බැගින් පැමිණෙනු දුටුවෙමු. අනුගාමිකයින් විශාල සංඛ්‍යාවක් පිරිවරාගෙන එක් අයෙක්ද, දෙතුන් දෙනා පිරිවරාගෙන එක් අයෙකුද, කිසිදු අනුගාමිකයෙකු නොමැතිව තවත් අයෙකුද පැමිණෙනු මම දුටුවෙමි. අනතුරුවට අති විශාල ජන සමූහයක් දැක ඔවුන් මගේ අනුගාමිකයන් විය යුතු යයි මම සිතුවෙමි. එහෙත් ඔවුන් මූසාගේ අනුගාමිකයින් යයි මට දන්වනු ලැබීය. ඊටත් පසුව තවත් සුවිශාල පිරිසක් දෘෂ්‍යමාන විය. එම ජන සමූහය මගේ අනුගාමිකයින් යයි දන්වනු ලැබීන. එහි හැත්තෑ දහසක් දෙනා සිටි අතර ඔවුන් ප්‍රශ්න කිරීමකින් තොරව කිසිදු දඬුවමක් නොලබා ස්වර්ගයකට පිවිසෙන අයවලුන්ය." මෙය පවසා නබි (සල්) වහන්සේ සිය කුටියට ගියහ. එවිට එම දිනයේදී නබි (සල්) වහන්සේ සමඟ සිටීමේ භාග්‍යය කවරෙකුට හිමිවනු ඇද්දැයි රැස්ව සිටි ජනයා සාකච්ඡා කරන්ට වූහ. නබි (සල්) වහන්සේගේ ශ්‍රාවකයින්ට එම භාග්‍යය හිමිවනු ඇතැයි ඇතැමෙක් පැවසූ අතර, මුස්ලිම්වරුන් වශයෙන් ජන්ම ලාභය ලැබ එම හේතුව නිසාම අල්ලාහ් කිසිවක් හෝ කිසිවෙක් සම නොකළ අයට එම භාග්‍යය හිමිවනු ඇතැයි තවත් සමහරෙක් කීහ. උන්වහන්සේ පෙරළා පැමිණෙන විටද ජනයා ඒ ගැන කතා කරමින් සිටියහ. එම භාග්‍යය හිමිවන්නේ කාටදැයි ඔවුන් උන්වහන්සේගෙන් විමසූහ. එවිට උන්වහන්සේ "ඔවුන් නම් කායික ආබාධයන් සඳහා අධ්‍යාත්මික ප්‍රතිකර්මවල පිළිසරණ නොසොයන, පැසවීම හෝ ලේ ගැලීම නතර කිරීම

සඳහා සජීවී පටකයන් නොපුළුස්සන, නිමිති ගැන විශ්වාසය නොතබා ස්වාමීන්ද්‍රයාණන් කෙරෙහි පමණක් පූර්ණ විශ්වාසය තබන අයවලුන් යයි පිළිතුරු දී වදාළහ. එවිට උකාෂා ඉබ්න් මිහ්සාන් නැගී සිට "අල්ලාහ්ගේ දූතයාණෙනි! මාද එම භාග්‍යවතුන්ගෙන් කෙනෙකුවීමට අල්ලාහ් ගෙන් ආයාචනා කරනු මැනව" යයි ඉල්ලා සිටියේය. එවිට නබි (සල්) වහන්සේ "ඇත්ත වශයෙන්ම, ඔබ කණ්ඩායමට අයත්ය" යි පිළිතුරු දුන්හ. තවත් අයෙකුද එම ඉල්ලීම කළ අවස්ථාවෙහි උන්වහන්සේ උකාෂා විසින් එම කාර්යයෙහිලා ඔහු අභිබවනය කොට ඇතැයි දැන්වූහ.

ඉස්මතුවන කරුණු

1. ජනතාව අතරේ පවත්නා තව්හිද්හි අඩුවැඩි බව.

2. තවහිද්හි පිහිටි සිටීම යන්නෙහි අර්ථය.

3. ‘‘සමානයෙකු තබන්නෙකු නොවේ’’ යයි අල්ලාහ් විසින් ඉබ්‍රාහීම් ගැන ගුණ කථනයක් කිරීම.

4. සමානයෙකු නොතැබීම ගැන අල්ලාහ් විසින් මුනිවරයින්ට ප්‍රශංසා කිරීම.

5. පැසවීම සහ ලේ ගැලීම නතර කිරීම සඳහා සජීවී පටකයන් පිලිස්සීම සහ රැඛ්‍යා පිටුදැකීම තව්හිද්හි අංගයක් බව.

6. මෙහි අංග ලක්ෂණයන් සියල්ලක්ම තවක්කල් හෙවත් අල්ලාහ්ගේ උපකාරය පිළිබඳව විශ්වාසය තැබීමෙහි අන්තර්ගතවන බව.

7. යහ ක්‍රියාවලින් තොරව එවන් තවක්කල් පිහිටිය නොහැකි බවට ඒත්තු ගැන්වී තිබූ ශ්‍රාවකයින්ගේ ප්‍රඥාව.

8. යහකම් කිරීම සඳහා ශ්‍රාවකයින් දැක්වූ දැඩි උනන්දුව.

9. මෙම උම්මාවෙහි සංඛ්‍යාත්මක සහ ගුණාත්මක විශිෂ්ඨත්වය.

10. මූසාගේ ශ්‍රාවකයින්ගේ යහගුණ

11. නබි (සල්) වහන්සේ ඉදිරියෙහි ලෝ ජනතාව ප්‍රදර්ශනය කිරීම.

12. සැම ජන කොටසක්ම වෙන වෙනම සිය අනාගත වක්තෘන් වහන්සේලා සමග විනිශ්චය සඳහා පැමිණීම.

13. අනාගත වක්තෘන් වහන්සේලා වෙත සතුටුදායක ප්‍රතිචාරයක් දැක්වූ අයගේ ඌනතාවය.

14. කිසි අනුගාමිකයෙකු දිනා නොගත් අනාගත වක්තෘන් වහන්සේ විනිශ්චය සඳහා තනිව පැමිණීම.

15. මෙකී කරුණුවල ගුණාත්මක භරය වන්නේ මිනිසා සංඛ්‍යාව දෙස බලා නොමහ නොයායුතු බවත් මද භාවය ගැන සිතා බලාපොරොත්තු අත්හැරිය නොයුතු බවත්ය.

16. වර්ෂ්‍යාව සහ විසකුරු සතුන් දෂ්ට කළ අවස්ථාවන්හි පමණක් අධ්‍යාත්මික ප්‍රතිකර්මයන් ගේ පිළිසරණ සෙවීමට ඇති අවකාශය.

17. ”මෙම දැනුම ඔබට ලැබී තිබීම වටින්නේය” යි පවසමින් නබි (සල්) වහන්සේ ශ්‍රාවකයාගේ දැනුම පිළිබඳව ප්‍රශංසා මුඛයෙන් කථාකිරීම. හදිසයන් දෙක එකට එකක් පරස්පර විරෝධී නොවීම.

18. බොරු වර්ණනාවක් කිරීම සඳහා ඇති අකමැත්ත.

19. ”ඔබ එම කණ්ඩායමට අයත්ය” යි තීන්දු කිරීම තුළින් දෘශ්‍යමාන වන නබි (සල්) වහන්සේගේ අනාගත වක්තෘත්වය.

20. උකාෂාගේ සුචරිතය.

21. උදාහරණයන් උපයෝගී කර ගැනීම.

22. නබි (සල්) වහන්සේගේ නොකැලැල් චරිතය.

## පා සටහන්

[1] අල්කුර්ආන් 16:120

[2] අල්කුර්ආන් 23:59

## 4 වන පරිච්ඡේදය

## ෂිර්ක් පිළිබඳ බිය

අල්ලාහ්තආලා (ඔහුට සියළු කීර්ති ප්‍රශංසා හිමිවේවා) මෙසේ වදාළහ: "ඇත්තෙන්ම, අල්ලාහ් ඔහුට සමාන කරනු ලැබීම ක්ෂමා නොකරන්නේය."[1]

අල් කලීල් අලෙයිහි අල් සලාම් මෙසේ ආයාචනා කළේය: "මගේ ස්වාමීන්ද්‍රයාණෙනි! මාද මගේ මතු පැවැතෙන්නන්ද පිලිම ඇදහීමෙන් ආරක්ෂා කරනු මැනව"[2]

අල්ලාහ්ගේ දූතයාණන් මෙසේ වදාල බව හදීස්හි සඳහන්වේ. "ඔබලා වෙනුවෙන් මා බෙහෙවින් බියට පත්වන්නේ සුළු ෂිර්කයක් ගැනයි." එය කුමක්දැයි විමසූ විට උන්වහන්සේ "කුහක කම" හෙවත් "වංක භාවය" යනුවෙන් පිළිතුරු දුන්හ.

ඉබ්න් මසූද් රලියල්ලාහු අන්හු මෙසේ වාර්තා කළ බව සහිහුල් බුහාරිහි සඳහන්වේ. මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාළහ. "යමෙක් අල්ලාහ්ට සමානයෙක් තබමින් මියගියහොත් ඔහු නිරයට යන්නේය." සහිහුල් මුස්ලිම්හි මෙසේ සඳහන්වේ. අල්ලාහ්ගේ දූතයාණන් මෙසේ වාදල බව ජාබිර් (රලි) වාර්තා කරයි. අල්ලාහ්ට සමානයෙක් නොතැබූ කෙනෙක් විනිශ්චය දිනයේදී අල්ලාහ් අබියසට පමුණුවනු ලැබූ විට ඔහු

ස්වර්ගයට යවනු ලබයි. එහෙත් එයට හාත්පසින්ම විරුද්ධවූ දෙය කළ අය නිරයට යවනු ලබන්නේය."

<u>ඉස්මතුවන කරුණු:</u>

1. ෂිර්ක් පිළිබඳ බිය.

2. කුහකකමෙහි නැත්නම් වංක භාවයෙහි ෂිර්ක් අඩංගුවී ඇති බව.

3. වංක භාවය පහළ මට්ටමක ෂිර්කයක් බව.

4. කුහකකම වනාහි අවංක පුද්ගලයෙකුට මුහුණ දීමට සිදුවිය හැකි භයානකම අවදානමක් බව.

5. ස්වර්ගය සහ නිරය අතරේ ඇති ආසන්නතාවය.

6. එකම හදිසයෙහි ස්වර්ගයේ සහ අපායේ ආසන්නතාවය දැක්වීම.

7. අල්ලාහ්ට සමානයෙක් නොතබා විනිශ්චය දිනයේදී අල්ලාහ් අබියසට පමුණුවනු ලබන තැනැත්තා ස්වරගයට පිවිසීම සහ අල්ලාහ්ට සමානයන් තැබූ අයෙකු කෙතරම් දැහැමි පුද්ගලයෙකුවී සිටියද නිරයට යවනු ලැබීම.

8. තමා සහ තමන්ගේ මතු පැවැතෙන්නන් ද පිලිම ඇදහීමෙන් ආරක්ෂා කරන ලෙස අල් කලීල් විසින් කරනු ලැබූ වැදගත් යැදීම.

9. 'මගේ ස්වාමීන්ද්‍රයාණෙනි! ඇත්තෙන්ම ඒ පිළිරූ මනුෂ්‍යන්ගෙන් බොහෝ දෙනෙකු නොමඟ යැවූයේය.'[3] යන පාඨයෙහි සඳහන් අයුරු ජනතාවගෙන් බොහෝ දෙනෙකුගේ ඉරණම.

10. අල් බුහාරි විසින් වාර්තාකර ඇති අන්දමට "අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නැත" යනුවෙන් සාක්ෂි දැරීම අර්ථ නිරූපනය කිරීම.

11. ෂිර්ක් වලින් මිදුනු පුද්ගලයාගේ සුචරිතවත්කම.

පා සටහන්

(1) අල්කුර් ආන් 4:48, 116
(2) 14:35
(3) 14:36

## 5 වන පරිච්ඡේදය

### අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නැත යනුවෙන් සාක්ෂි දැරීමට කරනු ලබන කැඳවීම.

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී. "මුහම්මද්! මම ඔබලා අල්ලාහ් වෙත කැඳවමි. එය මගේ මාර්ගයයි."[1] යනුවෙන් පවසනු.

ඉබ්න් අබ්බාස් (රළි) තුමා මෙසේ වාර්තා කරයි: මුහම්මද් නබි (සල්) වහන්සේ විසින් මුආද්, යෙමනයට පිටත්කර යැවූ අවස්ථාවෙහි ඔහුට මෙසේ අණ කළහ. "පුස්තකයේ ජනතාව වෙත ගිය කල්හි ඔබේ ප්‍රථම කර්තව්‍යය විය යුත්තේ අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නැත" යනුවෙන් සාක්ෂි දරණ ලෙස ඔවුන් කැඳවීමයි. තවත් වාර්තාවක් අනුව "අල්ලාහ්ගේ ඒකියත්වය පිළිගන්නා ලෙස කැඳවීමයි. ඔවුන් එයට කීකරු වූවහොත් අල්ලාහ් විසින් ඔවුනට දිනකට පස් වතාවක් නැමදුම ඉටුකරන ලෙස නියමකර ඇති බව දැක්වීම වේ. එයටද ඔවුන් කීකරු වූවහොත් ධනවතුන්ගෙන් දුගී බද්දක් අයකර එය දුගී ජනතාව අතරේ බෙදාදීමට අල්ලාහ් විධානය කර තිබෙන බව දැක්විය යුතුය. ඔවුන් එයටද කීකරු වූවහොත් ඔවුන්ගේ සෙසු දේපොළවලට අත නොතබනු. එමෙන්ම අසාධාරණයට භාජනය වූවන්ගෙන් පැමිණිලි ඇතොත් ඒ සම්බන්ධයෙන් යුක්තිය ඉටු කරනු. අල්ලාහ් වෙත සමීප වීමේදී ඔවුන්ට කිසිදු බාධාවක් තිබිය නොයුතුය." (අල්බුහාරි සහ මුස්ලිම් යන සහී දෙකෙහිම වාර්තාවී ඇත.)

බුහාරි සහ මුස්ලිම් යන දෙදෙනාම සහි ඉබ්න් සාද් (රලි) තුමා මෙසේ පවසා ඇති බව වාර්තා කරති: ”කයිබර් යුද්ධයේදී මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාළහ. ”අල්ලාහ්ට සහ ඔහුගේ අනාගත වක්තෘවරයාට ආදරය කරන සහ ඔවුන්ගේ පාත්‍රවී සිටින අයෙකුට මම හෙට දින ධජය භාරදෙමි. අල්ලාහ් විසින් එම තැනැත්තාගේ නායකත්වය යටතේ සිටින යුද හමුදාවට ජයග්‍රහණය ලබාදෙනු ඇත.” ධජය කාට දෙනු ඇද්දැයි සිතමින් අනුගාමිකයින් රාත්‍රිය ගත කළහ. පසුදින සියළු දෙනාම අල්ලහාගේ දූතයාණන් වෙතට රොක්වී තමන්ට ධජය භාරදෙන ලෙස එක් එක් අය ඉල්ලා සිටියේය. අලි ඉබ්න් අබූ තාලිබ් සිටින්නේදැයි උන්වහන්සේ විමසූහ. එහෙත් ඇස් රෝගයක් හේතුකොටගෙන ඔහු එහි පැමිණ නොසිටියේය. පසුව නබි (සල්) වහන්සේ හමුවට අලි ගෙන එනු ලැබූ විට උන්වහන්සේ ඔහුගේ ඇස අතගා ඔහු වෙනුවෙන් යාඥා කළේය. ඔහුගේ ඇස් රෝගය සුව විය. ඔහු අතට ධජය දෙනු ලැබ උන්වහන්සේ මෙසේ විධාන කළහ: ”පහසුවෙන් සහ විනීත අන්දමින් ජනතාව වෙත යනු. ඔවුන් හමුවට පැමිණිවිට ඉස්ලාම් දහම වැළඳ ගන්නා ලෙස ඔවුන්ට ආරාධනා කරනු. ඔවුන් විසින් අල්ලාහ් කෙරෙහි ඉටුකළ යුතු යුතුකම් කවරේදැයි පහදා දෙනු. සියළු කිර්ති ප්‍රශංසා හිමි ඔහුගේ මඟපෙන්වීම යටතේ එක් අයෙකු ඉස්ලාම දහස වැළඳ ගතහොත් එය ලෝකයේ සිටින්නාවූ හොඳම පාංශු සම්පතට වඩා වටින්නේය.

**ඉස්මතුවන කරුණු:**

1. ජනතාව ඉස්ලාමය වෙත කැඳවීම අල්ලාහ්ගේ දූතයාණන් මාර්ගයෙහි ගමන් කිරීම වේ.

2. අවංකභාවය ගැන අවධාරණය කිරීම. ඇතැම් අය අල්ලාහ් වෙත කැඳවීම වෙනුවට තමන් වෙත පමණක් කැඳවති.

3. යුක්තිගරුකවීම අල්ලාහ් විසින් නියම කරනු ලැබ ඇති යුතුකමකි.

4. තව්හිද්හි අගේ කළයුතු ලක්ෂණය නම් අල්ලාහ්තආලා අවමානයට ලක් කිරීමෙන් වැලකීමයි.

5. ෂිර්කිහි අහිතකර අංගය නම් අල්ලාහ්ට අවමන් කිරීමයි.

6. ඉතාමත් වැදගත් කාර්යය වන්නේ සමානකම් තබන්නවුන්ගෙන් මුස්ලිම්වරුන් ඈත් කිරීම සහ ඔවුන් සමහ සබඳතාවයක් අත්හැරීමයි.

7. තව්හිදය, මිනිසාගේ ප්‍රථම හා පරම යුතුකමකි.

8. තව්හිදය, සලාතයද ඇතුළු සියළු දෙයට වඩා ඉදිරියෙන් සිටි.

9. අල්ලාහ්ගේ ඒකීයත්වය පිළිගැනීම අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නොමැති බවට සාක්ෂි දැරීමයි.

10. ඇතැම් අය තව්හිද් යනු කුමක්දැයි නොදැන සහ ඒමත පිහිටා නොසිට වුවද පුස්ථකයේ ජනතාව(2) වශයෙන් සිටිය හැක.

11. පියවරෙන් පියවර ඉගැන්වීම අවධාරණය කිරීම.

12. වඩාත් වැදගත් කරුණට අඩු වැදගත්කමකින් යුත් කරුණට වඩා ප්‍රමුඛත්වය දිය යුතුය.

13. Zසකාත් (දුගී බද්ද) බෙදාහැරිය යුතු අන්දම.

14. උගතා විසින් ඉගෙන ගනිමින් සිටින අයගේ වැරදි අවබෝධයක් මඟහැරවිය යුතුය.

15. මිනිසුන්ගේ නිත්‍යානුකූල දේපොලවලට අත නොතැබිය යුතුය.

16. අසාධාරණයට භාජනය වූවන්ගේ පැමිණිළි සම්බන්ධයෙන් යුක්තිය ඉටුකළ යුතුය.

17. එවන් පැමිණිලි යටපත් නොකළ යුතුය.

18. අනාගත වක්තෘන් වහන්සේලා අතරින් ප්‍රමුඛයාවූ මුහම්මද් නබි (සල්) වහන්සේට සහ උන්වහන්සේගේ ශ්‍රාවකයින්ට විඳිමට සිදුවූ නානාවිධ දුක්, කරදර කම්කටොලු ආදිය එතුමන්ලාගේ තව්හිදයේ අවංක භාවය පිළිබඳවූ සාක්ෂියකි.

19. ”මම ධජය භාර දෙමි” යනුවෙන් අල්ලාහ්ගේ දූතයාණන් විසින් කරනු ලැබූ ප්‍රකාශය උන් වහන්සේගේ අනාගත වක්තෘත්වය සනාථ කරන සාක්ෂියකි.

20. අලිගේ ඇස් රෝගය සුව කිරීමද එවන් සාක්ෂියකි.

21. අලි (රලි) තුමාගේ සුචරිතය.

22. ධජය බාර දෙනු ලබන්නේ කවරෙකුටදැයි රාත්‍රිය පුරාම සිත සිතා සිටීමෙන් සහ පසුදින ලබන ජයග්‍රහණය පිළිබඳව උදම් නොවීම තුළින් දෘෂ්‍යමාන වන ශ්‍රාවකයින්ගේ යහගුණය.

23. කද්ර් පිළිබඳ විශ්වාසය එය නොසොයන අයට පිරිනමනු ලබන අතර, සොයන අයට පිරි නොනමනු ලැබේ.

24. ”පහසුවෙන් සහ විනීත අන්දමින් ජනතාව වෙත යනු” යයි අලිට විධානය කිරීමෙන් නබි (සල්) වහන්සේ දැක්වූ උදාර අභිමානත්වය.

25. සටන් වැදීමට පෙරාතුව ඉස්ලාමය වෙත කරනු ලබන කැඳවීම.

26. ඉස්ලාමය වෙත කැඳවනු ලැබ එය ප්‍රතික්ෂේප කරනු ලැබූ අය සමඟ සටන් වැදීමේ නීත්‍යානුකූලත්වය.

27. "ඔවුන්ගේ යුතුකම් ඔවුනට කියා දෙනු" යන විධානයෙන් බුද්ධිමතුන් ඉදිරියට කැඳවීම.

28. මිනිසා විසින් අල්ලාහ් කෙරෙහි ඉටුකළ යුතු යුතුකම්.

29. මිනිසෙකු ඉස්ලාමය වෙත කැඳවීමේදී කැඳවුම්කරු විසින් එය කළයුතු ආකාරය.

30. විද්වතුන්ගේ මතයට අවනතවීම.

පා සටහන්

[1] අල්කුර්ආන් 12:108

[2] අල්ලාහ් විසින් පහළ කරනු ලැබූ පුස්තකයන්ට අයත් අය - අල්කුර්ආනය, යුදෙව්වන් සහ කිතුබැතියන් මෙසේ හඳුන්වයි.

# 6 වන පරිච්ඡේදය

## තව්හිදය සහ අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නැත යනුවෙන් සාක්ෂි දැරීම පිළිබඳ පැහැදිලි කිරීමක්

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: ඔවුන් අඩගසන අය ඔවුන්ගේ ස්වාමින්ද්‍රයාණන් වෙතට- ඔවුන්ගෙන් කවරෙක් ඉතා සමීපවත්දැයි - විධි සොයති. ඉබ්‍රාහිම් ඔහුගේ පියාටද ජනතාවටද "ඇත්තෙන්ම තොප නැමදුම් කරන දැය මම ප්‍රතික්ෂේප කරමි. මා නමදින්නේ මා මැවූ ඔහුට පමණක්ය..... අල්ලාහ් හැර, ඔවුන්ගේ මාර්ගඥයන්ද සත්‍යස්තයන්ද ඔවුන් (ක්‍රිස්තියානින්) ස්වාමිවරුන් කොට ගත්හ.... තවද, අල්ලාහ් හැර (ඔහුට) සමානයන් (කරගනු ලැබූ) දැය දෙවියෙකු වශයෙන් ගත් අයද මිනිසුන් අතර ඇත. ඔවුහු ඒ සමානයන් (කරගනු ලැබූ දැය අල්ලාහ්ට ප්‍රිය කරන්නාක් මෙන් ප්‍රිය කරන්නෝය. [1]

මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාල බව සහිහි වාර්තාවේ. යමෙක් අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නැත යනුවෙන් සාක්ෂි දරමින් අන්කිසි දෙයකට නැමදීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හේ අල්ලාහ් අබියසදි සිය රුධිරය, දේපොල සහ ඉරණම රැකගනී.

පසුව එන පරිච්ඡේදවල තව්හිදය පිළිබඳ පැහැදිලි කරනු

ලබයි. විශාල සහ වැදගත් ප්‍රශ්ණයන් ඒවායෙහි පැහැදිලි වශයෙන් විග්‍රහ කරනු ලැබ පිළිතුරැද සපයා ඇත. දැහැමි පුද්ගලයින් තව්හිද්හි සිට ඉවතට ගැනීම සඳහා ක්‍රියා කරන සම කරන්නවුන් ඉහළම ෂිර්කයට වැරදිකරුවන් වන බව සූරා "බනී ඉස්රාඊල්" දැක්වේ.[2]

එකම දෙවියන්වූ අල්ලාහ් හැර අන් අයෙකුට නැමදුම් නොකරන ලෙස අණ කරනු ලැබ සිටියදී පුස්ථකයේ ජනතාවන් අල්ලාහ් හැර, එවුන්ගේ මාර්ගඥයන්ද සතෘස්තයන්ද ස්ව ස්වාමිවරුන් කොටගත් බව සූර 'තව්බා' හි දැක්වේ.[3] අකුසල කිරීමේදී වෙනත් මිනිස්ප්‍රාණීන්ට කීකරුවීම ඔවුන්ගේ වරදකාරීත්වය බව එම පාඨයෙන් පැහැදිලි පෙනියයි. "ඇත්තෙන්ම තොප නැමදුම් කරන දැය මම ප්‍රතික්ෂේප කරමි. මා නමදින්නේ මා මැවූ ඔහුට පමණක්ය."[4] යනුවෙන් ඉබ්රාහිම් (අලෛ) විසින් විශ්වාස නොකරන්නවුන් වෙත කරන ලද ප්‍රකාශයද මෙයට සමානය. ඉබ්රාහිම් (අලෛ) විසින් කරනු ලැබූ ප්‍රතික්ෂේප කිරීමද එමෙන්ම තහවුරු කිරීමද පැහැදිලිවම "අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නැති" බවට සාක්ෂි දැරීමකි. උන්වහන්සේ (ඉබ්රාහිම් අලෛ) මෙය තමන්ගෙන් පැවැතෙන පරම්පරාව වෙත ඔවුන්ට පසුතැවිලි වී ක්ෂමාව අයැදීමටද නිවැරදි මාර්ගෝපදේශකත්වය සෙවීමටද - නියෝගයක් කළේය.[5]

තව්හිද් පිළිබඳ සාක්ෂි දැරීම සම්බන්ධයෙන් අල්ලාහ්තආලා විශ්වාස නොකරන්නවුන් ගැන සූරා "අල්-බකරා" හි[6] මෙසේ සඳහන් කරයි: "අල්ලාහ් කෙරෙහි ඔවුන් කෙතරම් ආදරයක්

දක්වන්නහුද එතරම්ම ආදරයක් සමකර සිටින්නන් කෙරෙහිද දක්වති. ඔවුහු කිසිකලෙකත් නිරයෙන් නික්මෙන්නෝ නොවෙති"[6] අල්ලාහ් කෙරෙහි ඉමහත් ආදරයක් ඔවුන් දැක්වුවද, මුස්ලිම්වරුන් වශයෙන් ඔවුහු සලකනු නොලබන්නේය. අනෙක් අතින්, අල්ලාහ්ට වඩා සමානයන් තබා ඇති අය කෙරෙහි වැඩි ඇල්මක් නොදක්වා සාමානයන් වශයෙන් සලකනු ලබන අය කෙරෙහි පමණක් ඇල්මක් දක්වන්නවුන්ද, කිසිසේත් මුස්ලිම්වරුන් නොවෙති. එහෙයින් ඔවුන සදා උදහසට ලක්වූවෝ වෙති.

අවසාන වශයෙන්, "අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නැත යනුවෙන් යමෙක් සාක්ෂි දරමින් අන්කිසි දෙයකට නැමදීම ප්‍රතික්ෂේප කරන්නේ නම් හේ අල්ලාහ් අබියසදී සිය රුධිරය, දේපොල සහ ඉරණම රැකගනී" යනුවෙන් අල්ලාහ්ගේ දූතයාණන් විසින් කරනු ලැබූ ප්‍රකාශයෙන් "අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නැත" යන සාක්ෂි දැරීම මනා ලෙසින් පැහැදිලිවෙයි.

රුධිරය සහ දේපොල රැකගැනීම සම්බන්ධයෙන් අල්ලාහ් විසින් මෙම ප්‍රකාශය කරනු ලැබ ඇත්තේ හුදකලා පාඨයක් වශයෙන් නොවේ. සමානයක් නොතබා අල්ලාහ් පමණක් නැමදීමෙන්ම මෙම රැකවරණය නොලැබේ. එම සාක්ෂි දැරීමට අල්ලාහ් හැර නැමදුම සඳහා අන්කිසිවෙක් හෝ කිසිවක් නොමැති බවද විශ්වාස කළ යුතුවේ. මෙම බැහැර කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව යම් සැකයක් මතුවුවහොත් හෝ එවන් ප්‍රතික්ෂේප කිරීමක් නොකළ යුතු යයි යමෙක් සිතන්නේ

නම්, ඔහුගේ රුධිරය හෝ දේපොල උකහගැනීම පිළිබඳ පොරොන්දුව බිඳ වැටේ. එබැවින් මෙය අතිශය වැදගත් කමකින් යුක්තවූත්, බැරෑරුම්වූත් ප්‍රශ්නයකි. එය මෙම පාඨයන්හි පැහැදැලිව දක්වා ඇති අතර එයට විසඳුමද දක්වා ඇත.

## පා සටහන්

(1) අල්කුර්ආනය 17:57; 43:23-27;
9:31; 2:165

(2) අල්කුර්ආනය 17:57

(3) අල්කුර්ආනය 9:31

(4) අල්කුර්ආනය 43:26-27

(5) අල්කුර්ආනය 43:28

(6) අල්කුර්ආනය 2:165

## 7 වන පරිච්ඡේදය

### රෝග වැළඳීම වැළැක්වීම සඳහා හෝ රෝග නිවාරණය සඳහා නූල් වස්තු ඇඳ ගැනීම ෂිර්කයකි.

අල්ලාහ්තආලා මෙසේ වදාළහ: "අල්ලාහ් මට විපතක් සිදු කිරීමට සිතූ කල්හි, ඔහුගේ විපතින් මා මුදවන්නට, අල්ලාහ් හැර තොප නමදින දෙයට හැකියාවක් ඇද්දැයි" ඔවුන්ගෙන් විමසනු." [1]

ඉම්රාන් ඉබ්න් හුසෙයින් මෙසේ වාර්තා කරයි: දිනක් නබි (සල්) වහන්සේ පිත්තල දම්වැලක් පැළඳ සිටින මිනිසෙකු දැක එය පැළඳ සිටින්නේ කුමකටදැයි විමසූසේක. මහළු වියේ ශාරීරික දුර්වල තාවය මඟහරවා ගැනීම සඳහා යයි ඔහු පිලිතුරු දුන්නේය. එවිට නබි (සල්) වහන්සේ එය ගලවා දමන මෙන් ඔහුට නියෝග කරමින් "එයින් ඔබේ දුර්වලතාවය වැඩි වන්නේය. ඔබ එය පැළඳ සිටියදී මරණයට පත් වුවහොත් ඔබට කිසිදු සාර්ථක ප්‍රතිඵලයක් නොලැබේ." යයි වදාළහ. උක්බා ඉබ්න් අමීර් විසින් වාර්තා කරන හදීසයක මෙසේ සඳහන්වේ: යන්තරයක් පැළඳ සිටින්නෙකුගේ ප්‍රාර්ථනා අල්ලාහ් විසින් කිසිකලෙක ඉටු නොකරයි." එම හදීසය අනුව මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාරා ඇත: "යමෙක් යන්තරයක් පැළඳ සිටින්නේ නම් ඔහු විසින් ෂිර්කයක් සිදුකර තිබේ." හුදෛයිෆා විසින් වාර්තා කරන හදීසයක් අනුව දිනක් මුහම්මද් නබි (සල්)

වහන්සේ එක් මිනිසෙක් උණ රෝගය වළක්වා ගැනීම සඳහා යයි යම් වස්තුවක් ගෙන යනු දැක එය ඉරා දමමින් කුර්ආනයේ අඩංගු මතු දැක්වෙන පාඨය උපුටා දැක්වූ සේක: "ඔවුන්ගෙන් වැඩි දෙනෙක් අල්ලාහ් කෙරෙහි විශ්වාසය තබන අතරම ෂිර්කයන්ද සිදු කරති." [2]

## ඉස්මතුවන කරුණු

1. යන්තර සහ ආරක්ෂාව සඳහා යයි මතුරනු ලැබූ දම්වැල්, වස්තු ආදිය පැළඳීම.

2. යන්තරයක් පැළඳ සිටියදී ශ්‍රාවකයා මරණයට පත්වුවහොත් ඔහුට කිසිදු සාර්ථක ප්‍රතිඵලයක් නොලැබේ යයි නබි (සල්) වහන්සේ පැවසීම. සුළු ෂිර්කය පවා "කබීරා" [3] වලට වඩා බරපතල බවට ශ්‍රාවකයින්ගේ සාක්ෂි ඇත.

3. මෙහිලා නොදැනුවත්කම නිදහසට කරුණක් නොවන බව.

4. මෙලොවෙහි යන්තරවලින් කිසිදු ප්‍රයෝජනයක් නොමැති බව. ඇත්ත වශයෙන්ම ඒවා හානිකර බව "එයින් ඔබේ දුර්වලතාවය වැඩි වන්නේය." යන නබි වදනින් මෙය ඔප්පුවේ.

5. මේ සම්බන්ධයෙන් වැරදිකරුවෙකු වන අය අවධාරණයෙන්ම ප්‍රතික්ෂේප කරනු ලැබ හෙළා දැක ඇත.

6. යන්තරයක් පැළඳ සිටින්නෙකුට සහයට ඇත්තේ එය පමණකි. එහෙත් එයට කිසිදු බලයක් නැත.

7. යමෙක් යන්තරයක් පළඳින්නේද ඔහු විසින් ෂිර්කයක් සිදු කරයි.

8. යන්තරයක් උපයෝගී කරගෙන උණරෝගය සුවකර ගැනීමට තැත් කිරීම.

9. සුළු ෂිර්කය හෙළාදැකීම සඳහා ශ්‍රාවකයින් විසින් බරපතල ෂිර්කය[4] පිළිබඳ පාඨයන් උපයෝගී කරගත් බව හුදෙයිෆාගේ හදීසයෙන් පෙනේ.

10. ඇස්වහ, කටවහ වළක්වා ගැනීමේ අටියෙන් යන්තර පැළඳීම ෂිර්කයකි.

11. නබි (සල්) වහන්සේ යන්තර පැළඳ සිටින්නන්ට විරුද්ධව අල්ලාහ්ට යාඥා කළහ.

## පා සටහන්

[1] අල්කුර්ආන් 39:38

[2] අල්කුර්ආන් 12:106

[3] සුළු ෂිර්කය වන්නේ චේතනාවක් නොමැතිව සමානයන් තැබීම, වෙනත් දෙවිවරුන් පිළිගැනීම සහ අල්ලාහ් හැර අන් අයෙකුට දිව්‍යමය බලයක් ඇතැයි ඉඟියෙන් දැක්වීමය. කර්තෘවරයා මෙහි අනතුරු හඟවා සිටින්නේ එවන් සුළු ෂිර්කයන් තව්හීද් මත පිහිටි සිටින අයෙකු විසින් සිදු කළහැකි "කබීරා" එනම් මිනීමැරුම්, අනාචාරය, සොරකම් වැනි බරපතල පාපයන්ට වඩා දරුණු බවයි.

[4] බරපතල ෂිර්කය නම් සිතා මතා සමානයන් තැබීමයි. එනම් අල්ලාහ් හැර අන් දෙවිවරුන් පිළිගැනීමයි.

## 8 වන පරිච්ඡේදය

## යන්තර, මන්තර, ගුරුකම්, හා වශීකරණය

මුහම්මද් නබි (සල්) වහන්සේ සමඟ බොහෝ ගමන් බිමන් ගිය අබූ බෂීර් අල් අන්සාරි (රලි) තුමා මෙසේ වාර්තා කළ බව සහී හි දැක්වේ. කාන්තාර පුරා ගොස් යම් ඔටුවෙකුට යන්තර පළඳවා තිබෙනු දුටුවහොත් එම යන්තර විනාශ කර දමන ලෙස විධාන කොට උන්වහන්සේ විසින් සේවකයෙකු පිටත් කර යවන ලදි. මසූද් (රලි) තුමාගේ හදීසයක් උපුටා දක්වමින් අහමඩ් ඉබ්න් හන්බල් සහ අබූදාවුද් මෙසේ වාර්තා කරති: ”යන්තර, මන්තර, ගුරුකම්, වශීකරණය ආදි සියල්ලක්ම ෂිර්ක් වෙති” යයි නබි (සල්) වහන්සේ වදාරනු මට ඇසී ඇත. අහමඩ් ඉබ්න් හන්බල් සහ අල් තිර්මිදි යන දෙදෙනා අබ්දුල්ලා ඉබ්න් උකයිම්ගේ හදීසයක් උපුටා දක්වමින් ”යමෙක් යන්තරයක් පළඳින්නේ නම් ඔහුට එහි රැකවරණය පමණක් ලැබේ. එහෙත් කිසිදු රැකවරණයක් සැලසීමේ ශක්තිය යන්තරයකට නැත.

ඇස් වහ, කටවහ ආදියෙන් ආරක්ෂාවීම සඳහා යයි ළමයින්ට යන්තර බඳිනු ලැබ ඇති බව අප දැක ඇත්තෙමු. එම යන්තරවල අඩංගුව තිබුණේ අනෙකක් නොව කුර්ආන් පාඨයන් පමණක් නම් අපේ ඇතැම් පැරැන්නන් ඒවා අනුමත කළ අතර, ඇතැමෙක් ඒවා ප්‍රතික්ෂේප කළහ. ඇතැම් අය ඒවා පැළඳීමට ඉඩ නොදුන් අතර ඒවා තහනම් කරනු ලැබ ඇතැයි නොසැලකූහ. ඇස්වහ, කටවහ සහ විසකුරු සර්පයන් දෂ්ට

කිරීම ආදිය සඳහා මිස අධ්‍යාත්මික ප්‍රතිකාර ලබාගැනීම ෂිර්කයන් වේ. රුවායිෆිගේ හදීසයක් උපුටා දක්වන අහමඩ් ඉබ්න් හන්බල් මෙසේ වාර්තා කරයි: මුහම්මද් නබි (සල්) වහන්සේ මා අමතා මෙසේ වදාළහ. "රුවයිෆි! ඔබට දිරඝායුෂ ලැබේවා. "රැවුල ගැට ගසා ඇති කෙනෙක්, යන්තරයක් පැළඳ සිටින කෙනෙක් සහ සතෙකුගේ මූත්‍රා වලින් ඇඟ සෝදා ගන්නා කෙනෙක් මට හෝ මගේ දහමට සම්බන්ධවූ කෙනෙක් නොවන බව ජනතාවට සැලකර සිටිනු."

මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාළ බව සයිද් ඉබ්න් ජුබෙයිර් වාර්තා කරයි. "යමෙක් පැළඳ සිටින යන්තරයක් විනාශකර දමන්නේ කවරේද ඔහු වහලෙකු මුදාහැරීම සම්බන්ධයෙන් ලැබිය යුතු කුසල් හිමිකර ගත් අයෙකු බවට පත්වේ." ඉබ්රාහිම් විසින් වාර්තා කරන හදීසයක් අනුව ශ්‍රාවකයින් විසින් සියයට සියයක් කුර්ආන් පාඨයන් අඩංගු මෙන් වසේ නොවූ යන්තර පැලදීම ප්‍රතික්ෂේප කළහ.

## ඉස්මතුවන කරුණු

1. යන්තර, මන්තර, ගුරුකම් පැහැදිලි කිරීම (අල් රුඛා සහ අල් තමායිම්)

2. වශීකරණය (අල් තිවාලා) පිළිබඳ පැහැදිලි කිරීම.

3. යන්තර, මන්තර, වශීකරණය සහ සියල්ලක්ම ෂිර්ක් ගණයට වැටෙන පාපයන් බව.

4. ඇස්වහ, කටවහ සහ විසකුරු සර්පයන් විසින් දෂ්ට කිරිම සම්බන්ධයෙන් කුර්ආන් පාඨයන් පමණක් උපයෝගීකර ගැනීම ශිර්කයක් නොවන බව.

5. යන්තරයක කුර්ආන් පාඨයන් පමණක් අඩංගුව තිබේනම් ඒවා පැළඳිමේ නිරවද්‍යතාවය පිළිබඳද විශේෂඥ මතය බේද සහිතය.

6. ඇස්වහ, කටවහ දුරු කිරීමේ අවියෙන් සතුන්ට යන්තර පැළඳවීම ශිර්කයක්ය.

7. එවන් වැරදි කරන අයවලුන්ට දැඩි දඬුවම් විදීමට සිදුවේ.

8. යන්තර විනාශ කර දමන තැනැත්තාට හිමිවන කුසල්.

9. ඉබ්‍රාහිම් විසින් සඳහන් කර ඇත්තේ අබ්දුල්ලා ඉබ්න් මසූද්ගේ ශ්‍රාවකයින් ගැනය. එබැවින් ඔහුගේ වාර්තාවෙන් ඉහත දැක්වෙන උපදෙස් කිසිවක් නිශේධ නොවේ.

## 9 වන පරිච්ඡේදය

### ගස් ගල් වලට නැමදීම

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: "අල් ලාත් සහ අල් උස්සා ගැන සලකා බලන්." [1]

අබූ වකීක් අල් ලයිතී විසින් සඳහන් කළ කථා පුවතක් අල් තිර්මිදි මෙසේ වාර්තා කරයි.

අපි අපේ පැරණි ආගම අත්හැර ඉස්ලාම් දහම වැළඳගත් අළුතදී හුනෙයින් වැසියනට විරුද්ධව සටන් වැදීම සඳහා මුහම්මද් නබි (සල්) වහන්සේ සමඟ ගියෙමු. තමන්ගේ අවි ආයුධ දාත් අන්වත් නමැති ගසක එල්වා තැබීම විශ්වාස නොකරන ජනතාවගේ සිරිතක් විය. අපද එවන් ගසක් පසුකර ගමන් කරන විට "ඔවුන්ට තිබෙන මාදිලියේ වෙනත් දාත් අන්වතක් ඔබ වහන්සේ අපටත් තෝරා දෙනවාදැ"යි අපි විමසුවෙමු. එයට පිළිතුරු වශයෙන් උන්වහන්සේ මෙසේ වදාළහ: "අල්ලාහු අක්බර්" (අල්ලාහ් අති උත්තමය) "ඔවුනට තිබෙන්නාවූ දෙවිවරුන් මෙන් අපටද දෙවියකු සලස්වා දෙනු මැනව" [2] යනුවෙන් බනු ඉස්රාඊල් වරුන් මූසාගෙන් කළ ඉල්ලීමට සමානව ඔබලා කථාකරන්නහුය. ඇත්ත වශයෙන්ම ඔබලා නුගත් ජන කොට්ඨාශයක්ය. ඔබලාද, ඔබලාට පෙර පැවැති අයගේ චාරිත්‍ර විධි ඒ ආකාරයෙන්ම අනුකරණය කළ යුතුද?"

## ඉස්මතුවන කරුණු

1. සුරා අන්-නජ්මුහි ඇති පාඨයක පැහැදිලි කිරීම [3]

2. ඔවුන්ගේ ඉල්ලීමේ ස්වරූපය. [4]

3. ඔවුන්ගේ ඉල්ලීමට ඉඩ නොලැබීම.

4. ඔවුන් එසේ කිරීම අල්ලාහ් ප්‍රියකරන්නේ යයි සිතූ බැවින් එම මාර්ගයෙන් අල්ලාහ් වෙත සමීප විය හැකියයි අදහස් කර ඔවුහු එම ඉල්ලීම කළ බව.

5. මෙහි බරපතල කම ඔවුන් දැන නොසිටියේ නම්, සෙසු අයට ඒ පිළිබඳව ඇති දැනුම ඊට වඩා අඩුවිය හැක.

6. ඔවුනට ක්ෂමාව ලැබෙන බවට ඇති පොරොන්දුව.

7. එසේ වුවද, නබි (සල්) වහන්සේ ඔවුනට එක එල්ලේම සමාව නොදී "අල්ලාහු අක්බර්....! ඔබලාද, ඔබලාට පෙර පැවැති අයගේ චාරිත්‍ර විධි ඒ ආකාරයෙන්ම අනුකරණය කළ යුතුද?" යනුවෙන් පිළිතුරු දුන්හ.

8. මෙම හදීසයෙන් ගෙන හැර දක්වන්නේ අල්ලාහ්ගේ දූතයාණන් විසින් ඔවුන්ගේ එම ඉල්ලීම "ඔවුනට තිබෙන්නාවූ දෙවිවරුන් මෙන් අපටද දෙවියෙකු සලසා දෙනු මැනව"

යනුවෙන් බනී ඉස්රාඊල් වරුන් මූසාගෙන් කළ ඉල්ලීමට එය සමාන කිරීමයි.

9. ඔවුන්ගේ අවධානයෙන් ඉවත්වූ "අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නැත" යන සාක්ෂි දැරීම මගින් මේ සියල්ලක්ම තරයේ ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත.

10. මුහම්මද් නබි (සල්) වහන්සේ නිරවද්‍ය මතයක් තහවුරු කර තිබීම.

11. එම ක්‍රියාව සිදුකර තිබියදීත් ඔවුන් මුස්ලිම් බැතිමතුන් වශයෙන් සිටීමෙන් ෂිර්කයේ මට්ටම් කිහිපයක් තිබෙන බව පෙන්නුම් කරයි.

12. "අපි අපේ පැරණි දහම අත්හැර ඉස්ලාම් දහම වැළඳ ගත් අළුතදී" යන කියමනෙන් පෙනී යන්නේ පැරණි මුස්ලිම්වරුන් මෙම කරුණු මැනවින් දැන සිටි බවය.

13. අන්කවර මතයක් ඉදිරිපත් කරනු ලැබුවද "තක්බීරය" විශ්මය හඟවන ප්‍රකාශයක් දවේ.

14. තව්හිදයෙන් පිටුපා යැමට ඇති අවශ්‍යතාවය ප්‍රතික්ෂේප කිරීම.

15. විශ්වාස නොකරන්නවුන් අනුකරණය කිරීම තහනම් කිරීම.

16. තව්හිදය උගන්වන අය ප්‍රකෝපමත් කිරීම.

17. මිනිස් සංහතියේ දියුණුවෙහි පොදු රටාව.

18. සිදුවූ දෙයක් අවංකව වාර්තා කරන මෙම හදීසය අනාගත වක්තෘත්වය පිළිබඳ ප්‍රබලවූ සාධකයකි.

19. අල්ලාහ් විසින් කුර්ආනය මගින් යුදෙව්වන් සහ කිතු බැතියන් වෙත කර තිබෙන දෝෂාරෝපනය අපවාද ගැලපෙන බව.

20. පුස්තකයේ ජනතාවට යාඥා විදි සාප් පනත් මගින් පනවා ඇත. එම නිසා කබ්රයේ (මිනීවලේ) ප්‍රශ්න විචාරය පිළිබඳ මතක් කිරීමක් කර ඇත. මෘත ශරීරයක් මිහිඟන් කළපසු අසනු ලබන "ඔබේ ස්වාමීන්ද්‍රයාණන් කවරෙක්ද?" යන ප්‍රශ්නය පැහැදිලිය. දෙවන ප්‍රශ්නය "ඔබේ අනාගත වක්තෘන් කවරෙක්ද?" යන්නයි. ඒවා රදා පවතින්නේ පෙරදී අල්ලාහ් විසින් පහල කරනු ලැබූ පනත් අනුවය. එහෙත් තුන්වන ප්‍රශ්නය "ඔබේ ආගම කුමක්ද?" යන්න යුදෙව්වන් විසින් මූසාගෙන් කළ ඇයදුමට සම්බන්ධවේ.

21. පුස්තකයේ ජනතාවගේ ක්‍රියා රටාව විශ්වාස නොකරන්නවුන්ගේ හෝ සමානයන් තබන්නවුන්ගේ වරියාවට සමානය.

22. විශ්වාස නොකරන්නෙකුට සිට ඔවුන්ගේ ගතිපැවතුම්වලට ඇබ්බැහිව සිටි අයෙක් එම අදහස් පිටුදැක ඉස්ලාමය වැළඳ ගැනීමෙන් පසුව ඔහු කලින් දැරූ අදහස්වලින් සම්පූර්ණයෙන් මිදෙනු ඇතැයි නිශ්චිතවම කිව නොහැකිය. "අපි අපේ පැරණි ආගම අත්හැර ඉස්ලාම් දහම වැළඳ ගත් අළුතදී" යන ප්‍රකාශයෙන් මෙම තත්ත්වය හෙළිදරව් වේ.

### පා සටහන්

[1] අල්කුර් ආන් 53:19
[2] අල්කුර් ආන් 7:138
[3] අල් කුර් ආන් 53:19

## 10 වන පරිච්ඡේදය

## අල්ලාහ් වෙනුවෙන් හැර කුර්බාන් කිරීම.

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: "ඇත්තෙන්ම, මගේ සලාත්ද, මගේ යාගකම්ද, මගේ දිවියද, මගේ මරණයද ලෝකවාසීන් මවා පෝෂණය කරනු ලබන්නාවූ අල්ලාහ්ටයැ"යි කියව. ඔහුට සමාන කිසිවෙක් නැත..."[1] "එහෙයින් නුඹගේ හිමිට නැමදුම් කරව; කුර්බාන් ද දෙව"[2]

අලි (රලි) තුමාගේ කියමනක් උපුටා දක්වන ඉමාම් මුස්ලිම් සිය සහීහ් මෙසේ වාර්තා කරයි: "අල්ලාහ්ගේ දූතයාණන් මට විනිශ්චයන් හතරවක් දුන්හ. අල්ලාහ් හැර අන් කිසිවෙකුගේ නමින් කුර්බාන් කරන තැනැත්තා පිළිකුල් කිරීම; සිය දෙමාපියන්ට ශාප කරන පුද්ගලයා පිළිකුල් කිරීම, දේව උදහසට ලක්වන්නාවූ අපරාධයක් සිදුකළ තැනැත්තෙකුට රැකවරණය දෙනු ලබන පුද්ගලයා පිළිකුල් කිරීම සහ සිය පෞද්ගලික ඉඩමේ මායිම් අසාධාරණ ලෙස වෙනස් කරන පුද්ගලයා පිළිකුල් කිරීම.

තාරික් ඉබ්න් ෂිහාබ්ගේ හදීසයක් උපුටා දක්වමින් අහ්මද් මෙසේ වාර්තා කරයි: මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාළහ: කෙනෙකුට ස්වර්ගයට යැමටත් තවත් කෙනෙකුට නිරයට යැමටත් මැස්සන් විසින් අවස්ථාව සලසා දෙන ලදි" එය කෙසේ සිදුවුනේදැ යි විමසන ලදුව උන්වහන්සේ මෙසේ

පැහැදිලි කළහ: දිනක් මිනිසුන් දෙදෙනෙක් ගමනක් යමින් සිටියහ. එක් ස්ථානයක පිළිමයක් තබාගෙන සිටි ජන කොට්ඨාශයක් පසුකර ගමන් කිරීමට බලාපොරොත්තු වන සෑම කෙනෙක් විසින්ම පිළිමයට යම් ප්‍රාන පූජාවක් කළ යුතු යයි එම කණ්ඩායම කියා සිටියේය. පූජාකිරීම සඳහා තමන් සතුව කිසිවක් නැතැයි පළමුවන පුද්ගලයා පැවසූවිට තම පිළිමයට ඔවුන් විසින් යටත් පිරිසෙයින් මැස්සන් කිහිප දෙනෙකු හෝ පූජා කළයුතු යයි ඔවුහු කියා සිටියහ. එවිට එම පුද්ගලයා මැස්සන් කිහිප දෙනෙකු අල්ලා පූජා කළ බැවින් ඔහුට යෑමට අවසර ලැබුනි. එම හේතුව නිසා ඔහු නිරයට යවනු ලැබීය. දෙවන තැනැත්තාවද යම් ප්‍රානියෙකු පූජා කරන ලෙස දැන්වූ විට තමන් අල්ලාහ්ට හැර අන්කිසිවෙකු උදෙසා යමක් කුර්බාන් නොකරන බව තරයේ ප්‍රකාශ කළේය. එම හේතුව නිසා ඔවුහු ඔහු මරණයට පත් කළහ. එම පුද්ගලයා ස්වර්ගයට ගියේය.

## ඉස්මතුවන කරුණු

1. ඇත්තෙන්ම මගේ සලාත්ද, මගේ යාගකම්ද, මගේ දිවියද, මගේ මරණයද [3] යන පාඨයේ අර්ථය.

2. "එහෙයින් නුඹගේ හිමිට නැමදුම් කරව, කුර්බාන් ද දෙව" [4] යන පාඨයේ අර්ථය.

3. අල්ලාහ්ගේ හැර අන් කිසිවෙකුගේ නමින් කුර්බාන් කරනු ලබන අය හෙලා දැකීම.

4. තම දෙමාපියනට ශාප කරන සහ තවත් අයෙකුගේ දෙමාපියනට ශාප කිරීම මගින් ඔහු ලවා තමන්ගේ දෙමාපියනට ශාප කරවන පුද්ගලයා හෙලා දැකීම.

5. දේව උදහසට ලක්වන්නාවූ අපරාධයක් සිදු කළ තැනැත්තෙකු නීතිමය දණ්ඩනයකට භාජනයවීම වැලැක්වීම සඳහා ඔහුට රැකවරණය දෙනු ලබන පුද්ගලයෙකු හෙලාදැකීම.

6. තමන්ගේ පෞද්ගලික ඉඩමේ මායිම් අසාධාරණ ලෙස වෙනස් කිරීමෙන් අයුතු ලාබ ප්‍රයෝජන ලබන පුද්ගලයා හෙලා

දැකීම.

7. නිශ්චිත අපරාධයක් සිදුකළ නිශ්චිත පුද්ගලයෙකු හෙලා දැකීම සහ පොදුවේ අපරාධකරුවන් හෙලා දැකීම අතර ඇති වෙනස.

8. මැස්සන් පිළිබඳ කථාව.

9. පිළිම වන්දනයේ යෙදෙන්නන්ගේ තර්ජනයෙන් මිදීමේ අවියෙන් පිළිමයට මැස්සන් පූජාකළ තැනැත්තා සිය කැමැත්තෙන් එම ක්‍රියාව නොකළ නමුදු නිරයට යෑම.

10. මුස්ලිම්වරුන්ගේ සිත්තුළ පවත්නා ෂිර්ක් ප්‍රමාණය තක්සේරු කිරීම, පිළිම වන්දනයේ යෙදෙන්නන්ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම සහ ඉවසිලිවන්තව වීර මරණය වැළඳ ගැනීම.

11. නිරයට යවනු ලැබූ පුද්ගලයා මුස්ලිමෙකුවීම. එසේ නොවේ නම් හුදෙක් මැස්සන් පූජා කිරීමේ හේතුවෙන් ඔහු නිරයට ගිය බව නබි (සල්) එහන්සේ නොතෙපලනු ඇත.

12. මෙම කථා පුවත හදිසයක් තහවුරු කරයි. එනම් "ස්වර්ගය, මිනිසෙකුට සිය යටි පතුලට වඩා සමීපය. නිරයත් එසේමය."

13. පිළිම වන්දනයෙහි යෙදෙන්නන් අතර වුවද මුල් තැන හිමිවන්නේ හදවතටය.

## පා සටහන්

[1] අල් කුර් ආන් 6:162-163

[2] අල් කුර් ආන් 108:02

[3] අල්කුර්ආන් 6:162-163

[4] අල් කුර්ආන් 108:2

# 11 වන පරිච්ඡේදය

## වෙනත් අයෙකු නමින් ප්‍රාණ පූජාවන් සිදු කරන ස්ථානයක අල්ලාහ්ගේ නමින් කුර්බාන් නොකළ යුතු බව.

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: "කිසි කලෙකත් එහි නැගිට නොසිටුව....[1] තාබිත් ඉබ්න් අල් දහ්හාක් (රලි) තුමාගේ හදීසයක් උපුටා දක්වන අබූ දාවූද් මෙසේ වාර්තා කරයි: එක් මිනිසෙක් බුවානා යන ස්ථානයෙහි ඔටුවෙක් කුර්බාන් කිරීමට භාරයක් වී එය ඉටු කිරීම සඳහා නබි (සල්) වහන්සේගෙන් අවසර පැතුවේය. එවිට නබි (සල්) වහන්සේ "ජාහිලිය්යාහි මෙන් එම ස්ථානයෙහිත් පිලිම තිබෙනවාදැ"යි විමසූහ. නැත. යනුවෙන් මිනිසා පිළිතුරු දුන්නේය. ඊළඟට නබි (සල්) වහන්සේ "විශ්වාස නොකරන්නවුන් විසින් එම ස්ථානයෙහි උත්සව පැවැත්තුවාදැ" යි විමසූහ. එයටද "නැත." යනුවෙන් පිළිතුරු ලැබුනි. එවිට උන්වහන්සේ "එසේනම් භාරය ඔප්පු කරනු." යයි අවසර දුන්හ. ඔප්පු නොකළ යුතු භාරයක් නම් අල්ලාහ්ට අකීකරු වන භාරයන් හා මිනිසෙකුගේ වත්කම අනුව ඔරොත්තු දිය නොහැකි භාරයන්ය.

### ඉස්මතුවන කරුණු

1. "කිසි කලෙකත් එහි නැගිට නොසිටිනු"[2] යන පාඨයේ අර්ථය.

2. අල්ලාහ්ට අකීකරුවීම මෙන්ම කීකරුවීමද මෙලොවෙහි යම් බලපෑම් ඇති කරන බව.

3. බේද සහිත ප්‍රශ්න සහ සරල ප්‍රශ්න පවත්නා දත්තයන් අනුසාරයෙන් විසදීම.

4. අවශ්‍ය අවස්ථාවන්හිදී ධර්මාචාර්යවරයාගෙන් විස්තර දැනගැනීමට ඇති අයිතිය.

5. නෛතික බාධක කිසිවක් නොමැති නම් භාරයක් ඔප්පු කරනු ලබන ස්ථානය නිශ්චිතව පැවසීම වරදක් නොවන බව.

6. පිළිම වන්දනය සිදුවෙමින් පවත්නා හෝ සිදුවෙමින් පැවැති ස්ථානයක භාරයක් ඔප්පු කිරීම වැරදි සහගත බව.

7. විශ්වාස නොකරන්නවුන් විසින් පෙරදී උත්සව පැවැත්වූ ස්ථානයක (එකී චාරිත්‍ර වත්මනෙහි අභාවයට ගොස් ඇති නමුදු) භාරයක් ඔප්පු කිරීම ද වැරදි සහගත බව.

8. එවන් භාරයක් වීම වැරදි සහගත බැවින් එහි භාරයක් ඔප්පු කිරීමද වැරදි සහගත බව.

9. චේතනාවක් නොමැතිව වුවද විශ්වාස නොකරන්නවුන්ගේ උත්සව විධි අනුකරණය කිරීමේ අවදානම.

10. භාරයක භරය වැරදි සහගත නම් එම භාරය ද වැරදි සහගතවේ.

11. තමාගේ වත්කම අනුව ඉටු කිරීමට තරම් ආර්ථික ශක්තියක් නොමැති භාරයක් වීමද වැරදි සහගතය.

### පා සටහන්

[1] අල්කුර්ආන් 9:107-108.
"ඊර්ෂ්‍යාවෙන් මෙහෙයවනු ලැබ විශ්වාස කරන්නවුන් භේද බින්න කොට අනතුරැ කිරීමට ද ඉහත දී අල්ලාහ්ට සහ ඔහුගේ රසූල්වරයාට විරුද්ධව සටන් කළ අයට පිළියෙල වූවක් වශයෙන් ද නැමදුම් පොළක් ඉදිකළ අය ද (ඔවුන්ගෙන්ය) සත් චේතනාවෙන්ම එය ඉදිකළ බවට දිවුරති. ඇත්තෙන්ම, ඔවුහු බොරැ කාරයෝම යයි අල්ලාහ් සාක්ෂි දරන්නේය. කිසි කලෙකත් සලාත් කිරීම සඳහා එහි නැගිට නොසිටුව. ප්‍රථම දිනයේ සිට භක්ත්‍යාදරෙයෙන් යුක්තව ඉදිකළ නැමදුම් පොළ බවට, නැගිට සිටින්නට ඉතා අගනේය. (නැගිට සිටින්නට යනුවෙන් අදහස් කරන්නේ සලාත් ඉටු කිරීමයි.)"

[2] අල්කුර්ආන් 9:108

## 12 වන පරිච්ඡේදය

### අල්ලාහ් හැර අන්කිසිවෙකුට භාරයක්වීම ෂිර්කයකි.

අල්ලාහ්තආලා මෙසේ වදාළහ. "ඔවුහු (දැහැමි අයවළුන්) ඔවුන්ගේ භාර ඉටු කරති.[1] තොපගේ වස්තුවෙන් කුමන වියදමක් කළහුද, කුමන භාරයක්වීද ඇත්තෙන්ම, අල්ලාහ් එය දන්නේය.[2]

ආයිෂා (රළි) තුමියගේ හදීසයක් සහිහි මෙසේ වාර්තාවේ: අල්ලාහ්ගේ දූතයාණන් මෙසේ වදාළහ. අල්ලාහ්ට කීකරුවන බවට දිවුරුම් දුන් කෙනෙක් සිටී නම් ඔහු එම භාරය ඉටු කළ යුතුය; අල්ලාහ්ට කීකරු නොවන බවට යමෙක් ප්‍රතිඥා දුන්නේ නම්, ඔහු එය ඉටු නොකළ යුතුය.

### ඉස්මතුවන කරුණු

1. භාරයක් වුවහොත් එය ඉටු කිරීමේ යුතුකම.

2. ඉටුකරන බවට වී ඇති භාරය අල්ලාහ්ට ආශිර්වාද කිරීමක් නම් එය ඉටු නොකිරීම ෂිර්කයක් වේ.

3. අල්ලාහ්ට අකීකරුවන් බවට කරනු ලැබූ ප්‍රතිඥාවක් ඉටු කිරීමට අවසර නැත.

පා සටහන්

(1) අල්කුර් ආන් 76-7
(2) අල්කුර් ආන් 2:270

## 13 වන පරිච්ඡේදය

### අල්ලාහ් හැර අන්කිසිවෙකුගේ රැකවරණය සෙවීම ෂිර්කයකි.

අල්ලාහ් මෙසේ වදාරා සිටී. "මිනිසුන්ගෙන් ඇතැමෙක් සමහර ජින්වරුන්ගෙන් රැකවරණය සෙවීවෝය. එහෙත් එයින් සිදුවූයේ ඔවුන්ගේ නොමඟ යෑම තව තවත් අධිකවීමයි.[1]

තව්ලා බින්ත් හකීම් (රලි) තුමියගේ හදීසයක් උපුටා දක්වන මුස්ලිම් මෙසේ වාරතා කරයි: අල්ලාහ්ගේ දූතයාණන් මෙසේ වදාළහ. "යමෙක් යම් නිවසකට ඇතුලුවී මවා තිබෙන්නාවූ සෑම උපද්‍රවයකින්ම මා ආරක්ෂා කරණ ලෙස අල්ලාහ්ගේ පවිත්‍ර වූ වදන්වල රැකවරණය මම පතමි." යනුවෙන් පවසා සිටියහොත් ඔහු එහි සිටිනතාක් කල් කිසිදු හානියක් ඔහුට සිදු නොවේ."

### ඉස්මතුවන කරුණු

1. සූරා "අල් ජින්නු" හි[2] ඇති පාඨය විස්තර කිරීම.

2. අල්ලාහ් හැර අන් කිසිවෙකුගේ රැකවරණය පැතීම ෂිර්කයක් බව.

3. ඉහත දක්වා ඇති හදීසය සාක්ෂියක් වශයෙන් ගැනීම. (උලමාවරුන් මෙම හදීසය විග්‍රහ කරන්නේ මවනු ලැබ ඇති

දෙයක රැකවරණය සෙවීම ෂිර්කයක් බවත් අල්ලාහ්ගේ වදන් මවනු ලැබූ දෙයක් නොවන බවටත්ය.)

4. කෙටි වුවද මෙම යාඥා පාඨයේ ඇති වැදගත්කම.

5. යම් ක්‍රියාවක් මගින් භෞතික වාසියක් ලබා ගැනීමේදී එය ඇතැම් විට ෂිර්කයක් වීමටත් ඉඩ ඇති බව.

### පා සටහන

(1) අල්කුර්ආන් 72:6
(2) - එම -

## 14 වන පරිච්ඡේදය

### අල්ලාහ්ගේ හැර අන්කිසිවෙකුගේ උපකාරය පැතීම ෂිර්ක් වේ.

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: අල්ලාහ් මිස තොපට සැපතක් දිය නොහැකිවූද, විපතක් කළ නොහැකිවූද දැයට අඩනොගසව, ඔබ එසේ කළහොත් ඇත්තෙන්ම, ඔබ වරදකරුවෙකුවේ. අල්ලාහ් ඔබට විපතක් සිදු කරනු ලැබුවහොත්, එය ඉවත් කිරීම සඳහා ඔහු හැර අන් කිසිවෙක් නැත. ....... අල්ලාහ් වෙතින් ඔබේ පෝෂණය සොයවු. ..... අල්ලාහ් හැර තමන්ගේ ආයාචනයන්ට පිළිතුරු නොදෙන්නාවූද තමන්ගේ ආයාචනයන් ගැන නොදන්නාවූද අන්දැය අඩගසනා කෙනෙකුට වඩා පරාජිතවූ කෙනෙක් කවරේද?.... දුක්ඛිතයා අඩගානා කල්හි ඔහුට පිළිතුරු දී ඔහුගේ අසරණ තත්වයට පිළිසරණ සලසන්නේ අල්ලාහ් නොවේද? [1]

අල් තබරානි මෙසේ වාර්තා කරයි: මුහම්මද් නබි (සල්) වහන්සේගේ කාලයෙහි ජීවත්වූ එක් කුහක පුද්ගලයෙක් විශ්වාස කරන්නවුනට ඉමහත් දුක් ගැහැට හා හානි පැමිණවූ බැවින් ඔහුට විරුද්ධව පියවරක් ගැනීම සඳහා නබි (සල්) වහන්සේගේ සහාය සොයමු යයි ඇතැමෙක් යෝජනා කළහ. මෙය ඇසූවිටූ උන්වහන්සේ මෙසේ වදාළහ: මගේ සහාය සෙවීමෙන් පලක් නැත. සෙවිය යුතු වන්නේ අල්ලාහ්ගේ සහායයි.

**ඉස්මතුවන කරුණු**

1. පොදු නැමදුමට නිශ්චිත කරුණු සඳහාවූ නැමදුම් එකතු කිරීම පොදු දෙයකට විශේෂ දෙයක් එකතු කිරීමට සමානවේ.

2. අල්ලාහ් හැර තොපට සැපතක් දිය නොහැකිවූද, විපතක් කළ නොහැකිවූද දැයට අඬ නොගසව්."[2]

3. එසේ කිරීම බරපතලම ෂිර්කය වේ.

4. ඉතාමත් දැහැමි පුද්ගලයෙකු විසින් ආත්මාර්ථකාමීත්වයෙන් තොරවූ කටයුත්තක් සඳහා වුවද එසේ කිරීම වැරදි සහගතවේ.

5. අල්ලාහ් ඔබට විපතක් සිදු කරනු ලැබුවහොත්....[3] යන ර්ළඟ පාඨයේ පැහැදිලි කිරීම.

6. අල්ලාහ් හැර අන්කිසිවෙකුගේ උපකාරය පැතීම පූජනීයත්වයට අවමන් කිරීමක් පමණක් නොව එමගින් මෙලොව යම්කිසි වරප්‍රසාදයක් ලබා ගැනීමටද නොහැකිය.

7. අල්ලාහ් වෙතින් ඔබේ පෝෂණය සොයවු..[4] යන පාඨයේ පැහැදිලි කිරීම.

8. ජීවිකාව හා පෝෂණය සම්බන්ධ ආයාචනයන් අල්ලාහ් හැර අන්කිසිවෙකුට නොකළ යුතුය. ස්වර්ගය සම්බන්ධ ආයාචනයද එසේමය.

9. අන් අය අඬගසන කෙනෙකුට වඩා පරාජිතවූ කෙනෙක් කවරේද....[5] යන පාඨයේ පැහැදිලි කිරීම.

10. අල්ලාහ් හැර අන්අයෙකුගේ සහාය සොයන පුද්ගලයා තරම් නොමඟ ගිය කෙනෙක් නැත.

11. ආයාචනය යොමු කරනු ලබන තැනැත්තා ආයාචනය කරන්නාගේ ආයාචනය ගැන කිසිවක් දැන නොසිටීම.

12. එවන් ආයාචනයක් මගින් ආයාචනය කරන තැනැත්තා සහ ආයාචනය යොමු කරනු ලබන තැනැත්තා අතර වෛරයක් පවා ඇතිවිය හැක.

13. යමෙකුට ආයාචනයක් යොමු කිරීම පවා එක් ආකාරයක නැමදුමක්වේ.

14. එවන් නැමදුමක් පූජනීයත්වයට අවමන් කිරීමක් වේ.

15. මේ සියල්ලකින්ම සිදුවන්නේ ආයාචනා කරන පුද්ගලයා මෝඩයෙකු වීමය.

16. ඔහුගේ අසරණ තත්වයට පිළිසරණ සලසන්නේ කවරෙක්ද?[6] යන පාඨයේ පැහැදිලි කිරීම.

17. පුදුමයට කරුණක් වන්නේ අල්ලාහ් හැර අන්කිසිවෙක් අසරණයන්ගේ ඉල්ලීමට කන් නොදෙන බවට විශ්වාස නොකරන්නවුන් පවා පිළිගැනීමයි. එම නිසා ඔවුන් පවා ආපදාවකට පත්වූ අවස්ථාවල අල්ලාහ්ගේ පිහිටාධාර සොයති.

18. නබි (සල්) වහන්සේ විසින් අල්ලාහ් අබියසදී තව්හිදය සහ විනය ආරක්ෂා කිරීම.

### පා සටහන්

[1] අල්කුර්ආන් 10:106-107, 29:17, 46:5, 27:62

[2] අල්කුර් ආන් 10:106

[3] අල්කුර්ආන් 10:107

[4] " 29:17

[5] " 46:5

## 15 වන පරිච්ඡේදය

### කිසි දෙයක් මැවීමේ ශක්තියක් නැති එහෙත් මවනු ලැබ ඇති දේ ඔවුහු මට සමානයන් කරන්නෝද? තමනට පවා උදව් කර ගන්නට ඔවුනට නොහැක.[1]

අල්ලාහ්තආලා මෙසේ වදාලහ. "තොපි අල්ලාහ් හැර ඔවුනට අඬගසන්නහු නම් ඔවුහු තොපගේ අඬගැමට සවන් නොදෙන්නෝය. ඔවුනට කිසිදු බලයක් නැත්තේය.[2]

උහුද් යුද්ධයේදී නබි (සල්) වහන්සේට පහරක් වැදී උන්වහන්සේගේ දතක් කැඩී ගියේය. කම්පාවට පත් උන්වහන්සේ "තම අනාගත වක්තෘවරයන්ට පහර දුන් ජනතාවක් කෙසේ නම් ජයග්‍රහණයක් අත්පත්කර ගන්නද?" යනුවෙන් පැවසූහ. එම අවස්ථාවෙහි මතු දැක්වෙන පාඨය පහළ විය. "ඔවුන් කෙරෙහි ක්ෂමාව දීම හෝ ඔවුනට දඬුවම් දීම හෝ කිසිත් ඔබට අයිති නැත."[3]

ඉබ්න් උමර් (රලි) තුමා වාර්තා කරන අන්දමට දිනක් නබි (සල්) වහන්සේ අළුයම නැමදුමෙහි රුකූඋ ඉරියව්වේ සිට හිස ඔසවා "අල්ලාහ්තආලාට ඔහුට ප්‍රශංසා කරන තැනැත්තාගේ හඬ ඇසේවා; මගේ ස්වාමින්ද්‍රයාණෙනි! සියළුම ප්‍රශංසා ඔබට හිමිය. මාගේ ස්වාමින්ද්‍රයාණෙනි, අසවල් අසවල් අය ඔබේ උදහසට භාජනය වේවා" යනුවෙන් ආයාචනා කරනු ඔහුට ඇසී

ඇත. "ඔවුන් කෙරෙහි ක්ෂමාව දීම හෝ ඔවුනට දඬුවම් දීම හෝ කිසිත් ඔබට අයිති නැත." [4] යන පාඨය අල්ලාහ් විසින් පහල කරනු ලැබ ඇත්තේ එම අවස්ථාවෙහිය. තවත් වාර්තාවක් අනුව නබි (සල්) වහන්සේ විසින් සෆ්වාන් ඉබ්න් උමයියා, සුහයිල් ඉබ්න් අම්ර් සහ අල් හාරිත් ඉබ්න් හිෂාම් යන අයවලුන්ට ශාප කළ අවස්ථාවෙහි මෙකී පාඨය පහළ කරනු ලැබ ඇත.

අබූ හුරෙය්රා (රලි) තුමාගේ වාර්තාව අනුව "ඔබේ කිට්ටු ඥාතීනට අවවාද කරව" [5] යන පාඨය පහළ කරනු ලැබූ විට නබි (සල්) වහන්සේ නැගිට සිට මෙසේ වාදාරා ඇත. "ක්වාරිෂ්වරුනි; ඔබලාගේ ආත්මයන් ඔබලාම ආරක්ෂා කරගනු. ඔබලාට මා සමඟ ඇති ඥාති සම්බන්ධය අල්ලාහ් ඉදිරියේදී ගණන් ගනු නොලැබේ. අබ්බාස් ඉබ්න් අබ්දුල් මුත්තලිබ්! ඔබට මා සමඟ ඇති ඥාති සම්බන්ධය අල්ලාහ් ඉදිරියේදී ගණන් ගනු නොැබේ. මගේ නැන්දනියවූ සෆියා! ඔබට මා සමඟ ඇති ඥාති සම්බන්ධය අල්ලාහ් ඉදිරියේ ගණන් ගනු නොලැබේ. මගේ දුව, ෆාතිමා! මගේ වස්තුවෙන් ඕනෑම ප්‍රමාණයක් ඉල්ලන්න, මම එය ඔබට දෙන්නම්, එහෙත් ඔබේ විමුක්තිය සම්බන්ධයෙන් මා සමඟ ඔබට ඇති නෑකම ගණන් ගනු නොලැබේ.

## ඉස්මතුවන කරුණු

1. පාඨයන් දෙකෙහි පැහැදිලිකිරීම. [6]

2. උහුද් පිළිබඳ පුවත [7]

3. උදාරතමවූ අනාගත වක්තෘන් වහන්සේගේ ආයාචනාත්මක යාඥාව සහ බුබල මුනිවරයින්ගේ "ආමීනයන්" (එසේම වේවා යන ප්‍රාර්ථනා)

4. ශාප කරනු ලැබුවේ විශ්වාස නොකරන්නවුනටය.

5. තම අනාගත වක්තෘන් වහන්සේට පහරදීම, උන්වහන්සේ ඝාතනය කිරීමේ අටියෙන් ලුහුබැඳීම, තම ඥාතීන්වන මුස්ලිම්වරුන් ඝාතනය කොට අවයවයන් කපා දැමීම ආදී ක්‍රියාවන් මගින් සෙසු විශ්වාස නොකරන්නවුනට වඩා ඉතාමත් බරපතලවූ පාපයන් ඔවුන් සිදුකොට ඇත.

6. එසේ තිබියදීත් "ඔවුන් කෙරෙහි ක්ෂමාවදීම හෝ ඔවුනට දඬුවම්දීම හෝ කිසිත් ඔබට අයිති නැත." [8] යන පාඨය අල්ලාහ් විසින් පහළ කරනු ලැබිය.

7. "ඔවුන් කෙරෙහි ක්ෂමාව දීම හෝ ඔවුනට දඬුවම්දීම හෝ කිසින් ඔබට අයිති නැත." යන පාඨය පහළ කිරීමෙන් පසුව අල්ලාහ් විසින් ඔවුනට ක්ෂමාව දෙන ලදුව ඔවුහු විශ්වාස කරන්නවුන් බවට පත්වූහ.

8. ආපදාවන් ඇතිවූ අවස්ථාවන්හි කුණූත් උසුරා අන්තරාවෙන් මුදවන ලෙස ප්‍රාර්ථනා කිරීම.

9. යමෙක් වෙනුවෙන් ප්‍රාර්ථනා කරන්නේද සලාත්හි ඔවුන්ගේ නම් සඳහන් කිරීම.

10. නිශ්චිත පුද්ගලයෙකුට ශාප කිරීම.

11. "ඔබේ කිට්ටු ඥාතීනට අවවාද කරව" යන පාඨය පහළවූ අවස්ථාවෙහි නබි (සල්) වහන්සේ ක්‍රියා කළ ආකාරය.

12. මෙම කරුණ නබි (සල්) වහන්සේ බැරෑරුම් ලෙස සලකා ක්‍රියාකිරීම සහ එසේ ක්‍රියා කිරීම උමතු ක්‍රියාවක් වශයෙන් ඇතැමෙක් හැඳින්වීම. එහෙත් එම අවස්ථාවෙහි උන්වහන්සේ කළ අර්ථනිරූපනයෙහි නිරවද්‍යතාවය.

13. නබි (සල්) වහන්සේ විසින් තම දියණියන් වන ෆාතිමා (රලි) තුමිය ඇතුළු සමීප හා දුරස්ථ ඥාතීන් අමතා "ඔබලාට මා සමහ ඇති ඥාති සම්බන්ධය අල්ලාහ් ඉදිරියේදී ගණන් ගනු නොලැබේ." යයි කළ ප්‍රකාශය, අනාගත වක්තෘන් වහන්සේලා අතර ප්‍රමුඛයා විසින් කාන්තා වර්ගයාගේ

නායිකාව අමතා අභීතව ඇත්ත ඇති සැටියෙන් ප්‍රකාශ කිරීම නූතන ලෝකයේ බලවත් පුද්ගලයින් විසින් දක්වන ඥාති සංග්‍රහය හා සසඳා බලන විට කෙතරම් වෙනස් ද යන්න. තව්හිදයේ සත්‍යතාවය සහ ඉස්ලාමයේ අද්විතීයභාවය මෙයින් උද්දීපනය වේ.

## පා සටහන්

1 අල්කුර්ආන් 7:191-192

2 " 35:14

3 " 3:128

4 අල්කුර් ආන් 3:128

5 " 26:214

6 අල්කුර් ආන් 7:191-192, 35:13

7 මෙම යුද්ධය හිජ්රි වර්ෂ 03 දී මදිනා නගරයෙන් පිටත උහුද් කන්ද අසලදී මුස්ලිම්වරුන් සහ මක්කා වාසීන් අතර සිදුවිය. ඊට පෙර වසරෙහි බද්ර් යුද්ධයේදී පරාජයට පත්වූ මක්කා වාසීන් මුස්ලිම්වරුන් සමඟ යුද වැදී ඔවුන්ගෙන් පලි ගත යුතුය යන අධිෂ්ඨානයෙන් යුක්තව ඒ සඳහා සූදානම්ව පැමිණියහ. බල සම්පන්නවූ මුස්ලිම් හමුදාව අතින් පරාජයට පත්වූ මක්කා වාසීන්ගේ පාබල හමුදාවේ සහායට පැමිණි ප්‍රබල අශ්වාරෝහක බල ඇණියට නබි (සල්) වහන්සේ විසින් කඳු මුදුනේ උචිත ස්ථානයන්හි යොදා සිටි දුනුවායන් නිසා ඉදිරියට පැමිණීමට නොහැකි විය. සටන අවසන්වී යයි සිතූ දුනුවායෝ පහත තැනිතලාවට බැස සිටියහ. මෙම

අවස්ථාවෙන් ප්‍රයෝජනය ගත් මක්කානු අශ්වාරෝහක බල ඇණිය ඉදිරියට ගමන්කොට මුස්ලිම්වරුන්ට පිටුපසින් පහර දුන්නේය. මුස්ලිම්වරු පරාජයට පත්වූහ. නබි (සල්) වහන්සේට තුවාල සිදුවිය. එහෙත් මක්කා වාසීන් ඔවුන් ලත් ජයග්‍රහණය තහවුරු කර නොගෙන ආපසු ගියහ. උහුද් යුද්ධයේදී මුස්ලිම්වරුන්ගේ ධෛර්ය සම්පන්න භාවයට එල්ලවූයේ බලවත් පහරකි.

[8] අල්කුර් ආන් 3:128

[9] අල්කුර් ආන් 3:128

[10] " 26:214

## 16 වන පරිච්ඡේදය

**විනිශ්චය දිනයේදී ඔවුන්ගේ සිත් තුළින්
බිය ඉවත් කරනු ලැබ "ඔබේ ස්වාමීන්ද්‍රයාණන්
විසින් කවර අන්දමින් ඔබ විනිශ්චය කරනු
ලැබුවේදැ"යි විමසනු ලැබූ විට
සාධාරණ අන්දමින්. අල්ලාහ් අති උත්කෘෂ්ඨය,
අති උදාරය." යි ඔවුහු කියන්නෝය.[1]**

අබූ හුරෙයිරා (රලි) තුමාගේ හදීසයක් උපුටා දක්වන සහී මෙසේ වාර්තා කරයි: මුහම්මද් නබී (සල්) වහන්සේ මෙසේ වදාළහ: "අල්ලාහ් විසින් තීන්දුවක් දුන්විට මලාඉකාවරු භක්ත්‍යාදර ප්‍රණාමය දැක්වීම සඳහා තටු සලති. විනිශ්චයට භාජනයවූ අය සන්සුන්ව සහ තෘප්තියෙන් යුක්තව තීන්දුව පිළිගනිති. ඔවුන්ගේ සිත් තුළින් බිය ඉවත් කරනු ලබේ. "ඔබේ ස්වාමීන්ද්‍රයාණන් විසින් කවර අන්දමින් ඔබ විනිශ්චය කරනු ලැබුවේදැයි" ඔවුන්ගෙන් විමසනු ලැබූවිට ඔවුහු සාධාරණ අන්දමින්. අල්ලාහ් අති උත්කෘෂ්ඨය, අති උදාරයය." යි පිළිතුරු දෙති. එකා පිට එකා නැගී හොරෙන් කන්දීගෙන සිටින සාතන්ගේ සහචරයෝ එම තීන්දුව විකෘතිකර පහත සිටින යක්ෂයාට දන්වති. එම පුවත පොළොවට ළඟාවීමට පෙරාතුව සියයට අධික වාරයක් විකෘතිකිරීම්වලට භාජනයවේ. අවසානයේදී ඇතැම් ඇස් තිබෙන අන්ධයින් විසින් ඒවා විශ්වාස කරනු ලැබේ.

අල්ලාහ්ගේ දූතායාණන් මෙසේ වදාළ බව නවාස් ඉබ්න්

සමාන් (රලි) තුමා වාර්තා කරයි. "යම් දෙයක් මිනිස් වර්ගයා වෙත ප්‍රකාශ කිරීමට අල්ලාහ්ට අවශ්‍ය වූ විට ඔහු පහළ කළයුතු වචන උසුරුවයි. එවිට ඔහු කෙරෙහි ඇති බියෙන් අහස් ගැබ තදින් දෙදරුම් කරයි. ඔහුට සියළු කීර්ති ප්‍රශංසා හිමිවේවා. අල්ලාහ්ගේ වචන ස්වර්ගවාසීන්ට ඇසුනු විට ගැස්සී සිටින ඔවුහු මුනින්තලාව වැතිරෙති. ඔවුන් අතුරින් ප්‍රථමයෙන් හිස ඔසවනුයේ මලාඉකා ජිබ්රීල්ය. එවිට අල්ලාහ් තම වදන් පහළ කරන ලෙස ජිබ්රීල් (අලෛ) අණ කරයි. එවිට ජිබ්රීල් එක් එක ආකාශ ගැබක්ම පසුකර එන විට හමුවන නොයෙකුත් මලාඉකාවරු "ජිබ්රීල්, අපේ ස්වාමීන්ද්‍රයාණන් කුමක් කීවේහිදැ" යි විමසති. එයට පිලිතුරැ වශයෙන් හෙතෙම "උන්වහන්සේ සත්‍යය ප්‍රකාශ කළහ. ඔහු උත්කෘෂ්ඨයය, අති උදාරය යනුවෙන් පිලිතුරැ දෙයි. එවිට මලාඉකාවරුන් සියළු දෙනා ද එම වදන් ශබ්ද නඟා කියති. අනතුරුව, ජිබ්රීල් (අලෛ) අල්ලාහ් විසින් විධානය කරනු ලැබූ ස්ථානයට ගමන් කරයි.

## ඉස්මතුවන කරුණු

1. "ඔවුන්ගේ සිත්වලින් බිය ඉවත් කරනු ලැබූ විට(2) යන පාඨයේ පැහැදිලි කිරීම.

2. ෂිර්ක් වලට විරුද්ධව, විශේෂයෙන් මුනිවරයින් විසින් මැදිහත්වනු ඇතැයි බලාපොරොත්තු තැබීමට විරුද්ධව මෙම පාඨයෙන් ඉදිරිපත් කොට ඇති ප්‍රබල තර්කය. මෙම පාඨය බොහෝ අවස්ථාවල හඳුන්වනු ලබන්නේ ෂිර්ක්හි කොඳු ඇටය බිඳිමක් වශයෙනි.

3. "සාධාරණ අන්දමින් අල්ලාහ් අති උත්කෘෂ්ඨය, අති උදාරයය යනුවෙන් ඔවුහු පිළිතුරු දෙති" යන වදන්වල අර්ථය පැහැදිලි කිරීම.

4. එම ප්‍රශ්නය ඔවුන්ගෙන් ඇසීමට හේතුව.

5. "අල්ලාහ් මෙසේ වදාළහ:" යනුවෙන් ජිබ්රීල් විසින් පිළිතුරු දීම.

6. මුනින් තලාව සිට ප්‍රථමයෙන් හිස ඔසවනු ලබන්නේ ජිබ්රීල්ය යන්න.

7. ස්වර්ගවාසීන් විසින් ප්‍රශ්න කළවිට ජිබ්රීල් විසින් ඔවුනට පුවත කියා සිටීම.

8. අල්ලාහ්ගේ වදන් වලින් හටගන්නා කම්පනය සියළු ස්වර්ගයන් සහ එහි ජනතාවන් වෙලා ගැනීම.

9. අල්ලාහ්ගේ වදනින් අකාශයන් දෙදරුම්කෑම.

10. අල්ලාහ් විසින් විධානය කරනු ලැබූ විට ඔහු විසින් පහල කරන්නාවූ වදන් ජිබ්රීල් විසින් පැතිරවීම.

11. සාතාන්ගේ සහචරයෝ හොරෙන් සවන්දී සිටීම.

12. ඔවුන් එකා පිට එකා නැගී සිටීම.

13. උල්කාපාතයන් එවීම.

14. සාතන් විසින් සිය මිනිස් නියෝජිතයා වෙත පණිවුඩලය ගෙනයාමට පෙරාතුවද, ඇතැම් විට ඉන්පසුවද උල්කාපාතයන් එම සම්ප්‍රේක්ෂණයට බාධා පැමිණවීම.

15. ඇතැම්විට ජේන කියන්නන් විසින් සත්‍යකිමට ඉඩ ඇති බව.

16. එවන් එක් සත්‍යයක් සමඟ ජේන කියන්නා විසින් සියයකුත් එකක් බොරු කියන බව.

17. ජේන කියන්නන්ගේ අසත්‍යයන් සමහර විට සත්‍යයක් බවට පත්වේ. එය අවකාශයේ සිට ඇසුණු දේය.

18. ජනතාව විසින් අසත්‍යය, සත්‍යයක් ලෙස පිළිගැනීම, එක් කරුණක් පිළිබඳව සත්‍යය කියන ජේන කියන්නා ඉතිරි කරුණු අනූ නවය සම්බන්ධයෙන් බොරු කියන බව මිනිසා අමතක කරයි.

19. එක් අයෙක් විසින් අනෙකාට පුවත සැළකරයි. එය කට පාඩම් කරගෙන තමන්ගේ වාසිය සඳහා ප්‍රයෝජනයට ගනු ලබයි.

20. කම්පනය හේතු කොට ගෙන ආකාශයන් දෙදරැම්කැම

අල්ලාහ් කෙරෙහිවූ බිය නිසා ඇතිවීම.

21. අල්ලාහ්ගේ වදන් අසා ස්වර්ගවාසීන් සියළු දෙනා මුනින් තලාව වැටීම.

පා සටහන්

[1] අල්කුර් ආන් 34:23

[2] අල්කුර්ආන් 34:23

# 17 වන පරිච්ඡේදය

## මැදිහත්වීම.

අති උත්කෘෂ්ටවූත්, අති උදාරවූත් අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: තමනට ඔහු හැර වෙන උදව් කරන කිට්ටුවන්තයෙක් ද මැදිහත්වන්නෙක්ද නැතිව සිටියදී ඔවුන්ගේ ස්වාමීන්ද්‍රයාණන් වෙතැ (අන්තිම දින විනිශ්චය පිණිස) පමුනුවනු ලැබීම ගැන බියවන්නාවූ ඔවුනට එයින් (අල් කුර් ආනයෙන්) නුඹ අවවාද කරව. ..... ඔවුන් අල්ලාහ්ට බියවීම පිණිස ......" මැදිහත්වීම් සියල්ලට අවසරදීම පූර්ණ වශයෙන්ම අල්ලාහ් සතු අයිතියක් යයි කියව.... ඔහුගේ අවසරයෙන් විනා ඔහු අබියස මැදිහත්වනුයේ කවරෙක්ද? ..... අහස්හි කොතෙකුත් මලාඉකාවරු සිටියද - ඔවුන්ගේ මැදිහත්වීම ප්‍රයෝජනවත් නොවන්නේය. ඔහු (අල්ලාහ්) තමන් කැමැති කෙනෙකුට මැදිහත්වීමට සමු දුන්නායින් පසුව මිස ..... අල්ලාහ් හැර තොපට උදව් කළ හැකි යයි තොප වරදවා සිතන අයට අඬගසනු. අහස්හි හෝ පොළොවෙහි හෝ ඔවුහු පරමාණුවක තරම් බරක් ඇති බලයකට හෝ හිමිකම් ඇත්තෝ නොවෙති....." [1]

අබූ අල් අබ්බාස් තුමා මෙසේ වාර්තා කරයි: විශ්වාස නොකරන්නවුන් විසින් ගෞරවාන්විතව සලකනු ලබන අල්ලාහ්ගෙන් බාහිරවූ තැනැත්තන්ට කිසිදු බලයක් නොමැත්තේය යි අල්ලාහ් අවධාරණය කරයි. ඔහු හැර අන් අයෙකුට ඔවුන්හට යම් උදව්වක් කළ නොහැකිය. ඉතිරිව

ඇත්තේ මැදිහත්වීම පමණි. එහෙත් එම බලය ද භුක්ති විඳිය හැක්කේ අල්ලාහ් විසින් සිය අභිමතය පරිදි එය පවරනු ලැබ ඇත්තාවූ අයට පමණි. අල්ලාහ් මෙසේ වදාරා සිටී: "ඔහු පිනා ගිය කෙනෙකුට මිස ඔවුහු මැදිහත්ව කථා නොකරති." [2]

විශ්වාස නොකරන්නවුන් විසින් විනිශ්චය දිනයේදී බලාපොරොත්තු වන්නාවූ මාදිලියේ මැදිහත්වීම අල්කුර්ආනය මගින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත. මුහම්මද් නබි (සල්) වහන්සේ විසින් අපට දැනුම් දී ඇති පරිදි විනිශ්චය දිනයේදී උන්වහන්සේ අල්ලාහ් අබියසට කැඳවනු ලැබේ. එවිට උන්වහන්සේ අල්ලාහ් අබියස මුණින්තලාව වැතිර අල්ලාහ්ට ස්තොත්‍ර කර ආශිර්වාද කරයි. එවිට අල්ලාහ් විසින් උන්වහන්සේට "නැගී සිටිනු." යයි විධානය කරනු ලබයි. අනතුරුව "දැන් කථා කරනු. එයට මම කන්දෙමි; ඉල්ලා සිටිනු; මම එය ඉටු කරමි, මැදිහත්වනු; එයටද මම ඉඩදෙමි." යයි වදාරා සිටිනු ඇත.

අබූ හුරෙයිරා (රලි) තුමා මුහම්මද් නබි (සල්) වහන්සේ අමතා "ඔබ වහන්සේගේ මැදිහත්වීම ලබාගත හැකිවූ භාග්‍යවන්තයා කවරෙක්දැ" යි විමසුවේය. "අල්ලාහ් හැර අන් කිසි දෙවි කෙනෙක් නැත." යනුවෙන් අවංකවම සාක්ෂි දරන පුද්ගලයා යයි උන්වහන්සේ පිළිතුරු දුන්හ. එමනිසා, මැදිහත්වීම ලැබෙන්නේ අවංක ලෙසින් විශ්වාස කරන්නාවූ ඊමාන්ධාරීන්ටය. එය පිරිනමනු ලබන්නේ අල්ලාහ්ගේ අවසරය පරිදිය. සමානයන් තබන්නවුනට එම භාග්‍යය හිමි නොවේ. මෙයින් හෙළිදරව් වන සත්‍යය නම් අල්ලාහු සුබ්හානු වතආලා

විසින් සිය ආශිර්වාදය තමා විසින් උච්චස්ථානයට උසස් කරනු ලැබ ඇති මුහම්මද් නබි (සල්) වහන්සේගේ මාධ්‍යයෙන් අවංකව විශ්වාස කරන්නාවූ පුද්ගලයා වෙත පිරිනමනු ලබන බවයි. කුර්ආනයේ සඳහන්වන අයුරු එක් අවස්ථාවකදී ප්‍රතික්ෂේප කරනු ලැබ එහෙත් විශේෂ අවස්ථාගත කරුණු අනුව තහවුරුකර ඇති පරිදි අල්ලාහ්ගේ අවසරය ඇතිව මැදිහත්වීම සිර්ක් නොවේ. තවද, මුහම්මද් නබි (සල්) වහන්සේ විසින් තවදුරටත එය තව්හීද්හි පිහිටා සිටින අවංක හා අචල විශ්වාස කරන්නවුනට සීමාකොට ඇත.

## ඉස්මතුවන කරුණු

1. මෙම පරිච්ඡේදයෙහි සඳහන්ව ඇති අල්කුර්ආන් පාඨයන්ගේ පැහැදිලි කිරීම.

2. ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති මැදිහත්වීමේ ස්වභාවය.

3. විනිශ්චය දිනයේදී මුහම්මද් නබි (සල්) වහන්සේ වෙත ත්‍යාගශීලීව පවරනු ලැබ ඇති "මහා මැදිහත්වීමේ" ස්වභාවය.

4. එදින මුහම්මද් නබි (සල්) වහන්සේ කටයුතු කරන ආකාරය පිළිබඳ විස්තරය. මුලින්ම මැදිහත්වීම වෙනුවට උන්වහන්සේ ප්‍රථමයෙන් මුනින්තලාව වැතිරීම සහ අනතුරුව මැදිහත්වීම සඳහා අවසරදීම.

5. එයට උපරිම සුදුසුකම් ලද්දෝ කවරහුද?

6. එය සමානයන් තබන්නවුනට හිමි නොවීම.

7. එහි නිශ්චිත ස්වභාවය.

## පා සටහන්

[1] අල්කුර්ආන් 6:51, 39:44, 2:255,
53:26, 34:22

[2] " 21:28

## 18 වන පරිච්ඡේදය

### ඇත්තෙන්ම (මුහම්මද්), ඔබ ප්‍රිය කරන කෙනෙකු යහමඟ යවන්නට ඔබට නොහැකිය. එහෙත් අල්ලාහ් ඔහු සිතූ කෙනෙකු යහමඟ යවන්නේය....." [1]

ඉබ්න් අල් මුසයියිබ් ඔහුගේ පියාණන්ගෙන් දැනගත් පුවතක් සහිහි මෙසේ වාර්තාවේ: අබූ තාලිබ් මරණාසන්නව සිටියදී ඔහු බැලිම සඳහා මුහම්මද් නබි (සල්) වහන්සේ පැමිණි අවස්ථාවෙහි අබ්දුල්ලා ඉබ්න් අබූ උමයියා සහ අබූ ජහල් එහි සිටියහ. එහිදී නබි (සල්) වහන්සෙ ඔහු අමතා ”ලොකු අප්පා” ඔබ වෙනුවෙන් මට අල්ලාහ් ගෙන් ආයාචනා කිරීමට හැකිවනු පිණිස, ”අල්ලාහ් හැර අන් කිසි දෙවි කෙනෙක් නැතැ” යි සාක්ෂි දරන්න යනුවෙන් ඉල්ලා සිටියහ. එවිට අබූ තාලිබ් ”ඔබ අබ්ද් අල් මුතාලිබ්ගේ ආගම පිටු දකින්ද මට කියන්නේ?” යයි පිළිතුරු දුන්නේය.

නබි (සල්) වහන්සේ පලමු ප්‍රශ්නය නැවත ඇසූහ.අබූ තාලිබ්ද,අවසන් හුස්ම හෙලනතෙක්ම ”අබ්ද් අල් මුතාලිබ් ගේ දහම සත්‍යය වශයෙන් පිලිගනිමි” යනුවෙන් කියමින් සිටියේය.

නබි (සල්) වහන්සේද ”ඔබට සමාව දෙන මෙන් මම තවතවත් අල්ලාහ්ගෙන් ප්‍රාර්තනා කරමින් සිටින්නෙමි එසේ ප්‍රාර්තනාකිරීම තහනම් නොකරනතාක්කල් මම ඔබ වෙනුවෙන් ප්‍රාර්තනා කරමි.” යනුවෙන් ප්‍රකාශ කළහ. එම අවදියෙහි අල්ලාහ්තආලා

විසින් මතු දැක්වෙන කුර්ආන් පාඨය පහල කලහ."සමානයන් තබන්නවුන් වෙනුවෙන් සමාව ඇයදීමට නබිවරයාටද විශ්වාස කරන අයටද අවකාශ නොමැත."[2] අබූ තාලිබ් සම්බන්දයෙන් අල්ලාහ්තආලා මතු දැක්වෙන පාඨය පහලකලහ."ඇත්තෙන්ම, (මුහම්මද්) මුඹ ප්‍රිය කරන කෙනෙකු යහමග යවන්නට මුඹට නොහැකිය. එහෙත් අල්ලාහ් ඔහු සිතූ කෙනෙකු යහමඟ යවන්නේය.[3]

## ඉස්මතුවන කරුණු

1. ඇත්තෙන්ම,(මුහම්මද්) මුඹ ප්‍රිය කරන කෙනෙකු යහමග යවන්නට මුඹට නොහැකිය.[4] යන අල්කුර්ආන් පාඨය පැහැදිලි කිරීම.

2. සමානයන් තබන්නවුන් වෙනුවෙන් සමාව ඇයදීමට නබිවරයාටද විශ්වාස කරන අයටදඅවකාශ නොමැත.[5] යන පාඨයේ පැහැදිලි කිරීම.

3. "අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නැත යනුවෙන් සාක්ෂි දරන්න."යනුවෙන් නබි(සල්) වහන්සේ විසින් සිය ලොකුඅප්පාට විධානය කිරීමය.

4. නබි(සල්) වහන්සේ විසින් සිය මහඅප්පාට "අල්ලාහ් හැර අන්කිසි දෙවි කෙනෙක් නැත යනුවෙන් සාක්ෂි දරන ලෙස දැන්වූ විට උන්වහන්සේ තුල පැවැති චේතනාව අබූ ජහල්

සහ ඔහුගේ හිතවතුන් දැන සිටියෝය. ඉස්ලාමයේ හරය සහ ප්‍රභවය පිළිබඳව අබූ ජහල්ට වඩා අඩු දැනුමක් ඇත්තවුන්ගේ පිළිකුල් භාවය අල්ලාහ් මෙම පාඨය මගින් පෙන්වා දෙයි

5.සිය ලොකු අප්පා, ඉස්ලාම් ධර්මය වෙත හරවා ගැනීම සඳහා මුහම්මද් නබි(සල්) වහන්සේ දැක්වූ උනන්දුව

6.අබ්ද් අල් මුතාලිබ් සහ ඔහුගේ පෙර පැවතෙන්න වුන් ඉස්ලාමයට පිවිස සිටි බවට ඇති දුර්මතය බැහැර කිරීම.

7.මුහම්මද් නබි(සල්) වහන්සේ විසින් ඔහුට(අබ්ද් අල් මුතාලිබ්ට) සමාව දෙන ලෙස අල්ලාහ්ගෙන් ප්‍රාර්තනා කරනු ලැබූ නමුත් අල්ලාහ් විසින් එම ප්‍රාර්තනය නොකරන ලෙසට තහනම් කර තිබීම

8.දුර්ජනයාගෙන් මිනිස් සංහතියට සිදුවියහැකි හානිය.

9.නායකයින් සහ පැරැන්නන් පුද්ගලිකාබිවාදනයෙන් ඇදහීම හානිකරබව.

10.අබූ ජහල්ගේ කියමනෙහි සාවද්‍යතාවය.

11. ක්‍රියාවක වටිනාකම රදාපවතිනුයේ එහි ප්‍රතිඵලය මතය යන සිද්ධාන්තය පිළිබඳ සාක්ෂිය. අබ්ද් අල් මුතාලිබ් විසින් ඔහුගෙන් ඉල්ලා සිටි ආකාරයට සාක්ෂි සැරැවේ නම්, ඔහුට විමුක්තිය හිමිවීමට තිබුනි.

12. නොමඟ ගිය අයවලුන් විසින් ඉහත දැක්වෙන තර්කය ගැන දැක්වූ ආකල්පය.

### පා සටහන්

[1] අල්කුර්ආන් 28:56

[2] එම 9:113

[3] එම 28:56

[4] එම 28:56

[5] එම 9:113

## 19 වන පරිච්ඡේදය

### දැහැමි පුද්ගලයන් පුද්ගලිකාභිවාදයෙන් ඇදහීම විශ්වාස නොකිරීමේ හේතුකාරකයවේ.

අති උත්තමවූ අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: "පුස්තකය හිමි අයවලුනි! තොපගේ මාර්ගයෙහි (ඊසා ගැන) සීමාව නොඉක්මවූ"[1]

"තොපගේ දෙවියන් අත් නොහරිවූ; වාද්ද, සුවා:ද, යාගුත්ද,යාඌක්ද, නසර්දඅත්නොහරිවී"යි ඔවුහු කීවෝය.[2] යන පාඨය සම්බන්දයෙන් කරුණු දක්වමින් ඉබ්න් අබ්බාස් සහිහි මෙසේ විස්තරකරයි: "මෙහි දැක්වෙන්නේ නූහ්ගෙන් පැවතෙන්නාවූ දැහැමි පුද්ගලයින්ගේ ගරු කිරීම සඳහා පිලිරූ ඉදිකරන ලෙසටත් එසේ ඉදිකරනු ලැබූ පිලිරූ වලට ඔවුන්ගේ නම් තබන ලෙසටත් ෂෙයිතාන් විසින් එම දැහැමි පුද්ගලයින්ගේ අනුගාමිකයින්ගේ සිත් තුලට අදහසක් කාවද්දන ලදී. එම පිලිරූ ඉදිකර සැහෙන කාලයක්ගතවීමෙන් පසු ඒවා ඉදිකරනු ලැබූවේ කවර හේතුවක් නියන්න මතකයෙන් ඇත්විය. ඔවුනට දැක්වූ අසීමිත ගෞරවාදය පසු කලෙකදී නැමදුම් කිරීමකට පරිවර්තනය විය.

මුස්ලිම් සහ අල්බුහාරි උපුටා දක්වමින්ඉබ්න් අල් කයියුම් වාර්තාකරන අන්දමට පැරැන්නන් බොහෝ දෙනෙකු මිය යැමෙන් පසුව,ඔවුන් මිහිදන් කල ස්ථානවල ඔවුන්ගේ පිළිරූ ඉදිකරනු ලැබ පසු කාලයකදී ඔවුන්ට දෙවි දේවතාවුන්වශයෙන්

වැදුම් පිදුම් කරනු ලැබිය. මුහම්මද් නබි(සල්) වහන්සේ මෙසේ වදාල බව උමර් වාර්තා කරයි:කිතු බැතිමතුන් මරියම්ගේ පුතනුවන්ට දේවත්වය ආරෝපණය කළ ආකාරයට මට දේවත්වය ආරෝපණය නොකරනු.මම සාමාන්‍ය මිනිසකු පමණි. ඔහුගේ සේවකයා සහ දූතයා වශයෙන් මා හඳුන්වනු."තවදුරටත් උන්වහන්සේ මෙසේ වදාරා ඇත."ආගමික කටයුතුවලදී පුද්ගලිකාභිවාදනයෙන් නොඅදහනු. ඔබලාට පෙර පැවතියවුන් විනාශයට භාජනය වූයේ එසේ පුද්ගලිකාභිවාදනයෙන් ඇදහීම හේතු කොටගෙනය." මුහම්මද් නබි(සල්) වහන්සේ "පුද්ගලිකාභිවාදනයෙන් ඇදහීම් කල අය විනාශයට පත්වූහ." යනුවෙන් තෙවරක්ම කියාසිටි බව ඉබ්න් මසූද් වාර්තා කළේ යයි මුස්ලිම්හි සඳහන් වේ.

## ඉස්මතුවන කරුණු

1. ඉහත දැක්වෙන සහ ඉදිරියට ඇති පරිච්ඡේදයන් යමෙකුට වැටහෙන්නේද ඔහුට ඉස්ලාමයේ අද්විතීයත්වය ද,අල්ලාහ්ගේ බලපරාක්‍රමය මෙන්ම මිනිසුන් චින්තනය වෙනස් කිරීමට ඔහුට ඇති බලය ද හොඳාකාරව අවබෝද වේ.

2. ඉතිහාසයේ ප්‍රථම ෂිර්කය සිදුවූයේ දැහැමි පුද්ගලයින් සම්බන්දයෙන් බව.

3. අනාගත වක්තෘන් වහන්සේලා අල්ලාහ් විසින් පහල කරනු ලැබූ නමුදු ඔවුන්ගේ ආගම් සංශෝධනයට බදුන් වීම.

4. තහවුරු වූ නීතීන්ට පටහැනිව සහ ස්වාභාවික තර්ක බුද්ධිය කෙලෙසමින් වැරදි සහගත නව ප්‍රවනතාවයන් වැලඳ ගැනීම.

5. මෙසේ සිදුවීමට හේතුව සත්‍ය සමග අසත්‍ය මිශ්‍ර කිරීම බව. ප්‍රථමයෙන් ඇතිවූයේ දැහැමි පුද්ගලයින් කෙරෙහි වූ ප්‍රසාදයයි. අනතුරුව බුද්ධිමතුන් විසින් සද්භාවයෙන් යුතුව කරනු ලබන ක්‍රියාව වේ. පසුව බිහිවන පරම්පරාවන් විසින් එම සද්භාවය වැරදි ලෙස වටහා ගැනීම.

6. සූරා නූහ් හි ඇති පාඨයේ පැහැදිලි කිරීම [3]

7. සත්‍යය පිටු දකිමින් අසත්‍ය කරා නැඹුරුවන පුද්ගලයාගේ චරිතය

8. සාවද්‍යවූ නව ප්‍රවනතාවයන් තුරුළුකර ගැනීම තුලින් මිනිසා විශ්වාස නොකරන්නවුන්ගේ තත්වයට පත්වන බවට ඇති සම්ප්‍රදානුකූලව පිලිගත් සාක්ෂි.

9. සද් චේතනාවෙන් යුක්ත වුවද නව ප්‍රවනතාවයන් ගේ අවසාන ප්‍රතිඵලය හා ෂෙයිතාන්ගේ ඒකාන්ත බලපෑම.

10. පුද්ගලිකාභිවාදනයෙන් ඇදහීම තහනම් කිරීමේ මූලධර්මය.

11. සද්භාවයෙන් යුක්ත වුවද මිනී වලවල් කරා ගොස් වැඩිවෙලාවක් ගත කිරීමෙන් සිදුවන හානිය.

12. පිළිරූ තහනම් කිරීමේ සහ ඒවා දර්ශනයෙන් ඉවත් කිරීමේ ප්‍රඥාව.

13. මෙහි වැදගත්කම සහ එය සදා මතකයෙහි තබා ගැනීමේ අවශ්‍යතාවය.

14. නූහ්ගේ අනුගාමිකයින්ගේ පුද පූජා විධි පිළිබඳ පැහැදිලි කිරීම.

15. ඔවුන් විසින් බලාපොරොත්තු වන්නේ මැදිහත්වීම යයි පහදා දීම.

16. ප්‍රථමයෙන්ම පිළිරූ ඉදිකළ අයගේ සිත් තුළ තිබූ චේතනාව.

17. "කිතු බැතිමතුන් මරියම්ගේ පුතනුවන්ට දේවත්වය ආරෝපණය කළ ආකාරයට මට දේවත්වය ආරෝපණය නොකරනු" යන මුහම්මද් නබි(සල්) වහන්සේගේ උදාර ඉගැනවීම.පණිවුඩය එතරම් පැහැදිලි ආකාරයකින් අප වෙත ගෙන ඒම ගැන අල්ලාහ්ගේ ශාන්තිය උන්වහන්සේට හිමිවේවා.

18. ආගමික කටයුතුවලදී පුද්ගලිකාභිවාදනයෙන් යුක්තව ඇදහීමෙන් අපට අයහපතක් සිදුවනබවට උන්වහන්සේ විසින් අනුශාසනා කර තිබීම.

19. පිලිරුවල ප්‍රභවය පිළිබඳ දැනුම අභාවයට යන තෙක්ම ඒවාට නැමදුම් නොකළ බවට කර ඇති පැහැදිලි කිරීම. ඓතිහාසික දැනුමේ වටිනාකම.

20. දැනුම කාලයාගේ ඇවෑමත් සමඟ ගිහිලියාම

## පා සටහන්

[1] අල්කුර්ආන් 4:171

[2] එම 71:23

[3] එම 71:23

## 20 වන පරිච්ඡේදය

### දැහැමි පුද්ගලයින්ගේ මිනිවලවල් අබියසදී අල්ලාහ් නමදින සහ දැහැමි පුද්ගලයන්ට වැඳුම් පිදුම් කරන අයවලුන් හෙළාදැකීම

ආයිෂා (රලි) තුමියගේ වාර්තාවක සඳහන් මෙසේ දැක්වේ : තමන් ඇබිසීනියාවේ ක්‍රිස්තියානි පල්ලියක පිළිම රාශියක් තිබෙනු දුටු බව උම්මු සල්මා තුමිය නබි (සල්) වහන්සේට දැන්වූවාය. එවිට නබි (සල්) වහන්සේ මෙසේ වදාලහ : "ඔවුන් මිනිසුන් අතරින් නරකම මිනිසුන්ය. ඔවුන්ගේ කණ්ඩායමේ සිටි දැහැමි පුද්ගලයෙකු මිය ගිය විට ඔවුහු ඔහුගේ මිනිවල මත පල්ලියක් ඉදිකොට ඔහු වෙනුවෙන් එහි නා නා ප්‍රකාර පිළිමයන් තබති. මිනිවල අබියස වැඳුම් පිදුම් කිරීම සහ පිළිම තැබීම යන දෙවැදෑරුම් පාපයන් ඔවුන් විසින් සිදුකෙරෙති."

ආයිෂා තුමිය සහ උම්මු සල්මා තුමිය උපුටා දක්වමින් සහී දෙකෙහිම මෙසේ සඳහන් වේ :මුහම්මද් නබි(සල්)වහන්සේ එක් අවස්ථාවක ගිලන්වී හුස්ම ගැනීමට පවා අපහසු අන්දමින් කළු රෙද්දකින් මුහුන වසාගෙන සිටියහ. අනතුරුව එම රෙද්ද ඉවතලා මෙසේ ප්‍රකාශ කළහ. "තම අනාගත වක්තෘන් වහන්සේලා මිහිදන් කළ ස්ථාන නැමදුම් ස්ථාන බවට හරවා ගත් යුදෙව් හා ක්‍රිස්තියානි ආගමිකයින්ට ශාපවේවා! ඔවුන් අනුකරණය නොකරවු." උන් වහන්සේ මිහිදන් කරනු ලැබූ මිනිවල පොළවේ මට්ටමට වඩා උස් කරනු නොලැබුවේ එය දේවස්ථානයක් වශයෙන් සැලකීම වළක්වාලීම සඳහා යයි එම හදීසයෙහි සඳහන්වේ.

මුහම්මද් නබි (සල්) වහන්සේ අපවත් වීමට දින පහකට පෙරාතුව මෙසේ වදාරනු තමන්ට ඇසුනු බව ජුන්දුබ් ඉබ්න් අබ්දුල්ලාහ් වාර්තා කළේ යයි මුස්ලිම්හි සඳහන්වේ. ඔබලා අතුරින් කිසිවෙකු මගේ විශේෂ සමීප මිතුරා (ඛලීල්) වශයෙන් මගේ ඇසුරට නොගත් බව මම අල්ලාහ් මගේ සාක්ෂිකරු වශයෙන් ගනිමින් ප්‍රකාශ කරමි. අල්ලාහ් මා ඔහුගේ ඛලීල් වශයෙන් සලකන්නේය. ඉබ්රාහිම් ද ඔහු විසින් සලකනු ලබන්නේ ඒ අයුරින්ය. මා මගේ ඛලීල් වශයෙන් යමෙකු සලකන්නේ නම හෙතෙම අබූ බකර් විය යුතුය. ඔබලාගේ පෙර පැවතියවුන් සිය අනාගත වක්තෘාන් වහන්සේලා මිහිදන් කරනු ලැබූ ස්ථාන සිද්ධස්ථාන වශයෙන් සැලකූහ. එය අනුගමනය කිරීම මම ඔබලාට තහනම් කරමි.

මේ අනුව බලන විට නබි (සල්) වහන්සේ එම ක්‍රියා පිළිවෙත තහනම් කොට එය අනුගමනය කරන්නවුන් හෙලා දැක්කේය. එමනිසා මිනීවලක් තිබෙන ස්ථානයක දේවස්ථානයක් ඉදිකර නොතිබුනද එහි සලාත් ඉටුකිරීම වැරදි සහගතය."එය දේවස්ථානයක් ලෙස සැලකිම වැලැක්වීම සඳහාය" යන ප්‍රකාශයේ අර්ථය එයයි. නබි (සල්) වහන්සේගේ මිනීවල වටා දේවස්ථානයක් ඉටුකිරීම ශ්‍රාවකියින්ගෙන් බලාපොරොත්තු නොවීය. සලාතය ඉටු කිරීමට බලාපොරොත්තු වන ස්ථානයක් හෝ සලාතය ඉටු කරනු ලබන ස්ථානයක් මස්ජිදයක්වේ. මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාලහ :"මට මුළු පොලෝ තලයම සලාතය ඉටු කිරීම සඳහා පවිත්‍රවූ ස්ථානයක් වන මස්ජිදයකි"

නබි (සල්) වහන්සේ හදීසයක් උපුටා දක්වමින් අහමදී මෙසේ වාර්තා කරයි : ඉතාමත් අයහපත් පුද්ගලයින්ද එමෙන්ම මිනීවලවල් සිද්ධස්ථාන වශයෙන්ද උපයෝගිකරගන්නා අයද අවසාන මොහොතේ උදාව දකිනු ඇත.

## ඉස්මතුවන කරුණු

1. දැහැමි පුද්ගලයෙකුගේ මිනීවල අබියස, සද්භාවයෙන් යුතුව, අල්ලාහ් නැමදීම සඳහා මස්ජිදයක් ඉදිකරන තැනැත්තෙකු පිළිබඳව නබි (සල්) වහන්සේ කළ ප්‍රකාශය.

2. පිලිරූ, පිළිම පිලිබඳ තහනම, එම වරදෙහි බරපතලකම.

3. අවධාරණයෙන් යමක් සඳහන් කිරීමේදී නබි (සල්) වහන්සේ දැක්වූ ප්‍රඥාව : ප්‍රථමයෙන්ම පව් සිදුවන්නේ කෙසේදැයි පෙන්වීම. අනතුරුව, අපවත්වීමට දින පහකට පෙරාතුව තහනම නැවත ගෙනහැර දැක්වීම. පසුව කරනු ලැබූ ප්‍රකාශවලින් පෙරදී තත් ස්ථාවරය තහවුරු කිරීම

4. තමන් වහන්සේගේ මිනීවල බිහිවීමට පෙරාතුව එය එවන් කටයුත්තක් සඳහා පාවිච්චි කිරීම.

5. යුදෙව්වන් සහ කිතු බැතිමතුන් විසින් සිය අනාගත වක්තෘන් වහන්සේලාගේ මිනීවලවල් සම්බන්ධයෙන් අනුගමනය කළ සම්ප්‍රදාය මෙය බව.

6. එම පිලිවෙත හෙලාදැකීම.

7. උන්වහන්සේ එයින් බලාපොරොත්තු වූයේ තමන් වහන්සේගේ මිනීවලද එවන් පුද පූජා විධි සඳහා උපයෝගී කිරීමට විරුද්ධ අවවාද කිරීමයි.

8. උන්වහන්සේ ගේ මිනීවලද පොලොවේ මට්ටමට වඩා උස් නොකිරීමට හේතුව.

9. මිනීවලක් මස්ජිදයක් වශයෙන් පාවිච්චි කිරීමෙන් පැන නඟින ප්‍රශ්න.

10. මෙම පිලිවෙත් අනුගමනය කරන්නවුන්, අවසාන මොහොත දකින්නාවූ අයවලුන් සමඟ සම්බන්ධකර දැක්වීම. ෂිර්කයක් ඇතිවීමට පෙරාතුව එය හඳුනා ගැනීම.

11. අපවත්වීමට දින පහකට පෙරාතුව කළ කථාවේදී ඉතාමත් අයහපත් කණ්ඩායම් දෙක හෙළාදැකීම

12. මුහම්මද් නබී (සල්) වහන්සේ මුහුණ දුන් මරණ මංචක වේදනාව.

13. ශ්‍රාවකයින් සමඟ තිබූ හිතවත්කම.

14. මිත්‍රත්වය ප්‍රේමයට වඩා ඉහල බව පැහැදිලි කිරීම.

15. අබූ බකර් අල් සිද්දික් තමාගේ හිතවත්ම මිතුරා බව කියා සිටීම.

16. ඔහු තමාගේ ඇවෑමෙන් කලීෆාධූරයට පත්වන බව ඇඟවීම.

## 21 වන පරිච්ඡේදය

### මුනිවරයින්ගේ මිනිවලවල්වලට අධික ලෙසින් භක්ති ප්‍රණාමය කිරීම තුළින් ඔවුන් වැදුම් පිදුම් ලබන දෙවිදේවතාවුන් බවට පරිවර්තනය වෙති.

මුහම්මද් නබි (සල්) එතුමාණන් මෙසේ වදාළ බව මාලික් තුමා වාර්තා කරයි: "මගේ ස්වාමින්ද්‍රයාණෙනි, මගේ මිනිවල වැඳුම් පිදුම්වලට භාජනය වන ස්ථානයක් නොවේවා." මුනිවරයින්ගේ මිනිවලවල් සිද්ධස්ථාන වශයෙන් පාවිච්චි කරන අයවලුන් අල්ලාහ්ගේ උදහසට පත්වෙති.

සුෆ්යාන්, මන්සූර් සහ මුජාහිද් උපුටා දක්වන ඉබ්න් ජරීර් "ලාත් සහ අල් උස්සා [1] යන පාඨය ගෙනහැර දක්වයි.

මුහම්මද් නබි (සල්) එතුමාණන් විසින් මිනිවලවල් කරා යන කාන්තාවන්ද මිනිවලවල් වටා සිද්ධස්ථාන ඉදිකොට ඒවා ආලෝකමත් කරන පිරිමින්ද හෙලා දැක ඇතැයි ඉබ්න් අබ්බාස් (රලි) තුමා වාර්තා කරයි.

### ඉස්මතුවන කරුණු

1. පිලිම පිළිබඳ පැහැදිලි කිරීම.

2. පිලිම වන්දනය පිළිබඳ පැහැදිලි කිරීම.

3. ආසන්නතම ආපදාවකදී හැර නබි (සල්) වහන්සේ අල්ලාහ්ගේ පිහිට නොපැතීම.

4. මිනිවලවල් මස්ජිදයන් වශයෙන් සැලකීම ආසන්නතම ආපදාවක් වශයෙන් ගණන් ගැනීම.

5. අල්ලාහ්තආලාගේ උදහස.

6. ඉස්ලාම් පූර්ව යුගයෙහි වැදුම් පිදුම් වලට භාජනයවූ "අල්ලාහ්" නම් මහා පිළිමය.

7. එය ආරම්භ වූයේ දැහැමි පුද්ගලයෙකුගේ මිනිවලට වැදුම් පිදුම් කිරීමෙන් බව.

8. ‘ලාත්’ යන්න එම ස්ථානයෙහි මිහිදන් කරනු ලැබූ පුද්ගලයාගේ නම බව.

9. එම නාම භාවිතා කිරීමේ හේතුව.

10. මිනිවලවල්වලට උඩින් ආලෝක දැල්වීම හෙළාදැකීම.

### පා සටහන්

[1] අල්කුර් ආන් 53:19

## 22 වන පරිච්ඡේදය

## නබි (සල්) වහන්සේ විසින් තව්හිදය සුරැකීම සහ ෂිර්කය කරා ඇති මාර්ගයන් වැසීම

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටි: "තොප අතුරින්ම රසූල්වරයෙක් දැන් තොප වෙතට පැමිණ ඇත. තොප විනාශ මුඛයට යැම ගැන ඔහු කනස්සල්ලට පත්වන්නේය.[1]

මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාල බව අබූ හුරෙයිරා (රලි) තුමා වාර්තා කරයි: ඔබලාගේ නිවෙස් තුළ මිනීවලවල් නොතනනු. කිසිදු මිනීවලක් උත්සව පවත්වන ස්ථානයක් නොකරනු. මා වෙනුවෙන් අල්ලාහ්ට ප්‍රාර්ථනා කරනු. ඔබේ ප්‍රාර්ථනාවන් කවර ස්ථානයක සිට කරනු ලැබුවත් ඒවා මට ළඟාවේ." අබූ දාවුද් විසින්ද මෙම හදීසය ස්ථිර මූලාශ්‍රයක් සහිතව වාර්තා කර ඇත.

අල් මුක්තාරාහි වාර්තාවන අන්දමට දිනක් එක් මිනිසෙක් මුහම්මද් නබි (සල්) වහන්සේ මිහිදන් කොට ඇති ස්ථානයකට පැමිණ එහි මුල්ලක සිට නැමදුම ඉටුකරනු දුටු අලි ඉබ්න් හුසෙයින් (රලි) තුමා එම පුද්ගලයාට දෝෂාරෝපණය කරමින් මගේ සීයා විසින් මගේ පියාට දන්වා සිටි හදීසයක් ඔබ නොදන්නේදැයි අසමින් මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාරා සිටි බව ඔහුට පවසා ඇත. "මා මිහිදන් කළ ස්ථානය උත්සව පවත්වනු ලබන ස්ථානයක් කර නොගනු. ඔබලාගේ

නිවෙස් තුළ මිනීවළවල් නොතනනු. ඔබ කවර ස්ථානයක සිට මට ශුභ පැතුම් කළත් ඒවා මට ළඟා වේ!

## ඉස්මතුවන කරුණු

1. සුරා තවීබාවෙහි අඩංගු පාඨයේ [2] පැහැදිලි කිරීම.

2. මුහම්මද් නබි (සල්) වහන්සේ විසින් සිය උම්මාව මෙම අනතුරින් ඈත් කිරීම.

3. අප කෙරෙහි උන්වහන්සේගේ ඇති තැකීම, අනුකම්පාව සහ ආදරය.

4. උන්වහන්සේ මිහිදන් කොට ඇති ස්ථානයට යෑම උසස්වූ ක්‍රියාවක් වුවද තවීහිද උල්ලංඝනය වන ආකාරයේ නැමදුම් තහනම් කිරීම.

5. නිතර නිතර මිනීවළවල් කරා යාම තහනම් කිරීම.

6. අතිරේක නැමදුම් නිවසෙහි ඉටු කරන ලෙස උන්වහන්සේ විසින් කර තිබෙන නිර්දේශය.

7. ශ්‍රාවකයින් විසින් කිසිවිටෙක සිය නැමදුම් මිනී පිට්යක නොකළ යුතු බව.

8. ඕනෑම දුරබැහැර ස්ථානයක සිට කරනු ලැබුවද අල්ලාහ්ට

කරනු ලබන සුභාශිංසන අපේක්ෂිත ස්ථානයට ළඟාවන බව. එබැවින් සමීප ස්ථානයක සිට එය කිරීමේ අවශ්‍යතාවයක් නැත.

9. උන්වහන්සේ අල් බර්සාක්හි (මියගිය අයගේ ආත්මයන් විනිශ්චය දින තෙක් රැඳී සිටින ස්ථානය) සිටින බවත් අනුගාමිකයින්ගේ ප්‍රාර්ථනා සහ සුභාශිංසන එහිදී උන්වහන්සේ වෙත පිළිගන්වනු ලබන බවත්.

### පා සටහන්

[1] අල්කුර්ආන් 9:128

[2] අල්කුර්ආන් 9:18

# 23 වන පරිච්ඡේදය

## උම්මාවේ ඇතැම් සාමාජිකයින් විසින් පිළිමවලට වැඳුම් පිදුම් කරන බව.

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: පුස්තකයෙන් කොටසක් දෙනු ලැබූ අය ගැන ඔබ මෙනෙහි නොකළෙහිද? පිළිරූ ගැනද අන විත භූතියම් ගැනද ඔව්හු විශ්වාස කරන්නෝය... අල්ලාහ් විසින් පමුණුවනු ලැබූ දඬුවම අතින් බලන විට එයට වඩා නරක අය තොපට පෙන්වන්නද? අල්ලාහ් හැර අන්දැය ඇදහූ අය අල්ලාහ් විසින් ශාප කරනු ලැබ අල්ලාහ්ගේ උදහසට භාජනයවී වඳුරන්ද, ඌකරයන්ද බවට පත්වූහ.... ඔවුන් පෙළඹවනු ලැබූ අය "ඔවුන් මත ගොඩනැගිල්ලක් ගොඩනංවමු." යි කීවෝය.[1]

මුහම්මද් නබි (සල්) වහන්සේ වදාල බව අබූ සයිද් (රලි) තුමා වාර්තා කරයි: ඔබලාගේ දෘෂ්ටිය කෙතරම් අන්ධයත්ද ඔබලා ඇත්ත වශයෙන්ම පියවරෙන් පියවර, විටින් විට ඔබලාගේ පෙර පැවතියවුන්ගේ මාර්ගයේ ගමන් කරනු ඇත. එවිට ශ්‍රාවකයින් "අල්ලාහ්ගේ දූතයාණෙනි! ඔබ වහන්සේ වදාරා සිටින්නේ අප යුදෙව්වන් සහ කිතු බැතියන් ගිය මාර්ගයේ ගමන් කරනු ඇතැ" යි කියාද යනුවෙන් විමසූහ. "ඔවුන් විනා අන් කවරෙකුගේ මාර්ගයේදැ" යි උන්වහන්සේ ප්‍රති ප්‍රශ්නයක් නැඟූහ. තබ්වාන් (රලි) තුමාගේ කියමනක් උපුටා දක්වමින් මුස්ලිම් මෙසේ වාර්තා කරයි: මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාළහ: "අල්ලාහ්තආලා මට පෘථිවිය - එහි පෙරදිග

හා අපරදිග - පෙන්වූහ. මගේ උම්මාව පොළෝ තලයෙහි මා දුටු කොටස පුරා පැතිරී ගොස් එය අයිතිකර ගනු ලබන බවත් සුදු සහ රතු සම්පත් (බයිසන්තීනු සහ පර්සියානු අධිරාජ්‍යයන්) මට හිමිවන බවත් දැනුම් දුන්හ. මගේ උම්මාව මහා ව්‍යසනයක් මගින් විනාශයට පත්වීමට ඉඩ නොදෙන ලෙසත්, ප්‍රධාන නගරය සහ නායකත්වය බිඳ හෙලන්නාවූ සතුරු කණ්ඩායමක් මගින් මගේ උම්මාව පරාජයට පත් කිරීමට ඉඩ නොතබන ලෙසත් මම මගේ ස්වාමින්ද්‍රයාණන්ගෙන් ඇයද සිටියෙමි එවිට අල්ලාහ්තආලා "මුහම්මද්! මගේ තීරණය වෙනස් වන සුළු නොවේ. ඔබේ උම්මාව මහා ව්‍යසනයක් මගින් එකවරම විනාශ නොවන බවටත්, ප්‍රධාන නගරය සහ නායකත්වය බිඳ හෙළන්නාවූ සතුරු කණ්ඩායමක් මගින් ඔබේ උම්මාව (ලොවේ සෑම රටක්ම එකතුවී සටන් කළත්) පරාජයට පත් නොවිය යුතු බවටත් මම ආඥාකොට ඇත්තෙමි." එහෙත් ඔබේ උම්මාවෙන් එක් කණ්ඩායමක් සෙසු කණ්ඩායම් පරාජය කරනු ඇත. යනුවෙන් පිළිතුරු දුන්සේක. මෙම හදීසය සහීහ් වාර්තා කරන අල් බර්කානී එයට තවත් කොටසක් එක් කරයි! මගේ උම්මාව ගැන මට තිබෙන බිය නම් නොමග ගිය නායකත්වයට ඔවුන් භාජනයවීමයි. ඔවුන් එම අසිපතට යටත් වුවහොත් නැවත පණ ගන්වා නැගිට්ටවනු ලබන දිනය තෙක් එම කඩුව ඉහළට ඔසවනු නොලැබේ. මගේ උම්මාවෙන් එක් කොටසක් විශ්වාස නොකරන්නවුන් බවට පත්වී පිළිම වන්දනා කරන්නවුන් බවට පත්වන තෙක් එම දිනය උදා නොවනු ඇත. මට ඔවුන් ගැන තිබෙන බිය නම් ඔවුන් අතුරින් ව්‍යාජ අනාගත වක්තෘන් තිස් දෙනෙක් බිහිවීමයි. ඔවුන් සියළුදෙනාම බොරුකාරයන්ය. අවසාන අනාගත වක්තෘවරයෙකු පහළ නොවේ. එහෙත් මගේ

උම්මාවෙන් කොටසක් සෙසු අයගේ නරක ආදර්ශයට හසුනොවී අල්ලාහ්ගේ පිහිට ලැබෙනතෙක් ජහග්‍රාහීව සිටිනු ඇත.

## ඉස්මතුවන කරුණු.

1. සූරා අන්-නිසාහි[2] ඇති පාඨයේ පැහැදිලි කිරීම

2. සූරා අල්-මායිදාහි[3] ඇති පාඨයේ පැහැදිලි කිරීම.

3. සූරා අල්-කහෆ්හි[4] ඇති පාඨයේ පැහැදිලි කිරීම.

4. අල් ජිබ්ත් සහ අල් තාගූත් (භූත විද්‍යාව සහ පිළිම වන්දනය) පිළිබඳ ප්‍රශ්නය. එය හදවතේ ඇතිවන විශ්වාසය පිළිබඳ ප්‍රශ්නයක්ද? එහි සාවද්‍යතාවය පිළිබඳ ඒකාන්ත විශ්වාසයකින් යුක්තව එය පිළිකුල් කරන අතරම එය අනුගමනය කරන්නවුන් පිළිගැනීමක්ද?

5. විශ්වාස නොකිරීම සම්බන්ධයෙන් දැනුමක් ඇති විශ්වාස නොකරන්නවුන්, විශ්වාස කරන අයවළුන්ට වඩා යහමඟ කරා යොමු කරනු ලැබ ඇති බවක් පැවැසීම.

6. උම්මාවේ කොටස් නොමඟ යනු ඇති බවට අබූ සහිද් විසින් උපුටා දක්වනු ලැබ නොයෙක් අවස්ථාවන්හිදී ජනතාව වෙත පැහැදිලි කරනු ලැබ ඇති හදීසයේ අර්ථය.

7. මෙම උම්මාව පිළිමවලට වැඳුම් පිදුම් කරනු ඇතැයි මුහම්මද් නබි (සල්) වහන්සේ විසින් පළ කළ පැහැදිලි අනාවැකිය.

8. තමාද අනාගත වක්තෘ කෙනෙක් යයි කියා ගනිමින් අල් මුද්‍ාතාර් ඉදිරිපත්වීම. තමාද මෙම උම්මාවට අයත් බව කියමින් ඔහුද මුහම්මද් නබි (සල්) වහන්සේ සහ අල්කුර්ආනය සත්‍යයයි පිළිගැනීම. මුහම්මද් සහ නබි (සල්) වහන්සේ අවසාන අනාගත වක්තෘන් වහන්සේ යයි අල්කුර්ආනය ස්ථිරවම ප්‍රකාශකර තිබීම අමතක නොකළ යුතුය. මෙවන් පරස්පර විරෝධතාවයක් තිබියදීත් එවන් ව්‍යාජ අනාගත වක්තෘවරයෙකු කෙරෙහි ඇතැම් අය විශ්වාසය තැබීම පුදුමයට කරුණකි. ශ්‍රාවකයින්ගේ ජීවිත කාලය අවසානයේදී ඉදිරිපත්වූ ව්‍යාජ අනාගත වක්තෘවරයෙකු වන අල් මුක්තාර් අති විශාල ජනතාවක් විසින් විශ්වාස කරන ලදි.

9. සත්‍ය පොලෝ තලයෙන් අතුරුදන් නොවන බවටත් ඉන් කොටසක් හෝ ඉතිරිවන බවටත් වූ සුභාරංචිය.

10. ඉතිරිවන සුළු කොටස බාධකයන් අභිබවනය කරන බවට දී ඇති ප්‍රතිඥාව.

11. මෙම තත්වය අවසාන මොහොත දක්වාම වලංගුව පවත්නා බව.

12. අල්ලාහ්තආලා විසින් මුහම්මද් නබි (සල්) වහන්සේට පොලෝතලය - එහි පෙරදිග හා අපරදිග පෙන්වීම. ඒ අනුව උම්මාවද උතුරු හා දකුණු ලොවෙහි නොව පෙරදිග හා අපරදිග ලොවෙහි ව්‍යාප්තවීම. උම්මාව වෙනුවෙන් නබි (සල්) වහන්සේ විසින් කරනු ලැබූ ප්‍රාර්ථනා දෙක ඉටු කිරීම. නොමඟ ගිය නායකයින් හා ව්‍යාජ අනාගත වක්තෘන් ගැන උන්වහන්සේගේ සිත් තුළ ඇතිවූ බිය හා උම්මාවේ කොටසක් ජය අත් කර ගැනීම සම්බන්ධයෙන් කළ අනාවැකිය. මෙම පුදුම සහගත සිද්ධීන් සියල්ලක්ම උන්වහන්සේ ප්‍රකාශ කළ අකාරයටම සිදුවී තිබීම.

13. උම්මමාවට මුහුණදීමට සිදුවන අවදානම් සහිත තත්ත්වය නොමඟ ගිය නායකයින්ට සීමා කිරීම.

14. පිලිමවලට වැදුම් පිදුම් කිරීම යන්නෙහි අර්ථය අවධාරණය කිරීම.

### පා සටහන්

(1) අල්කුර්ආන් 4:51, 5:60, 18:21
(2) අල්කුර්ආන් 4:51
(3) අල්කුර්ආන් 5:60
(4) අල්කුර්ආන් 18:21

# 24 වන පරිච්ඡේදය

## අන වින හූනියම්

"අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී; අන වින හූනියම් කරන ඔවුන් තමන්ට පරලොවෙහි භාග්‍ය හිමි නොවන බව ස්ථිරවම දනිති. .... පිළිරූ ගැනද (අල් තාගූත්) අන වින හූනියම් ගැනද ඔවුහු විශ්වාස කරන්නෝය."[1]

අල් ජිබ්ත් යනුවෙන් හැඳින්වෙන අන වින හූනියම් යනාදිය යයිද උමර් ප්‍රකාශ කළේය. ජාබිර්ගේ ප්‍රකාශය අනුව අල් තවාගිත් (තාගූත්හි බහුවචනය) යනුවෙන් හැඳින්වන්නේ සාතන්ගේ ආභාෂය ලත් පූජනකවරුන්ය. මහා පාපයන් හතෙන් මිදී සිටින ලෙස මුහම්මද් නබි (සල්) වහන්සේ අනුශාසනා කළ බව අබූ හුරෙයිරා (රලි) තුමා වාර්තා කරයි. මහා පාපයන් හත කවරේදැයි ප්‍රශ්න කරන ලදුව උන්වහන්සේ ඒවා "ෂිර්ක්, අන වින හූනියම්, මිනීමැරීම (නීතිය ප්‍රකාරව හැර) පොලී ගැනීම, අනාථයින්ගේ දේපොල සොරා ගැනීම, යුද්ධ දිනයේදී එයින් පලායාම සහ "ආරක්ෂිත" කාන්තාවකට විරුද්ධව අභූත චෝදනා නැඟීම" වශයෙන් ගෙනහැර දැක්වූ සේක. තිර්මිදි විසින් උපුටා දක්වන ජුන්දුබ්ගේ හදීසයක් අනුව අන වින හූනියම් සම්බන්ධයෙන් දිය යුතු දඬුවම මරණීය දණ්ඩනය වේ.

අල් බුහාරිගේ සහිහි වාර්තා කර ඇති බජාලා ඉබ්න් අබාදාගේ හදීසයක් අනුව අන වින ගුනියම් කරන සෑම තැනැත්තෙක් හා තැනැත්තියක්ම මරා දමන ලෙසට උමර් ඉබ්න් අල් කත්තාබ් (රලි) තුමා විසින් නියෝග කොට ඇත. එම නියෝගය ප්‍රකාර අන වින ගුනියම් කළ ස්ත්‍රීන් තිදෙනෙක් තම කණ්ඩායම විසින් මරා දමනු ලැබූ බව බජාලා වැඩිදුරටත් පවසයි. තමාට හානි කිරීම සඳහා ගුනියමක් කිරීමට තැත් කළ අයෙකු මරා දැමීමට හෆ්සා (රලි) තුමිය නියෝග කළ බව සනාථ වන සාක්ෂි ඇත. ජුන්දුබ්ද එය සනාථ කරයි. ඊට අමතරව අහ්මද්ගේ වාර්තාවක් අනුව නබි (සල්) වහන්සේගේ ශ්‍රාවකයින් තිදෙනෙක්ද මෙය සනාථ කොට ඇත.

**ඉස්මතුවන කරුණු**

1. සූරා "අල් බකාරා" හි දැක්වෙන පාඨයේ[2] පැහැදිලි කිරීම.

2. සූරා "අන්-නිසා" හි දැක්වෙන පාඨයේ[3] පැහැදිලි කිරීම.

3. අල් ජිබ්ත් (අන වින ගුනියම්) සහ අල් තාගුත් (පිලිමවලට වැදුම් පිදුම් කිරීම) සම්බන්ධයෙන් කරනු ලබන පැහැදිලි කිරීම සහ ඒවායේ වෙනස දැක්වීම.

4. අල් තාගුත් ජින් කෙනෙකු හෝ මනුෂ්‍යයෙකු විය හැකි බව.

5. විශේෂයෙන් තහනම් කරනු ලැබ ඇති මහා පාපයන් හත.

6. අන වින හූනියම්වල නිරත වන්නාවූ පුද්ගලයා විශ්වාස නොකරන්නාවූ පුද්ගලයෙක් බව.

7. ක්ෂමාව ඉල්ලනු ලැබ සමාව දීමට වඩා ඔහුට මරණීය දණ්ඩනය පැමිනවීම සුදුසු බව.

8. උමර්ගේ කාලයේදී මෙන්ම වර්තමානයෙහිද එවැනි කටයුතු සිදුවන බව.

### පා සටහන්

(1) අල්කුර්ආන් 2:102, 4:51
(2) අල්කුර්ආන් 2:102
(3) " 4:51

# 25 වන පරිච්ඡේදය

## භූත විධික්‍රම

"අල් ඉයාෆා (පක්ෂියෙකු පියාසර කරවා එම පක්ෂියා පියාසර කරන ආකාරය හා දිශාව අනුව නිමිති කිම),"අල් තාර්ක්" (වැලි පොලොවේ රේඛා ඇඳ වැලි ඇට ඇත් මෑත් වන රටාව අනුව නිමිත කිම), සහ "අල් තියාරා" (ස්වභාවධර්මයාගේ වෙනස්වීම් අනුව ශුභ එල හා අශුභ එල වශයෙන් නිමිති කිම) ආදි සියල්ලක්ම භූත විධි ක්‍රම වශයෙන් මුහම්මද් නබි (සල්) වහන්සේ විසින් හඳුන්වා ඇතැයි හදිසයන් කීපයක්ම ආශ්‍රිතව අහමඩ් වාර්තා කරයි.

"අල් ජිබ්ත්" යන්න සාතන්ගේ කටහඬට සවන්දීම යයි අල් හසන් වාර්තා කරයි. මෙම අර්ථ නිරූපනය අබූ දාවූද්, අල් කසායි සහ ඉබ්න් හිබාන් යන තිදෙනාම ඔවුන්ගේ හදිස් එකතුව මගින් සනාථ කරති.

"තාරකා අනුව යමෙක් පෙර නිමිති දක්වන්නේ නම් හෙතෙම භූත විධික්‍රම තුරුළු කරගත් අයෙක් වේ." යයි මුහම්මද් නබි (සල්) වහන්සේ වදාල බව ඉබ්න් අබ්බාස් (රලි) තුමාගේ හදිසයක් උපුටා දක්වමින් අබූ දාවූද් සිය සහිහි වාර්තා කරයි.

"යමෙක් ගැටයක් ගසා එයට පිඹින්නේ නම් එමගින් භූත

විද්‍යාව තුරුළු කරගෙන ෂිර්කය් සිදුකරයි." එමෙන්ම "යන්තරයක් හෝ සුරයක් පළඳින තැනැත්තා එහි (ශූන්‍ය හා හිස්වූ) බලපෑමට යටත්වේ." යනුවෙන් වූ අබූ හුරෙයිරාගේ හදීසයක් අල් නසායි වාර්තා කරයි.

"අල් ආද්" යන්නෙහි සරල අර්ථය බොරු කීමයි. එනම් භූත විධික ක්‍රම මගින් අසත්‍යවූ අනාවැකි පලකොට එමගින් මිනිසුන් අතරේ භේද ඇති කිරීම හා වෛරය වැපිරීමයි - යනුවෙන් මුහම්මද් නබි (සල්) වහන්සේ වදාල බව ඉබ්න් මසූද්ගේ හදීසයක් උපුටා දක්වන මුස්ලිම් වාර්තා කරයි.

"ආකර්ශනීය හා රිද්මයානුකූලවූ සාහිත්‍ය වැකි ද භූත විධි ක්‍රමයක් වේ." යනුවෙන් මුහම්මද් නබි (සල් වහන්සේ වදාල බව ඉබ්න් උමර් (රලි) තුමාගේ හදීසයක් උපුටා දක්වමින් "සහී" ලේඛකයන් දෙදෙනාම වාර්තා කරති.

## ඉස්මතුවන කරුණු

1. ඉහත දැක්වූ නිමිති කීමේ ක්‍රම තුනම භූත විධික්‍රමය යන්න.

2. නිමිති ක්‍රම තුන සම්බන්ධයෙන් කර ඇති පැහැදිලි කිරීම.

3. ජ්‍යොතිශාස්ත්‍රය භූත විද්‍යාවක් බව.

4. ගැට ගසා එයට මැතිරීම ද භූත විද්‍යාවක් බව.

5. ගුත ශාස්ත්‍රය අනුව බොරු කතා ගොතා අයහපත් චේතනාවෙන් යුක්තව ඒවා පැතිරවීම.

6. එක් ආකාරයක විද්‍යානුකූල සාහිත්‍යයද ගුත විද්‍යාවක් බව.

## 26 වන පරිච්ඡේදය

### පේන කියන්නන්

මුහම්මද් නබි (සල්) වහන්සේගේ භාර්යාවන් කිහිප දෙනෙකුගේ හදීසයන් උපුටා දක්වමින් මුස්ලිම්, සිය සහීහි උන්වහන්සේ මෙසේ වදාල බව වාර්තා කරයි: පේන කියන්නෙකු වෙත ගොස් යමෙක් ඔහු කියන දෙය විශ්වාස කරන්නෙහි නම් ඉන්පසුව ඇති දින හතලිහ තුලදී ඔහු විසින් ඉටු කරනු ලබන නැමදුම ප්‍රතික්ෂේප කරනු ලබයි. අබු හුරෙයිරා තුමාගේ හදීසයක් සිය සහීහි වාර්තා කරන අබු දාවුද්, මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාල බව දන්වා සිටී: ”යමෙක් පේන කියන්නෙකු වෙත ගොස් ඔහු කියන දෙන විශ්වාස කරන්නේ නම් එමගින් පූජනීයත්වය කෙලෙසනු ලැබීමෙන් හෝ මුහම්මද් වෙත පහල කරනු ලැබූ දෙය ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.”

අබු හුරෙයිරාගේ මෙම හදීසය අල් හකීම් විසින් ද සහී වාර්තා කරුවන් සිවුදෙනා විසින් ද තහවුරු කරනු ලැබ ඇත.

මුහම්මද් නබි (සල්) වහන්සේ විසින් මෙසේ වදාල බව ඉම්රාන් ඉබ්ක් හුසෙයින් වාර්තා කරයි: ”තමන්ට ඉදිරියේදී සිදුවිය හැකි යහපතක් හෝ අයහපතක් නිමිති කියන්නෙක් මගින් දැනගත හැකිවේ යයි යමෙක් සිතන්නේ නම් ඔහු අපේ අයෙකු නොවේ.”

ජේන කියෙන්නෙකු යනුවෙන් හැඳින්වෙන්නේ සොර ගනු ලැබූ භාණ්ඩ, නැතිවූ සතෙක්, සහ එවැනි දේවල් පිළිබඳව ශාස්ත්‍ර කියන තැනැත්තාටය" යනුවෙන් අල් බගවී ප්‍රකාශ කරයි. සාත්තර කියන හා තරු දෙස බලා ජේන කියන අයවළුන් ගැන සඳහන් කරන ඉබ්න් අබ්බාස් "එසේ කරන අයවළුන්ට දේවාශිර්වාදය හිමි නොවේවා." යයි ප්‍රකාශ කරයි:

## ඉස්මතුවන කරුණු

1. මිථ්‍යා විශ්වාසය සහ ඊමානය යන දෙකම එකම තැනැත්තෙකු තුළ තිබිය නොහැකිය.

2. ජේන කීම විශ්වාස නොකිරීමකි.

3. ජේන ගැන විශ්වාසය තැබීම.

4. ජේන කියවනු ලබන අය හෙළාදැක තිබීම.

5. විජ්ජාවලට ඇබ්බැහිවූවන් හෙලාදැක තිබීම.

6. "අබූ ජාද්" ගේ ශිල්පය හදාරනු ලබන අය හෙලා දැක තිබීම.

## 27 වන පරිච්ඡේදය
## 'නුෂ්රා'
## (හූනියම් බන්ධන ආදිය ඉවත් කිරීම.)

පිබ්ර්ගේ හදිසයක් උපුටා දක්වමින් අබූ දාවුද්ද අහමඩ්ද නබි (සල්) වහන්සේගෙන් අල් නුරා හෙවත් හූනියම් බන්ධන ආදිය ඉවත් කිරීම සම්බන්ධයෙන් විමසූවිට "එය සාතන්ගේ වැඩ වලින් කොටසකි." යයි පිළිතුරු දුන් බව වාර්තා කරති. අහමඩ්ගෙන් මේ ගැන විමසූවිට ඉබ්න් මසූද් ඒවා සියල්ලක්ම පිළිකුල් කරන බව පවසා ඇත.

කතාදාහ්ගේ ප්‍රශ්නයක් අල් බුහාරි විසින් මෙසේ වාර්තා කරයි. "හූනියමක් නැත්නම් බන්ධනයක් හේතුකොටගෙන පීඩා විඳින අයෙකු සුවකර ගැනීම සඳහා නුෂ්රා ප්‍රතිකර්ම මාධ්‍යය උපයෝගිකර ගැනීම සුදුසු දැයි මම අල් මුසයියිබ්ගෙන් ඇසුවෙමි." යහපත් ක්‍රියාවක් සඳහා පමණක් නම් එහි වරදක් නැතැයි ද යහපත් දෙයක් කිරීම මුහම්මද් නබි (සල්) වහන්සේ විසින් තහනම් කර නැතැයි ද ඔහු පිළිතුරු දුන්නේය. අල් හසන් පවසන අන්දමට "එක් කට්ටඩියෙකුගේ බන්ධනයක් ඉවත්කළ හැක්කේ තවත් කට්ටඩියෙකුටය."

ඉබ්න් අල් කයියිම් පවසන අන්දමට අල් නුෂ්රා යන්න හූනියම් බන්ධන ආදිය ඉවත් කිරීමයි. එය දෙවැදෑරුම්ය. පළමුවැන්න නම් ප්‍රති හූනියමක් කිරීම මගින් පවත්නා හූනියම කැපීමයි. එය සාතන්ගේ වැඩක් වන බැවින් තහනම් කරනු ලැබ

ඇති ක්‍රියාවකි. අල් හසන්ගේ විස්තරය මෙයට ගැලපේ. එනම්: හූනියම් කරනු ලැබ සිටින රෝගියාද එමෙන්ම හූනියම කපන කට්ටඩියාද එම හූනියම ඉවත්කර ගැනීම සඳහා සාතන්ට පුද සත්කාර කරති. දෙවැන්න නම් රුක්යා (අධ්‍යාත්මික බලයෙන් අනවින ඉවත් කිරිම) මගින් එනම් අල්කුර් ආනයේ පාඨයන් පරායනය කිරීම, ඖෂධ උපයෝගී කිරීම සහ නීත්‍යානුකූලවූ ප්‍රාර්ථනා මගින් රෝග නිවාරණකර ගැනීමයි. මෙයට අනුමැතිය ලැබී ඇත.

## ඉස්මතුවන කරුණු

1. අල් නුෂ්රා තහනම් කර තිබීම.

2. නුෂ්රාහි තහනම් කරනු ලැබ ඇත්තේ කුමක්ද? අනුමත කරනු ලැබ ඇත්තේ කුමක්ද? යන්න වෙන්කර දැක්වීම.

# 28 වන පරිච්ඡේදය

## තහය්‍යූර් හෙවත්

## අශුභ ඵල කීම

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: "ඔවුන්ගෙන් වැඩි දෙනෙක් එය නොදනිති."[1] තවදුරටත් අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: "තොපගේ නපුරැ නිමිති තොපගේ නොහොඳ ක්‍රියාවන්ගේ ප්‍රතිඵලය වේ....."[2]

අනාස්ගේ හදීසයක් උපුටා දක්වමින් සහී දෙකෙහිම මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාල බව වාර්තාවේ: අද්වා හෝ තියාරා නොව ෆාල් මම ප්‍රිය කරමි. ෆාල් යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි විමසූවිට උන්වහන්සේ "එය හොඳ වචනයයි." යනුවෙන් පිළිතුරැ දුන්හ.

උක්බා අල් අමීර්ගේ කියමනක් උපුටා දක්වන අබුදාවුද් මෙසේ වාර්තා කරයි: "එක් වතාවකදී "අල් තියාරා" (ස්වාභාවික වස්තූන් ආශ්‍රිතව අනාවැකි පලකිරීම ගැන මුහම්මද් නබි (සල්) වහන්සේ ඉදිරියෙහි සඳහන් කරනු ලැබූවිට උන්වහන්සේ "එයින් හොඳම ක්‍රමය" "අල්ෆාල්" යයි (යම් සිදුවීමකින් පසුව ඊටත් වඩා යහපත් සිදුවීමක් ඇතිවේයයි ශුභවාදී බලාපොරොත්තු තැබීම) වදාලහ." මෙය, පිලිගත් ආගමික සිද්ධාන්ත උල්ලංඝනය කිරීමක් නොවේ. යම් මුස්ලිමෙකු අහිතකර තත්වයකට මුහුණදුන් අවස්ථාවකදී "මගේ

ස්වාමීන්ද්‍රයාණෙනි! සෑම සකල යහපත් දෙයක්ම උත්පාදකයාණන් ඔබ වහන්සේය! එමෙන්ම සෑම අයහපත් තත්වයක් ඇති කරන්නේද ඔබ වහන්සේමය! සෑම බලයක් හා ශක්තියක්ම සතුව සිටින්නේ අන්කිසිවෙක් නොව ඔබ වහන්සේමය. ඔබ වහන්සේගෙන් හැර අන් කිසිවෙකුගෙන් රැකවරණය නොසැලසේ." යයි ප්‍රාර්ථනා කළ යුතුය.

ඉබ්න් මසූද්ගේ හදීසයක් උපුටා දක්වන අබූ දාවුද් මෙසේ වාර්තා කරයි: "අල් තියාරා (ස්වාභාවික වස්තූන් ආශ්‍රිතව අනාවැකි පල කිරීම) ෂිර්කයයි. අල් තියාරා ෂිර්කයයි. එය අපට පරිබාහිරවූ දෙයක්ය. (එය අප තුළ පවතින්නේ නම්) අප අල්ලාහ් කෙරෙහි දක්වන බියබැතිකම අනුව ඔහු එය ඉවත් කරයි." අල් තිරිමිදි විසින්ද මෙම හදීසය වාර්තා කර ඇත.

ඉබ්න් අමීර්ගේ හදීසයක් උපුටා දක්වන අහමඩ් මෙසේ වාර්තා කරයි: යමෙක් අල් තියාරා කෙරෙහි විශ්වාසය තබමින් සිය යෝජිත වැඩ පිළිවෙලක් වෙනස් කරන්නේද ඔහු ෂිර්කයක් සිදුකළ පුද්ගලයෙක් බවට පත්වන්නේය." එවන් පාපයකට ක්ෂමාව අයැදිය යුත්තේ කෙසේදැයි උන්වහන්සේගෙන් විමසන ලදුව නබි (සල්) වහන්සේ මෙසේ වදාලහ. "ස්වාමීන්ද්‍රයාණෙනි! ඔබ වහන්සේ විසින් පිරිනමනු ලබන යහපතක් හැර අන් කිසි යහපතක් නැත! ඔබ වහන්සේ විසින් නිර්දේශිත අයහපතක් හැර අන්කිසි අයහපතක් නැත! ඔබ වහන්සේ හැර අන්කිසි දෙවි කෙනෙක් නැත." යනුවෙන් සාක්ෂි දැරීම වේ. අල් ෆස්ල් ඉබ්න් අල් අබ්බාස් (රලි) තුමාගේ හදීසයක් උපුටා දක්වමින් අහමඩ් මෙසේ වාර්තා කරයි: යමෙක් යම් දෙයක් කිරීමට හෝ

නොකිරීමට අල්තියාරා ආශ්‍රිතව තීරණයක් ගත්තේ නම් ඔහු අල් තියාරා මත පිහිටා ක්‍රියා කිරීම සම්බන්ධයෙන් වැරදිකරුවෙකු වේ.

**ඉස්මතුවන කරුණු**

1. "ඔවුන්ගේ දුර් නිමිති අල්ලාහ්ගෙන් පහල වූයෙහිය. ".....
   යන පාඨය" තොපගේ නපුරු නිමිති තොපගේ හොඳ
   ක්‍රියාවන්ගේ ප්‍රතිඵලයවේ....." යන පාඨය සමඟ සම්බන්ධකර
   දැක්වීම.

2. අල් අද්වා ප්‍රතික්ෂේප කිරීම.

3. අල් තියාරා ප්‍රතික්ෂේප කිරීම.

4. අල් හමා ප්‍රතික්ෂේප කිරීම.

5. අල් සෆර් ප්‍රතික්ෂේප කිරීම.

6. අල්ෆාල් මේ කිසිවක අංගයක් නොවන බැවින් එයට
   අනුමැතිය ලැබී ඇති බව.

7. අල්ෆාල් පැහැදිලි කර දැක්වීම.

8. මෙම අදහස් සිය කැමැත්තට විරුද්ධව හෝ ඒවා හෙළාදකින
   අතරම යම් මුස්ලිමෙකු වෙත තිබේ නම්, එයින් ඔහුට හානියක්

සිදුනොවේ. අල්ලාහ් කෙරෙහි දක්වන්නාවූ බිය බැතිකම උඩ අල්ලාහ් ඒවා ඉවත් කරනු ලබයි.

9. මෙවන් අදහස් සිතට ඇතුල්වූ විට එයින් මිදීම සඳහා අල්ලාහ්ට ප්‍රාර්ථනා කළ යුතුය.

10. අල් තියාරා ද ෂිර්කයක් බවට ඇති ප්‍රකාශය.

11. නිමිති බැලීම හෙලා දැකිය යුතු බවට කර ඇති පැහැදිලි කිරීම.

### පා සටහන්

(1) අල්කුර්ආන් 7:131
(2) අල්කුර්ආන් 36:19

## 29 වන පරිච්ඡේදය

### ජ්‍යොතිශාස්ත්‍රය

ක්තාදාගේ කියමනක් උපුටා දක්වමින් අල් බුහාරි පිය සහිහි මෙසේ වාර්තා කරයි: ”අල්ලාහ් විසින් අරමුණු තුනක් සඳහා තාරකා මවා ඇත. එනම් ආකාශයේ ආභරණ වශයෙන්, සාතන්ට පහරදීම සඳහා සහ යාත්‍රා කරන්නවුනට මඟ පෙන්වීම සඳහා. මීට අමතරවූ දෙයක් මනකල්පිතව ආරෝපණය කිරීම සාවද්‍යය. එමෙන්ම තමන්ගේ දැනුමේ සීමා ක්ෂේත්‍රය ඉක්මවා යැමෙන් ප්‍රාඥයෙකු වශයෙන් ලබා ඇති කීර්තියද පලුදුකර ගනී. චන්ද්‍ර මණ්ඩලයේ ගමන් මාර්ගය පිළිබඳ හැදෑරීම අහමඩ් සහ ඉෂාක් විසින් අනුමත කර ඇතැයිද ඉබ්න් උයයිනා විසින් තහනම් කරනු ලැබ ඇතැයි ද හාබ් වාර්තා කරයි. මුහම්මද් නබි (සල්) වහන්සේ විසින් පහත සඳහන් අයුරැ වදාරා ඇතැයි අබු මූසා විසින් වාර්තා කොට ඇති බව අහමඩ් විසින් මුස්නාහ්හිද ඉබ්න් හිබ්බාන් විසින් පිය සහීහිද සඳහන් කොට ඇත.” ස්වර්ගයට නොපිවිසෙන අයවලුන් තුන් කොටසකි. එනම් සුරාවට ඇබ්බැහිවූ අය, ලේ ඥාතීන් පිටු දක්නා අය සහ අන වින හූනියම් ආදිය ගැන විශ්වාස කරන්නවුන්”

### ඉස්මතුවන කරුණු

1. තාරකා මැවීමේ හේතූන්.

2. සෙසු චෝදනාවන් කෙරෙහි දක්වන ප්‍රතිචාරය.

3. චන්ද්‍ර මණ්ඩලයේ ගමන් මග පිළිබඳ හැදෑරීම සම්බන්ධයෙන් ඇති විවිධ මත.

4. හිතට එකඟ නොවී වුවද අන වින, හූනියම්, වශීකරණය, විජ්ජා ආදිය ගැන විශ්වාස තැබීම හෙළා දැකීම.

## 30 වන පරිච්ඡේදය

### අන්වා තුළින් වර්ෂාව පැතීම

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: තොපි, ප්‍රතික්ෂේප කිරීම තොපගේ දිවි පෙවෙත කර ගත්තහුද?[1]

අබූ මාලික් අල් අෂ්හාරි (රලි) තුමාගේ හදීසයක් උපුටා දක්වමින් මුහම්මද් නබි (සල්) වහන්සේ පහත සඳහන් අයුරැ වදාළ බව මුස්ලිම් වාර්තා කරයි: ඉස්ලාම් පූර්වා කාලයේ සිටම අහිතකරවූ සිරිත් හතරක් තවමත් මගේ උම්මාව තුළ පවතී. ඒවා නම්: තම ඥාතීන්ගේ උදාර කීර්තිය පිළිබඳව උදම් ඇනීම, දුර්වල පෙලපතකින් පැවතෙන්නන් හෙලාදැකීම, තාරකා වල බලයෙන් වර්ෂාව පැතීම සහ මියගිය අය වෙනුවෙන් විලාප තැබීම, වෙති. මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාල බව මුස්ලිම් වාර්තා කරයි: "විලාප තබනු ලැබූ ස්ත්‍රිය ඒ පිළිබඳව ඇගේ මරණයට පෙරාතුව පසුතැවිලි නොවූයේ නම් ඇය විනිශ්චය දිනයේදී දියර තාරවලින්වූ වස්ත්‍රයක් ඇඳ ලාදුරැ ලෝගුවකින් සැරසී නැවත පණගන්වා නැගිට්ටවනු ලබන්නීය."

සෙයිද් ඉබ්න් කාලිද් (රලි) තුමා මෙසේ ප්‍රකාශ කළ බව මුස්ලිම් සහ බුහාරි වාර්තා කරති: රාත්‍රියෙහි මද වැස්සකින් පසුව හුදෛබියාහිදී නබි (සල්) වහන්සේ අපේ අළුයම නැමදුම මෙහෙයවූහ. නැමදුම අවසානවූ පසු උන්වහන්සේ එහි සිටි ජනතාවගෙන් "ඔබලාගේ ස්වාමීන්ද්‍රයාණන් පහල කළේ

කුමක්දැයි ඔබලා දන්නෙහිදැ”යි අපෙන් විමසූහ. එවිට ජනතාව ”එය හොඳාකාරව දන්නේ අල්ලාහ් සහ අල්ලාහ්ගේ දූතයන්ය.” යනුවෙන් පිළිතුරු දුන්හ. එයට පිළිතුරු වශයෙන් නබි (සල්) වහන්සේ මෙසේ වදාළහ: අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: ”මගේ දාසයන්ගෙන් සමහරෙක් මා කෙරෙහි විශ්වාසය තබන්නවුන් බවට පත්වී ඇති අතර තවත් සමහරෙක් විශ්වාස නොකරන්නවුන් බවට පත්වී ඇත. අප මත වැසි පතිතවූයේ අල්ලාහ්ගේ කරුණා දයාව හේතුකොට ගෙන යයි විශ්වාස කරන තැනැත්තා මා කෙරෙහි විශ්වාසය තබන්නාවූ අයෙකි. ඔහු තාරකා කෙරෙහි විශ්වාසය තබන්නෙකු නොවේ. එහෙත් අසවල් අසවල් තාරකාවේ වෙනස්වීම හේතු කොටගෙන වැසි පතිතවූයේ යයි යමෙක් විශ්වාස කරන්නේ නම් හෙතෙම තාරකා කෙරෙහි විශ්වාසය තබන සහ මා කෙරෙහි විශ්වාසය නොතබන්නාවූ අයෙක්වේ. ඉබ්න් අබ්බාස් විසින්ද වෙනත් වචනවලින් මෙම හදීසය වාර්තාකර ඇත.

”අසවල් අසවල් තාරකාවේ හෝ ග්‍රහයාගේ බලපෑමෙන් වර්ෂාව පතිතවූයේ යයි කීමේ සිරිතක් ඉස්ලාම් පූර්ව අරාබි ජාතිකයින් අතරේ පැවැති බැවින් අල්ලාහ්තආලා පහත සඳහන් කුර්ආන් පාඨය පහළ කළහ: තාරකාවෝ පිහිටි තැන් මත ප්‍රමාණ කරමි. තොපි දන්නහු නම් ඇත්තෙන්ම එය මහත්වූ ශපථකි. තොපි, ප්‍රතික්ෂේප කිරීම තොපගේ දිවි පෙවෙත කර ගත්තහුද? [2]

## ඉස්මතුවන කරුණු

1. සූරා අල්-වාකිආ හි ඇති පාඨයේ පැහැදිලි කිරීම.

2. ඉස්ලාම් පූර්ව කාලයේ සිට පැවතෙන වැරදි සිරිත් හතර.

3. ඒවායින් සමහරකගෙන් විශ්වාස නොකිරීම දෘශ්‍යමාන වන බව.

4. මුස්ලිම් උම්මාව තුළ විශ්වාස නොකිරීමේ තත්වය ඇතිවිය හැකි බව.

5. සමෘද්ධිමත් තත්වයක් ඇතිවීම නිසා මගේ දාසයන්ගෙන් සමහරෙක් මා කෙරෙහි විශ්වාසය තබන්නවුන් බවට පත්වී ඇති අතර තවත් සමහරෙක් විශ්වාස නොකරන්නවුන් බවට පත්වී ඇත. යන ප්‍රකාශය.

6. එවන් තත්වයක් යටතේ ඊමාන්වලට හිමි ස්ථානය.

7. එවන් තත්වයක් යටතේ විශ්වාස නොකරන්නවුන් බවට පත්වීමට ඇති අවස්ථා.

8. අසවල් අසවල් තාරකාවෝ හෝ ග්‍රහයේ බලපෑමෙන් වර්ෂාව පතිතවූයේ යයි කීම පිළිබඳව ඇති ප්‍රකාශය.

9. ඔබලාගේ ස්වාමීන්ද්‍රයාණන් පහල කළේ කුමක්දැයි ඔබලා දන්නෙහිදැ”යි ප්‍රශ්ණයක් නැඟීම තුළින් නොදන්නා අයට වක්‍රාකාරයකින් ඉගැන්වීම.

10. විලාප තබන්නාවූ ස්ත්‍රිය හෙළා දැකීම.

### පා සටහන්

[1] අල්කුර් ආන් 56:82

[2] අල්කුර්ආන් 56:75-82

## 31 වන පරිච්ඡේදය

**අල්ලාහ් හැර (ඔහුට) සමානයන් කරගනු ලැබූ දැය දෙවියෙකු වශයෙන් ගත් අයද මිනිසුන් අතර ඇත. ඔවුහු ඒ සමානයන් කර ගනු ලැබූ දැය, අල්ලාහ්ට ප්‍රිය කරන්නාක් මෙන් ප්‍රිය කරන්නෝය.**[1]

අල්ලාහ්තආලා මෙසේ වදාලහ: "මුහම්මද්! ඔවුනට "තොපගේ පියවරුන්ද, තොපගේ පුතුයන්ද, තොපගේ සහෝදරයන්ද, තොපගේ භාර්‍යාවන්ද, තොපගේ බන්ධුවරයන්ද, තොප සපයාගත් සම්පතද, පාඩු සිදුවේ යයි තොප බියවන තොපේ වෙළඳාමද, තොප ප්‍රිය කරන නිවාසයන්ද අල්ලාහ්ටද, ඔහුගේ රසූල්වරයාටද ඔහුගේ මාර්ගයෙහි සම්‍යක් වීර්‍යවදවඩා තොපට ප්‍රියවීනම් අල්ලාහ් ඔහුගේ විනිශ්චය පමුණුවන තුරු මඟ බලා හිඳිවූ යි" කියව. අල්ලාහ් අවැඩ කරන ජනතාව යහමඟ නොපමුණුවන්නේය."[2]

අනාස්ගේ හදීසයක් උපුටා දක්වන මුස්ලිම් සහ බුහාරී වාර්තා කරන අන්දමට අල්ලාහ්තආලා පහත සඳහන් අයුරු වදාල බව මුහම්මද් නබි (සල්) වහන්සේ ප්‍රකාශ කොට ඇත. "යමෙක් තම පුතනුවන්ට, පියාණන්ට සහ මුළු මනුෂ්‍ය වර්ගයට වඩා මා (අල්ලාහ්තආලා) කෙරෙහි භක්ති-ප්‍රේමය දක්වන තෙක් ඔහු විශ්වාසය තබන්නෙකු ලෙස සැලකිය නොහැක්කේය." ඒ දෙපොලම වාර්තා කර ඇති තවත් හදීසයක් අනුව මුහම්මද්

නබි (සල්) එතුමන්ගේ මෙසේ වදාරා ඇත. යමෙකුට අවලඩු ඊමානය පිළිබඳවූ ආශිර්වාදය පිරිනැමී ඇතැයි සැලකීමට නම් ඔහු තුල විශේෂාංගයන් තුනක් පිහිටා තිබිය යුතුය. එනම්:- අලලාහ් සහ ඔහුගේ දූතයාණන් ඔහු විසින් අන් සියල්ලකටම වඩා ප්‍රිය කළ යුතුය; ඔහු අල්ලාහ් වෙනුවෙන් සහෝදර ජනතාව කෙරෙහි ඇල්මක් දැක්විය යුතය; විශ්වාස නොකරන තත්වයේ සිට අල්ලාහ්තආලා විසින් ඔහු මුදාගනු ලැබ ඇති බැවින්ද නිරයේ ගිණි මැලයට හෙලනු ලැබීමට අකමැති හෙයින්ද ඔහු නැවතත් විශ්වාස නොකරන තැනැත්තෙකු බවට පත්වීමට අකමැති විය යුතුය.

ඉබ්න් අබ්බාස්ගේ හදිසයක් උපුටා දක්වමින් ඉබ්න් ජරීර් වාර්තා කරන අන්දමට "කවරෙක් අල්ලාහ් වෙනුවෙන්ම යමෙකුට ප්‍රේම කරන්නේද, අල්ලාහ් වෙනුවෙන්ම කෙනෙකු පිළිකුල් කරන්නේද, අල්ලාහ් වෙනුවෙන්ම කෙනෙක් සමඟ මිතුරුකම් පවත්වන්නේද, අල්ලාහ් වෙනුවෙන්ම යමෙකු පස මිතුරෙකු කරගන්නේද ඔහු අල්ලාහ්ගේ මිතුරෙකු බවට පත්වන්නේය. කෙනෙක් කොතෙක් වාරයක් නැමදුම් කළත්, කොතෙක් කල් උපවාස ශීලයේ නියැලි සිටියත් ඉහත දැක්වෙන විස්තරය අනුව ජීවිතය හැඩගස්වා ගන්නා තාක් කල් ඔහු ඊමානයේ රස භුක්ති නොවිඳිනු ඇත. බොහෝ දෙනෙක් මිතුරුදම් ඇතිකර ගන්නේ ලෞකික කරුණු මුල් කරගෙන මිසක් අල්ලාහ් වෙනුවෙන් නොවේ. මෙය ඇත්තෙන්ම නිශ්ඵලය.

"ඔවුන් අතරේ තිබූ සියළු සබඳතා බිඳ හෙලනු ලබන්නේය." (2:166) යන පාඨය අර්ථනිරූපනය කරමින් ඉබ්න් අබ්බාස් කියා

සිටින්නේ "සබඳතා" යන්නෙන් අදහස් කරනුයේ "මිත්‍රත්වයේ බැඳීම" යන්නයි.

**ඉස්මතුවන කරුණු**

1. සූරා-අල්-බකරාහි [3] ඇති පාඨයේ පැහැදිලි කිරීම.

2. සූරා තව්බාහි [4] ඇති පාඨයේ පැහැදිලි කිරීම.

3. තමාටත්, තම ඥාතීන්ටත්, තම ධනයටත් වඩා මුහම්මද් නබි (සල්) වහන්සේට ප්‍රේම කිරීම යුතුකමක් බව.

4. ඊමාන් පිළිබඳව කියා ඇති දැය.

5. ඊමානයේ ආශිර්වාදය ඇතැම් අය අවබෝධ කර ගැනීමටත් ඇතැම් අය වටහා නොගැනීමටත් ඉඩ ඇති බව.

6. අල්ලාහ්ගේ ආදරය දිනා ගැනීමට සහ ඊමානය ශක්තිමත් කර ගැනීමට අත්‍යාවශ්‍යවූ කරුණු.

7. මිනිසුන් අතරේ ඇති බොහෝ සබඳතාවයන් ගොඩ නැගී ඇත්තේ ලෞකික අවශ්‍යතාවයන් මත යැයි ශ්‍රාවකයින් විසින් අවබෝධ කර ගැනීම.

8. "ඔවුන් අතරේ තිබූ සියළු සබඳතා බිඳ හෙලනු ලබන්නේය." යන පාඨයේ පැහැදිලි කිරීම.

9. ඇතැම් සමාන තබන්නවුන් අල්ලාහ් දැඩි ඇල්මක් දැක්වීමට ඉඩ ඇති බව.

10. තම දහමට වඩා ලෝකයට ඇල්මක් දක්වන තැනැත්තා හෙලාදැකීම.

11. අල්ලාහ් හැර අන් අයෙක් ඔහුගේ සමානයෙක් බවට පිළිගෙන අල්ලාහ්ට මෙන් ඔහු කෙරෙහි ඇල්මක් දැක්වීම විශාලතම ෂිර්කයවේ.

### පා සටහන්

(1) අල්කුර්ආන් 2:165
(2) එම 9:24
(3) අල්කුර් ආන් 2:165
(4) එම 9:24

## 32 වන පරිච්ඡේදය

### "සාතාන්මය සිය අනුගාමිකයින්ගේ සිත් තුළට බිය ඇතුළු කරන්නේන, තොපි ඔවුනට බිය නොවවු. තොපි විශ්වාස කරන්නවුන් නම් මට බියවවු."[1]

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: අල්ලාහ් ගැනද විශ්වාස කොටැ සලාත්හි නිරතවැ Zසකාත්දී අල්ලාහ් හැර (අන් කිසිවෙකුට) බිය නොවන අයයැ අල්ලාහ්ගේ නැමදුම් පොලට නිතර ගොස් එය පරිපාලනය කරන්නෝ"[2] "අපි අල්ලාහ් ගැන විශ්වාස කරන්නෙමු." යි කියන අයද සිටිති; එහෙත් අල්ලාහ්ගේ දුක් පීඩා විඳීමට සිදුවූ කල්හි මිනිසුන්ගෙන් සිදුවන පීඩනය අල්ලාහ්ගේ දණ්ඩනය වශයෙන් වරදවා සිතන්නේය."[3]

අබූ සයිද් (රළි) තුමා පහත සඳහන් හදීසය ඉදිරිපත් කරයි: අල්ලාහ්ගේ උදහස ලබමින් මිනිසුන්ගේ සිත් පිනවීමද, අල්ලාහ් විසින් සලසාදී ඇති ජීවනෝපාය සම්බන්ධයෙන් ඔවුන්ට කෘතඥතාවය පල කිරීමද; ඔහුගේ උදහස හා දණ්ඩනය සම්බන්ධයෙන් ඔවුනට දොස් පැවැරීමද විශ්වාසයේ ඇති දුර්වලතාවය වේ. අල්ලාහ් විසින් පිරිනමනු ලබන දෑ ලැබෙනුයේ හුදෙක් සේවකයාගේ පරිශ්‍රමයෙන්ම නොවේ. එමෙන්ම එය නොලැබී යන්නේ පසමිතුරාගේ වෛරය හේතු කොටගෙනද නොවේ.

මුහම්මද් නබි (සල්) වහන්සේ විසින් පහත සඳහන් අයුරැ වදාරා ඇතැයි ආයිෂා (රලි) තුමිය පැවසූ බව ඉබ්න් හිබාන් සිය සහිහි වාර්තා කරයි: "යමෙක් මිනිසුන්ගේ කෝපය ගැන නොතකා අල්ලාහ්ගේ ප්‍රසාදය ලබාගැනීම සඳහා උත්සුක වන්නේද ඔහුට අල්ලාහ්ගේ මෙන්ම මිනිසුන්ගේද ප්‍රසාදය ලබාගැනීමට හැකිවේ. අල්ලාහ්තආලා විසින් ඔහු මිනිසුන්ගේ ප්‍රසාදයට ලක් කරනු ලබයි. යමෙක් අල්ලාහ්ගේ කෝපය ගැන නොතකා මිනිසුන්ගේ ප්‍රසාදය ලබාගැනීම සඳහා උත්සුක වන්නේද ඔහු අල්ලාහ්ගේ මෙන්ම මිනිසුන්ගේද අප්‍රසාදයට පත්වේ. අල්ලාහ්තආලා විසින් ඔහු මිනිසුන්ගේ අප්‍රසාදයට පත් කරනුලබයි.

## ඉස්මතුවන කරුණු

1. සූරා අල් ඉම්රාන්හි ඇති පාඨයේ[3] පැහැදිලි කිරීම.

2. සූරා තව්බාහි[4] ඇති පාඨයේ පැහැදිලි කිරීම.

3. සූරා අල්-අන්කබූත්හි ඇති පාඨයේ[5] පැහැදිලි කිරීම.

4. එත්තු ගැන්වී ඇති විශ්වාසය (යකීන්) වැඩිවීමටත් ඉඩ ඇති බව.

5. දුර්වලවීමේ ලකුණු, දුර්වලතාවය විදහා දක්වන අංග ලක්ෂණ තුන.

6. අල්ලාහ් කෙරෙහි පමණක් බියබැති වීමේ අවශ්‍යතාවය.

7. අල්ලාහ්ට බියබැතිවන්නාවූ තැනැත්තාගේ උදාරත්වය පිලිගැනීම.

8. අල්ලාහ් කෙරෙහි බිය බැති නොවන්නාවූ තැනැත්තා උපයාගන්නා අකුසල්.

### පා සටහන්

[1] අල්කුර්ආන් 3:175
[2] එම 9:18
[3] එම 29:10
[3] අල්කුර්ආන් 3:175
[4] එම 9:18
[5] එම 29:10

## 33 වන පරිච්ඡේදය

### "ඔබලා විශ්වාසය තබා සිටින්නවුන් නම් අල්ලාහ් කෙරෙහි බලාපොරොත්තු තබව.[1]

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: "විශ්වාස කරන අය නම්: අල්ලාහ් සිහිපත් කළ කල්හි ඔවුන්ගේ සිත්හි බියක් හටගන්නාවූද ...... එම්බා නබියැ! නුඹටද නුඹ අනුගමනය කරන අයටද අල්ලාහ් ප්‍රමාණවත්ය..... යමෙක් අල්ලාහ් කෙරෙහි විශ්වාස තබන්නේද ඔහුට අල්ලාහ් ප්‍රමාණවත්ය."[2]

ඉබ්න් අබ්බාස් ගේ හදීසයක් උපුටා දක්වමින් අල් බුහාරී සහ අල් නසායි මෙසේ වාර්තා කරති: ඉබ්‍රාහිම් නබි (සල්) වහන්සේ නම්රෝද්ගේ ගිණිමැලයට පතිත කරනු ලැබූවිට උන්වහන්සේ විසින්ද; එමෙන්ම "ඔබට එරෙහිව ඔවුහු සේනාවක් එක්රැස් කරගෙන සිටිති. එහෙයින්, ඔවුනට බියවනු."[4] යයි මුහම්මද් නබි (සල්) වහන්සේට දැනුම් දුන් විට උන්වහන්සේද "අපට අල්ලාහ් ප්‍රමාණවත්ය. ඔහු උසස්තම භාරකරුවේ."[3] යයි වාදලහ. මෙයින් ඔවුන්ගේ විශ්වාසය අධිකවිය.

### ඉස්මතුවන කරුණු

1. අල්ලාහ් කෙරෙහි බලාපොරොත්තු (තවක්කල්) තැබිය යුතුකමක් බව.

2. අල්ලාහ් කෙරෙහි බලාපොරොත්තු (තවක්කල්) තැබීම ඊමානයේ අංගයක් බව.

3. සූරා අල් අන්ෆාල්හි [5] දැක්වෙන පාඨයේ පැහැදිලි කිරීම.

4. සූරා අල් අන්ෆාල්හි [6] දෙවන පාඨයේ පැහැදිලි කිරීම.

5. සූරා අත්තලාක්හි [7] ඇති දෙවන පාඨයේ පැහැදිලි කිරීම.

6. ආපදාවන්ට මුහුණදුන් අවස්ථාවන්හි ඉබ්රාහිම් (අලෙ) සහ මුහම්මද් නබි (සල්) වහන්සේ විසින් පල කළ අදහස අඩංගු පාඨයේ [8] වැදගත්කම.

### පා සටහන්

[1] අල්කුර් ආන් 5:23
[2] එම 8:2, 8:64, 65:3
[3] එම 65:3
[4] අල්කුර්ආන් 3:173
[5] එම 8:2
[6] එම 8:64
[7] එම 65:3
[8] එම 3:173

## 34 වන පරිච්ඡේදය

**"අල්ලාහ්ගේ දඬුවමින් ඔවුහු මිදුණේද?**
**අල්ලාහ්ගේ දඬුවමෙහි බියෙන් තුමු මිදෙන්නෝයයි**
**නටුවන් මිස නොහඟින්නෝය."[1]**

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: "තම ස්වාමීන්ද්‍රයාණන්ගේ දයාලු භාවය බලාපොරොත්තු නොවන්නේ වැරදි මාර්ගයේ ගියවුන් විනා අන්කවරෙක්ද? [2].

අබ්බාස් තුමාගේ වාර්තාවක් අනුව බලවත් පාපයන් කවරේදැයි මුහම්මද් නබි (සල්)) වහන්සේගෙන් විමසනු ලැබූ කල්හි උන්වහන්සේ මෙසේ පිළිතුරැදී වදාලය: "බලවත් පාපයක් නම අල්ලාහ් කෙරෙහි බලාපොරොත්තු නොතැබීම සහ අල්ලාහ්ගේ සැලැස්මෙන් බාහිරවූ යමක් ලැබෙනු ඇතැයි සිතීම වෙති." ඉබ්න් මසූද්ගේ හදීසයක් උපුටා දක්වන අබ්ද් අල් රාසික් වාර්තා කරන අන්දමට මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාලහ:" ඉතාමත් බරපතලවූ පාපයක් නම් අල්ලාහ්ට සමානයන් තැබීම, අල්ලාහ්ගේ සැලැස්මට බාහිරවූ යමක් ලැබෙනු ඇතැයි සිතීම සහ උන්වහන්සේගේ දයානුකම්පාව කෙරෙහි බලාපොරොත්තු නොතැබීම වේ.

## ඉස්මතුවන කරුණු

1. සූරා අල් අරාෆ් හි ඇති පාඨයේ[3] පැහැදිලි කිරීම.

2. සූරා අල්හිජ්ර් හි ඇති පාඨයේ[4] පැහැදිලි කිරීම.

3. තමන් අල්ලාහ්ගේ අඳාවතුයට ඔබ්බෙන් සිටින්නේ යයි, සිතීම තදබල ලෙස හෙළාදැක තිබීම.

4. බලාපොරොත්තු නොතැබීම හෙළාදැකීම.

### පා සටහන්

[1] අල්කුර්ආන් 7:99
[2] එම 15:56
[3] අල්කුර්ආන් 7:99
[4] එම 15:56

## 35 වන පරිච්ඡේදය

### අල්ලාහ්ගේ ක්‍රියාදාමයන් ඉවසා දරා සිටීම ඊමානය සඳහා අත්‍යාවශ්‍යවේ.

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: "යමෙක් අල්ලාහ් කෙරෙහි විශ්වාසය තබන්නේද අල්ලාහ් ඔහුගේ සිත යහමඟට හරවන්නේය." [1]

අල්කාමා පවසන අන්දමට "ඔහු (එනම් ඉහත දැක්වෙන පාඨයේ සඳහන් පුද්ගලයා) වනාහි විපතකට පත්වූ විට එය අල්ලාහ්ගෙන් හිමිවූ එකක් බව දැන එය පිලිගෙන අල්ලාහ්ට යටහත් පහත් වන්නේය."

අබූ හුරෙයිරා තුමාගේ හදීසයක් සිය සහිහි වාර්තා කරන මුස්ලිම් පවසන අන්දමට මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාරා ඇත. "මිනිසෙකු තුළ පවතින් විශ්වාස නොකරන්නාවූ තත්වය කරුණු දෙකකින් හෙළිදරවු වේ. යමෙකුගේ පෙලපත හෙලාදැකීම සහ මියගිය අයෙක් වෙනුවෙන් විලාප තැබීම එම කරුණු දෙකය.

මුස්ලිම් සහ බුහාරි විසින් වාර්තා කරන හදීසයක මෙසේ දැක්වේ. "ඉස්ලාම් පූර්ව කාලයෙහි අරාබි ජාතිකයින් කළ ආකාරයට මුහුණට ගසා ගනිමින්, වස්ත්‍ර ඉරාගනිමින්, මියගිය අයෙකු වෙනුවෙන් විලාප තබා ශෝකය ප්‍රකාශ කරන

තැනැත්තා අපේ කණ්ඩායමට අයත් නොවූ අයෙකි.

අනාස් තුමාගේ වාර්තාවක් අනුව මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාරා ඇත. "යම් අයෙක් කෙරෙහි අල්ලාහ්ගේ ප්‍රසාදය ඇතිවූ විට, අල්ලාහ් එම තැනැත්තාට මෙලොවෙහි දඬුවමක් පමුණුවනු ලබයි; යම් අයෙක් ගැන අල්ලාහ් ප්‍රසාදයට පත් නොවන්නේ නම් අල්ලාහ් ඔහුට පමුණුවනු ලබන දඬුවම විනිශ්චය දිනය තෙක් කල් තබයි." අල් තිර්මිදිගේ වාර්තාවක් අනුව මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාලහ: "යමෙකුට පමුණුවනු ලබන විපත් ඔහුට පිරිනමනු ලබන යහ ප්‍රතිඵලවලට සමානුපාතිකවේ. අල්ලාහ් යම් ජන කොට්ඨාශයක් කෙරෙහි ප්‍රසාදය දක්වන්නේ නම් ඔහු එම ජනතාවට ආපදාවක් ඇති කරයි. ඔවුන් එය විඳ දරා ගන්නේ නම්, අල්ලාහ් ඔවුන් කෙරෙහි ප්‍රසාදයට පත්ව ඒ ඒ අනුව යහ ප්‍රතිඵල ප්‍රදානය කරන්නේය. අනෙක් අතට, ඔවුන් එම ආපදාව සම්බන්ධයෙන් අප්‍රසාදයට පත්වන්නේ නම් අල්ලාහ්ද ඔවුන් කෙරේ අප්‍රසාදයට පත්වේ.

## ඉස්මතුවන කරුණු

1. සූරා අල් තගාබුන්හි ඇති පාඨයේ [2] පැහැදිලි කිරීම.

2. එය ඊමාන්හි අංගයක් බව.

3. කෙනෙකුගේ පෙලපත හෙලා දැකීම.

4. ඉස්ලාම් පූර්ව කාලයෙහිදී මෙන් යමෙක් මියගිය විට මුහුණට ගසා ගැනීම, තමන්ගේ වස්ත්‍ර ඉරාගැනීම යනාදී ක්‍රියාවන් මගින් ශෝකය ප්‍රකාශ කිරීම, තදින් හෙලාදැකීම.

5. සිය දාසයාගේ වාසනාව සඳහාවූ අල්ලාහ්ගේ සැලැස්ම.

6. සිය දාසයාගේ අවාසනාවන්ත තත්වය සඳහාවූ අල්ලාහ්ගේ සැලැස්ම.

7. සිය දාසයා කෙරෙහි අල්ලාහ් සැලකිලිමත්වීම සහ ඔවුනට ආදරය දැක්වීම.

8. අල්ලාහ් විසින් කරනු ලබන දඬුවමට එරෙහිවීම තහනම්කර තිබීම.

9. යම් ආපදාවකදී එය ඉවසිලිවන්තව විඳදරා ගැනීම සඳහා ලැබෙන යහ ප්‍රතිඵල.

## පා සටහන්

[1] අල්කුර්ආන් 64:11
[2] අල්කුර්ආන් 64:11

# 36 වන පරිච්ඡේදය

## කුහකකම

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: මුහම්මද්! මම තොප වැනි මිනිසෙක් පමණක්මි, (එහෙත්) තොපගේ දෙවියන් එකම දෙවියන් යයි මට වහී පහළවී ඇත යනුවෙන් කියනු.[1]

මුස්ලිම් විසින් වාර්තා කරනු ලැබ ඇති අබූ හුරෙයිරා තුමාගේ හදීසයන් අනුව මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාරා ඇත: "මට කිසිදු සහායකයෙකුගේ අවශ්‍යතාවයක් නැත. යමෙක් මට සමානයෙක් තබන්නේද ඔහුගේ අවසනාවන්ත ඉරණම හිමිකර ගැනීම මම නොවලක්වාලමි." යනුවෙන් අල්ලාහ්තආලා ප්‍රකාශ කරයි. අබූ සයිද්ගේ හදීසයක් උපු දක්වන අහමඩ් වාර්තා කරන අන්දමට මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාලහ. "ඔබලා ගැන මා වඩාත්ම බියට පත්වන එක් කරුණක් ඇත. එනම් තමා සලාතය ඉටුකිරීම තවත් අය විපරමින් බලාගෙන සිටින්නේය යන සිතුවිල්ලෙන් මෙහෙයවනු ලැබූ කෙනෙක් එම සලාතය ඉස්තරම් අයුරින් ඉටු කිරීමේදී සිදු කරනු ලබන සැඟවුනු ෂිර්කයයි."

### ඉස්මතුවන කරුණු

1. සූරා අල් කහ්ෆ්හි [2] ඇති පාඨයේ පැහැදිලි කිරීම.

2. හුදෙක් අල්ලාහ් වෙනුවෙන්ම නොකළහොත් යහපත් ක්‍රියාවක් වුවද අල්ලාහ් විසින් ප්‍රතික්ෂේප කරන බව.

3. මෙම ප්‍රතික්ෂේප කිරීමට හේතුව ඔහු සතු පරම ස්වයංපෝෂිත භාවයයි.

4. එබැවින් තවත් හේතුවක් නම් කිසිදු දෙයක ඌනතාවයක් ඔහුට නොතිබීමයි.

5. තම අනුගාමිකයින් වීමට ඇත ඉඩකඩ පිළිබඳව නබි (සල්) වහන්සේ තුළ තිබෙන බිය.

6. සෙසු අය විමසිලිමත්ව බලා සිටියදී සලාතය ඉටු කරන පුද්ගලයා එම සිතිවිල්ලෙන් මෙහෙයවනු ලැබ සිය සලාතය ඉස්තරම් අයුරින් ඉටුකිරීම කුහක කමක් බව නිදර්ශනයක් වශයෙන් ගැනීම.

## පා සටහන්

[1] අල්කුර්ආන් 18:110, 41:6

# 37 වන පරිච්ඡේදය

## ලෞකික ආශාවන්හි බැඳී සිටීම ෂිර්ක්වේ.

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටි: "මෙලොව ජීවිතය ද එහි අලංකාරයද යමෙක් ආශා කරන්නේද ඔවුන්ගේ ක්‍රියාවනට මෙහිදී අපි ඔවුනට නොඅඩුව ඵලවිපාක දෙන්නෙමු. ඔවුනට පරලොවෙහි ගින්න මිස අන් දෙයක් හිමි නොවේ. මෙලොවෙහි ඔවුන් කළ දැය නිෂ්ඵලය. එමෙන්ම නිරර්ථකය." [1]

අබූ හුරෙයිරා (රලි) තුමා පහත දැක්වෙන හදීසය වාර්තා කරයි: "මුහම්මද් නබී (සල්) වහන්සේ මෙසේ වදාලහ: ඩීනාරයේ වහලෙකු වන්නාට දුකය! දිර්හාමයේ වහලෙකු වන්නට දුකය! කම්සයේ වහලෙකු වන්නාට දුකය! [2] එවන් වහලෙකු ඔහු එසේ ගිජු කමක් දක්වන දෙය ලැබුනු විට ගේ සිනාසෙයි; ඔහුට එය නොලැබුනහොත් හෙතෙම රවයි, ඔරවයි, දුකට හා කනස්සල්ලට පත්වෙයි. කටුවක් ඇනුනහොත් තවත් යමෙක් කිරීමට පෙරාතුව එම කටුව ඉවතට ඇද දැමිය යුතුය. අල්ලාහ්ගේ මාර්ගයෙහි අසු පිට යන ගැත්තා ප්‍රශංසාවට භාජනය විය යුතුය."

## ඉස්මතුවන කරුණු

1. මිනිසා මොලොව ප්‍රිය කළ යුත්තේ මතු ලොව දිවිය සදහා වැඩ සලසා ගැනීමටය.

2. සූරා හූද්හි අඩංගු පාඨයේ[3] පැහැදිලි කිරීම.

3. ඩිනාරයේ සහ දිර්හාමයේ වහලෙකු ලෙස කෙනෙකු හැඳින්වීම.

4. ගිජුකමක් දක්වන දෙය ලැබුනුවිට ඔහු සිනාසෙයි, නොලැබුනහොත් රවයි, ඔරවයි..." යන ප්‍රකාශයේ පැහැදිලි කිරීම.

5. "දුකට හා කනස්සල්ලට පත්වෙයි" යන ප්‍රකාශයේ පැහැදිලි කිරීම.

6. කටුවක් ඇනුනු විට .... යන ප්‍රකාශයේ පැහැදිලි කිරීම.

7. අල්ලාහ්ගේ මාර්ගයෙහි යම් මෙහෙවරක යෙදෙන තැනැත්තාට ප්‍රශංසා කිරීම.

### පා සටහන්

(1) අල්කුර්ආන් 11:15-16 2:183 පිටුව බලන්න.

(2) ඩිනාර් සහ දිර්හාම් යනුවෙන් හැඳින්වෙන්නේ මුදල්ය. කමිස යනුවෙන් හැඳින්වෙන්නේ පට හෝ ලෝම පිලිමයක් මසන ලද අලංකාර ලෙස වැඩ දැමූ වස්ත්‍රය. ඩිනාරයේ සහ දිර්හාමයේ

සහ සුඛෝපභෝගි වස්තුවල වහලෙකුව සිටින තැනැත්තා සෑම දෙයකටම වඩා ලෞකික දෙයට මුල් තැනදීම.

(3) අල්කුර්ආන් 11:15-16

## 38 වන පරිච්ඡේදය

**තහනම් කරනු ලැබ ඇති දේ නීත්‍යානුකූල කිරීම සඳහාද එමෙන්ම නීත්‍යානුකූලවූ දෙයක් තහනම් කිරීම සඳහා ද 'උලමා' ධර්මාචාර්ය) කෙනෙකුට හෝ පාලකයෙකුට යටත්වී ක්‍රියා කිරීම ඔවුන් අල්ලාහ් සමඟ සමානයන් වශයෙන් සැලකීමක් වේ.**

අහමද් ඉබ්න් හන්බාල් මෙසේ පවසයි: "අල්ලාහ්ගේ දූතයාණන්ගේ ආඥාවක් හරියාකාරව දැන සිටියදී සුෆ්යාන්ගේ මතයට අවනතවීම විමතියට කරුණකි." අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: රසූල්වරයාගේ අණට අවනත නොවන අය, ඔවුනට (මෙලොව) පරික්සුමක් සිදුවීමෙන් හෝ ඔවුනට (පරලොවැ) වේදනීය දඬුවමක් සිදුවීමෙන් ප්‍රවේසම් වෙත්වා!"[1] මෙ පිරික්සුම කුමක්දැයි ඔබ දන්නේද? එය ශිර්කයයි.

රසූල්වරයාගේ ඇතැම් ආඥාවන්ට අකීකරුවීම ඔහුගේ පණිවුඩය ප්‍රතික්ෂේප කොට ගිණිමැලය තුරුලුකර ගැනීමට ආසන්නවූ තත්වයකි.

අදී ඉබ්න් හාතිම්ගේ කියමනක් උපුටා දක්වන අහමඩ් (ඉබ්න් හන්බාල්) සහ තිර්මිදිගේ වාර්තාවක් අනුව මෙසේ දැක්වේ: වරක් මුහම්මද් නබි (සල්) වහන්සේ මතු දැක්වෙන පාඨය පාරායනය කිරීම මට ඇසුනි: "අල්ලාහ් හැර, ඔවුන්ගේ

මාර්ඥයන්ද සන්‍යස්තයන්ද ඔවුහු ස්වාමිවරුන් කොට ගත්හ."[2] එවිට අපි (ක්‍රිස්තියානින් සහ යුදෙව්වරුන්) ඔවුනට නැමදුම් නොකරන බව මම පැවසුවෙමි. එයට ඔහු "ඔවුන් නීත්‍යානුකූල බවට ප්‍රකාශ කරන දේ නීත්‍යානුකූල බවටත් ඔවුන් තහනම් යයි ප්‍රකාශ කරනු ලබන දෙය තහනම් දෙයක් බවටත් ඔබලා සලකන්නේ නැද්ද? යනුවෙන් ඔහු ප්‍රශ්න කළේය. ඇත්ත වශයෙන්ම 'ඔව්' යයි මම පිලිතුරු දුනිමි. "එය නැමදුමට සමාන වන්නේය." යි ඔහු කියා සිටියේය.

## ඉස්මතුවන කරුණු

1. සූරා අන්නූර්හි[3] ඇති පාඨයේ පැහැදිලි කිරීම.

2. සූරා තව්බාහි ඇති පාඨයේ[4] පැහැදිලි කිරීම.

3. අදී විසින් නැමදුමක් නොවේ යයි ප්‍රකාශ කරන ලද ක්‍රියාවල නියම අර්ථය දැක්වීම.

4. මුහම්මද් නබි (සල්) වහන්සේගේ අනුශාසනාවට වඩා සුෆ්යානගේ මතයට අවනතවීම අහ්මද් ඉබ්න් හන්බාල් විසින් හෙලාදැක තිබීම.

5. බොහෝ දෙනෙකු විසින් සන්‍යස්තයන්ට වැදුම් පිදුම් කිරීම ඉහලතම සදාචාරයක් වශයෙන්ද, මාර්ඥයන්ට වැදුම් පිදුම් කිරීම දැනුමේ සහ බුද්ධියේ ලක්ෂණයක් වශයෙන්ද සැලකීමට

තරම් තත්වය වෙනස් විය. පසු කලෙකදී සදාචාරයක් නොමැති නුගතුන්ට පවා වැදුම් පිදුම් කිරීමට තරම් මෙම තත්වය වෙනස්වීම.

පා සටහන්

[1] අල්කුර්ආන් 24:63
[2] අල්කුර්ආන් 9:31
[3] අල්කුර්ආන් 24:63
[4] එම 9:31

# 39 වන පරිච්ඡේදය

**මුඹ වෙතැ පහළ කරනු ලැබූ දැය**
**ගැනද විශ්වාස කරන්නාහු යයි කියන**
**අය ගැන මුඹ මෙනෙහි නොකළෙහිද?**
**එය ප්‍රතික්ෂේප කළ යුතුයයි ඔවුන් අණ**
**කරනු ලැබූ කල්හි තාගූත් වෙතැ විනිශ්චය**
**සෙවීමට ඔවුහු අදහස් කරන්නෝය.**
**ඔවුන් ඉතා ඈත්වූ දුර්මාර්ගයෙහි හෙළන්නට**
**ෂයිතාන් අදහස් කරන්නේය.**[1]

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: "ලොවෙහි අවැඩ නොකරම්" යි ඔවුනට කියූ කල්හි "අපි යහ වැඩ කරන්නෝ වෙමු" යි කියත්.[2] අල්ලාහ්තආලා තවදුරටත් මෙසේ වදාරා සිටී: "භූමියෙහි එය සංස්කරණය කළායින් පසු අවැඩ නොකරවු."[3] "ඉස්ලාම් පූර්ව කාලයේ පැවැති තත්වයට ආපසු යෑමට ඔවුන් ආශා කරන්නේද?[4]

අබ්දුල්ලා ඉබ්න් ඉම්රාන්ගේ හදීසයක් අල් නවවී විසින් කිතාබ් අල් හුජ්ජාහි වාර්තා කරමින් මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාල බව ප්‍රකාශ කරයි: "මට පහළ කරනු ලැබ ඇති දේ කෙනෙකුගේ සෑම චරියාවක්ම මෙහෙයවන්නාවූ බලවේගය බවට පත්වන තාක් කල් ඔහු වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මුස්ලිමෙකු යයි හැඳින්විය නොහැක."

අල් ෂාබි මෙසේ වාර්තා කරයි: දිනක් යුදෙව්වෙකු සහ මුනාෆිකයෙකු (කුහකයෙකු) අතර ආරාවුලක් ඇතිවිය. එවිට යුදෙව්වා "මුහම්මද් කිසිවිටෙක අල්ලසක් නොගන්නාවූ පුද්ගලයෙකුවූ බැවින් අපේ ආරවුල විසඳීම සඳහා ඔහු තෝරා ගනිමු." යයි යෝජනා කළේය. එවිට මුනාෆිකයා "නැහැ අපේ ආරවුල වෙනත් යුදෙව්වෙකු ලවා විසඳවා ගනිමු" යයි ප්‍රතියෝජනාවක් ඉදිරිපත් කළේය. එහෙත් යුදෙව්වන් අල්ලස් ගැනීම සම්බන්ධයෙන් ප්‍රසිද්ධ නිසා ඔවුහු අවසානයේදී ජුහයින් ගොත්‍රයට අයත් පූජකයෙකුට ඔවුන්ගේ ආරාවුල විනිශ්චය කිරීමේ කාර්යය පැවරීමට එකඟවූහ. මේ සම්බන්ධයෙන් පහළවූ පාඨයයි මතු සඳහන් වන්නේ: "මුඹ වෙතැ පහළකරනු ලැබූ දැය ගැනද මුඹට පෙර පහල කරනු ලැබූ දැය ගැනද විශ්වාස කරන්නාහු යයි කියන අය ගැන මුඹ මෙනෙහි නොකළෙහිද? එය ප්‍රතික්ෂේප කළ යුතු යයි ඔවුන් අණ කරනු ලැබූ කල්හි තාගුත් වෙත විනිශ්චය සෙවීමට ඔවුහු අදහස් කරන්නෝය. ඔවුන් ඉතා ඈත්වූ දුර්මාර්ගයෙහි හෙලන්නට ෂයිතාන් අදහස් කරන්නේය." [5]

තවත් වාර්තාවක් අනුව මෙම පාඨය පහළවූයේ දෙදෙනෙකු අතරේ හටගත් ආරාවුලක් සම්බන්ධයෙනි. ඉන් එක් අයෙක් "අපේ ආරාවුල මුහම්මද් (නබි) සල් වහන්සේ හමුවට ගෙන ගොස් විසඳා ගමු යයි යෝජනා කළ අතර අනෙකා එය කාබ් ඉබ්න් අල් අෂ්රෆ් ලවා විසඳා ගනිමු යයි යෝජනා කළේය. අවසානයේදී ඔවුහු ආරවුල විසඳා ගැනීම සඳහා උමර් වෙත ගියෝය. එවිට උමර්තුමා ඔවුන් අමතා මුහම්මද් නබි (සල්) වහන්සේ ලවා ආරවුල විනිශ්චය කරවා ගැනීම එක් අයෙක්

ප්‍රතික්ෂේප කළ බව සත්‍යයක්දැයි විමසුවේය. එසේයයි පිළිතුරු දුන්විට උමර් තුමා එම තැනැත්තා එතැනදීම මරණයට පත් කළේය.

## ඉස්මතුවන කරුණු

1. තාගුත් අවබෝධ කර ගැනීම සම්බන්ධයෙන් සූරා අන් නිසාහි ඇති පාඨයේ[6] පැහැදිලි කිරීම.

2. "ලොවෙහි අවැඩ නොකරවී." යනුවෙන් සූරා අල්බකරාහි ඇති පාඨයේ[7] පැහැදිලි කිරීම.

3. සූරා අල් අරෆ්හි ඇති "අවැඩ නොකරවී." යන පාඨයේ[8] පැහැදිලි කිරීම.

4. සූරා අල් මාඉදාහි ඇති "ඉස්ලාම් පූර්ව කාලයේ පැවැති තත්වයට ආපසු යැමට ඔවුන් ආශා කරන්නේද? යන පාඨයේ[9] පැහැදිලි කිරීම.

5. පලමුවන පාඨය කවර තත්වයක් යටතේ පහළ කරනු ලැබුවේද යන්න සම්බන්ධයෙන් අල් ෂාබී විසින් ඉදිරිපත් කර ඇති අදහස.

6. ව්‍යාජ හා අව්‍යාජ ඊමාන් පිළිබඳ පැහැදිලි කිරීම.

7. උමර් සහ මුනාෆික් සම්බන්ධ කථා පුවත.

8. මුහම්මද් නබි (සල්) වහන්සේට පහල කරනු ලැබ ඇති වහී කෙනෙකුගේ සැම වරියාවක්ම මෙහෙයවන්නාවූ බලවේගය බවට පත්වනතාක් කල් ඔහු වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මුස්ලිමෙකු යයි සැලකිය නොහැකි බව.

## පා සටහන්

[1] අල්කුර්ආන් 4:60
[2] එම 2:11
[3] එම 7:56,85
[4] එම 5:50
[5] අල්කුර්ආන් 4:60
[6] අල්කුර්ආන් 4:60
[7] එම 2:11
[8] අල්කුර්ආන් 7:56,85
[9] එම 5:50

## 40 වන පරිච්ඡේදය

## අල්ලාහ්තආලාගේ ඇතැම් නම් හා ගුණාංගයන් ප්‍රතික්ෂේප කිරීම

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: එහෙත් ඔවුන් පරම දයාලුහු ප්‍රතික්ෂේප කරති. ඔවුනට මෙසේ කියව! ඔහු මගේ ස්වාමීන්ද්‍රයාණන්ය. ඔහු හැර අන් දෙවියෙක් නැත. ඔහු කෙරෙහි මම විශ්වාසය තබමි.[1]

අල් බුහාරි විසින් සිය සහිහි වාර්තාකර ඇති අන්දමට අලි මෙසේ පවසා ඇත: "ජනතාව මනාව දන්වා බසින් ඔවුන් අමතනු. අල්ලාහ් සහ ඔහුගේ දූතයාණන් සත්‍යය මිස අන් දෙයක් කියනු ඇතැයි ඔබ සිතන්නේද?

අබ්ද් අල් රාසික් විසින් වාර්තා කරන අන්දමට ඉබ්න් අබ්බාස්ගේ කියමනක් අනුව මුහම්මද් නබි (සල්) වහන්සේ විසින් අල්ලාහ්ගේ ගුණාංගයන් පිළිබඳව කරනු ලැබූ ප්‍රකාශයකට එක් අයෙක් විරුද්ධ විය. උන්වහන්සේ අල් රහ්මාන් යන වචනය භාවිතා කළ විට කුරෙයිෂ් ගෝත්‍රිකයෝ එයට විරුද්ධ වූහ. "ඔවුන් පරම දයාලුහු ප්‍රතික්ෂේප කරති...."[2] යන පාඨය පහළ වූයේ මේ අවස්ථාවෙහිය.

## ඉස්මතුවන කරුණු

1. අල්ලාහ්ගේ යම් ගුණාංගයක් ප්‍රතික්ෂේප කරනු ලැබූ විට එහි ඊමානයක් නැත.

2. සූරා අල් රඅද්හි ඇති පාඨයේ[3] පැහැදිලි කිරීම.

3. ජනතාවට නොතේරෙන බසකින් ඔවුන් ඇමතීම නොකළ යුතු බව.

4. අල්ලාහ් සහ ඔහුගේ දූතයාණන් විසින් ප්‍රකාශ කරනු ලැබ ඇති සත්‍යය පිටු දැකීමට ඇති ඉඩකඩ.

### පාද සටහන්

[1] අල්කුර්ආන් 13:30

[2] එම

[3] අල්කුර්ආන් 13:30

## 41 වන පරිච්ඡේදය

### ඔවුහු අල්ලාහ්ගේ අනුග්‍රහය දනිති. එහෙත් ඔවුහු එය ප්‍රතික්ෂේප කරති. ඔවුන්ගෙන් වැඩි දෙනෙක් අකෘතඥයහ.[1]

මුජාහිද් මෙසේ පවසයි: මෙම පාඨය අදාල වන්නේ "මෙය මගේ දේපොලය. මෙය මට මගේ පියාගෙන් උරුමවූවකි." යයි කියා සිටින අයටය. ඔවුන් බින් අබ්දුල්ලා පවසන අන්දමට "අසවල්, අසවල් පුද්ගලයා නොසිටින්න මෙය මට ලැබෙන්නේ නැත." යනුවෙන් කියා සිටින පුද්ගලයාට මෙම පාඨය අදාල වේ. "මෙය මෙසේ සිදුවූයේ අපේ දෙවි දේවතාවුන්ගේ මැදිහත්වීම හේතුකොට ගෙනය." යි කරුණු දක්වන අයටද මෙය ගැලපෙන බව කුතයිබා වාර්තා කරයි.

සෙයිද් ඉබ්න් කාලිද්ගේ හදීසයක් අනුව අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: "මගේ දාසයන්ගෙන් සමහරෙක් මා කෙරෙහි විශ්වාසය තබා සිටින්නාවූ අතරම, විශ්වාසය නොතබන්නාවූ කොටසක් බවටද පත්වී සිටිති."

අබූ අල් අබ්බාස් වාර්තා කරන අන්දමට "අල්ලාහ්ගෙන් ලැබී ඇති අනුග්‍රහයන්, අල්ලාහ් හැර වෙනත් අයගෙන් ලැබුනු බව පැවසීම මගින් සමානයන් තැබීමේ වරද සිදු කරනු ලබන අය අල්ලාහ්ගේ තදබල දෝෂාරෝපනයට භාජනයවී තිබෙන අවස්ථා රාශියක් අල්කුර්ආනයේ සහ සුන්නාවේ දැක්වේ." බොහෝ

අයගේ මුවින් පිටවන "සුළඟ හැමුවේ අපට හිතකරවූ ආකාරයටය." "ගුවන් නියමුවා දක්ෂයෙකි." වැනි ප්‍රකාශ තෙපලීමෙන් කෙනෙකු ලෙහෙසියෙන්ම ෂිර්කය කරා ඇදී යයි.

**ඉද්මතුවන කරුණු**

1. අල්ලාහ්ගේ අනුග්‍රහයෙන් තෝරාගෙන ඒවා පිලිගැනීම මෙන්ම ඒවා ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ අර්ථය පැහැදිලි කිරීම.

2. සාමාන්‍ය එදිනෙදා දිවියේදී මෙය ප්‍රචලිතව පවතින බව.

3. අල්ලාහ්ගේ අනුග්‍රහය ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ විග්‍රහය.

4. පරස්පර විරෝධීතාවයන් දෙකක් එකට පැවැතිය නොහැකි බව අවධාරණය කිරීම.

පා සටහන්

[1] අල්කුර්ආන් 16:83

## 42 වන පරිච්ඡේදය

### "එහෙයින් තොප දැනුවත්වැ අල්ලාහ්ට සමානයන් නොතබවු" [1]

ඉබ්න් හාකිම් වාර්තා කරන අන්දමට ඉබ්න් අබ්බාස් මෙම පාඨය ගැන මෙසේ කරුණු ගෙනහැර දක්වයි: මෙය ෂිර්කයකි. මෙය වනාහි රාත්‍රි කාලයෙහි කළු පාෂාණයක් මත දිව යන කුඹින් දැක බලාගැනීමට වඩා නිර්ණය කිරීමට අපහසුවූ වරදකි. "අපේ බල්ලා නොසිටින්න, නැත්නම් මිදුලේ සිටි තාරාවුන් නොසිටින්න සොරුන් අපේ ගෙදරට ඇතුල්වන්න තිබුනා." වැනි අහිංසක ස්වරූපයක් ගන්නා කියමනක් පවා මෙම ගණයට වැටිය හැක. ඔබට ෂිර්කයෙන් මිදීමට වුවමනා නම් අල්ලාහ් සමඟ ඇදා අන් කිසිවෙකු ගැන නොකියනු.

අත් තිර්මිදි විසින් වාර්තා කරනු ලැබ ඇති උමර් ඉබ්න් අල් කත්තාබ් (රලි) තුමාගේ හදීසයක් අනුව මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාරා ඇත. "අල්ලාහ් හැර අන් කිසිවෙකුගේ නාමයෙන් දිවුරුමක් කිරීම ෂිර්කයක් වේ." ඉබ්න් මසූද් මෙසේ පවසයි. "අන් කිසිවෙකුගේ නාමයෙන් දිවුරා සත්‍යයක් පැවසීමට වඩා අල්ලාහ්ගේ නාමයෙන් දිවුරා බොරුවක් කීම වඩා හොඳ බව මම සිතමි.

අබූ දාවූද් විසින් වාර්තා කර ඇති හුදෙයිෆා (රලි) තුමාගේ හදීසයක් අනුව මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ

වදාරා සිටියහ: "මෙය මෙසේ සිදුවිය යුතුයයි අල්ලාහ්තආලා අධිෂ්ඨානය කිරීමත් ඔබ විසින් අධිෂ්ඨාන කිරීමත් කොරතම් පුදුම සහගතද? යනුවෙන් නොකියනු. ඒ වෙනුවට එය එසේ සිදුවිය යුතුයයි ප්‍රථමයෙන් අල්ලාහ්තආලා අධිෂ්ඨාන කිරීමත් දෙවනුව ඔබ අධිෂ්ඨාන කිරීමත් කෙතරම් පුදුම සහගතද? යයි කියනු. ඉබ්‍රාහිම් අල් නක්හි මෙසේ පවසයි. "මා අල්ලාහ් කෙරෙහිත් ඔබ කෙරෙහිත් විශ්වාස තබමි." යනුවෙන් යමෙක් පැවැසීම මම ප්‍රිය නොකරමි." එහෙත් මම ප්‍රථමයෙන් අල්ලාහ් කෙරෙහි විශ්වාසය තබමි, දෙවනුව ඔබ කෙරෙහි විශ්වාසය තබමි." යයි කීම වැරදි නොවේ.

**<u>ඉස්මතුවන කරුණු</u>**

1. සමානයන් තැබීම සම්බන්ධයෙන් හූරා අල් බකරාහි ඇති පාඨයේ [2] පැහැදිලි කිරීම.

2. මහා ෂිර්කය හෙලා දකින්නාවූ පාඨයට සුළු ශිර්කයක් අඩංගුවන බවට ශ්‍රාවකයින් අවබෝධ කර ගැනීම.

3. අල්ලාහ්තආලා හැර අන්කිසිවෙකුගේ නාමයෙන් දිවුරුමක් කිරීම ෂිර්කයකි.

4. අල්ලාහ් හැර අන් කිසිවෙකුගේ නමින් දිවුරා සත්‍යයක් කීම බොරුවක් කීමට වඩා බරපතල පාපයකි.

5. දිවුරුමකදී 'සහ' යන වචනය සහ 'පළමුව' සහ 'දෙවනුව' යන වචන උපයෝගී කර ගැනීමේ වෙනස.

### පා සටහන්

[1] අල්කුර්ආන් 2:22

[2] අල්කුර්ආන් 2:22

# 43 වන පරිච්ඡේදය

## තරඟ කරුවෙකු අල්ලාහ්ගේ නමින් පමණක් දිවුරුවීම

ඉබ්න් මාජා විසින් වාර්තා කොට ඇති ඉබ්න් උමර්ගේ හදීසයක් අනුව මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාරාඇත: "ඔබේ පියාගේ නාමයෙන් නොදිවුරනු. අල්ලාහ්ගේ නමින් පමණක් දිවුරනු. එසේ සත්‍ය කරුණක් ගැන පමණක් දිවුරනු. යම් තරඟකරුවෙකු අල්ලාහ්ගේ නමින් දිවුරන්නේ නම් එය පිළිගනු. යම් තරඟකරුවෙකු අල්ලාහ්ගේ නමින් දිවුරනු ලැබූ අවස්ථාවක ඒ ගැන යමෙක් සෑහීමකට පත් නොවන්නේ නම් ඔහු අල්ලහ්ගේමාර්ගයෙහි ගමන් කරන්නවුන්ගේ ගණයට නොවැටේ.

### ඉස්මතුවන කරුණු

1. පෙර පැවතියවුන්ගේ නමින් දිවුරීම තහනම් කර ඇති බව.

2. යම් තරඟකරුවෙකු අල්ලාහ්ගේ නමින් දිවුරනු ලැබූ විටෙක එය පිළිගෙන ඒ ගැන සෑහීමකට පත්වීම යුතුකමක් වේ.

3. ඒ ගැන සෑහීමකට පත් නොවන තැනැත්තා හෙළා දැක ඇත.

## 44 වන පරිච්ඡේදය

### අල්ලාහ් සහ ඔබ එසේ අධිෂ්ඨාන කර තිබීම කොතරම් පුදුම සහගතද යනුවෙන් කීම

අල් නසායි විසින් වාර්තා කර ඇති ක්වතයිලාගේ හදීසයක මෙසේ කියවේ. "අල්ලාහ් සහ ඔබ එසේ අධීෂ්ඨාන කර තිබීම කොතරම් පුදුම සහගතද? කිබ්ලාවේ නමින් දිවුරම්" යයි කීමෙන් සමහර මුස්ලිම්වරු ෂිර්කයක් සිදුකරන බව දිනක් යුදෙව්වෙක් විසින් මුහම්මද් නබි (සල්) වහන්සේට පැවැසුවේය. එවිට උන්වහන්සේ "කාබාවේ අධිපතින් වහන්සේගේ නාමයෙන්" යනුවෙන් දිවුරන ලෙසද "අල්ලාහ් එසේ අධීෂ්ඨාන කර ඇත. ඔබද එසේ අධීෂ්ඨාන කර තිබීම කොතරම් පුදුම සහගතද?" යනාකාරයට පවසන මෙන්ද අණ කළහ.

අල්කසායි වාර්තා කරන, ඉබ්න් අබ්බාස්ගේ හදීසයක මෙසේ දැක්වේ: දිනක් එක් මිනිසෙක් මුහම්මද් නබි (සල්) වහන්සේ අමතා "අල්ලාහ් සහ ඔබ වහන්සේ එසේ අධිෂ්ඨාන කිරීම කෙතරම් පුදුම සහගතදැ" යි ඇසුවේය. එවිට උන්වහන්සේ එම ප්‍රකාශයට විරෝධය පළකරමින් "ඔබ මා අල්ලාහ් සමහ සමානයෙක් බවට පත්කරන්නේද? "අල්ලාහ් එසේ අධිෂ්ඨාන කර තිබීම කෙතරම් පුදුම සහගතදැ"යි කියනු යනුවෙන් ඔහුට අවවාද කළහ.

ඉබ්න් මාජාගේ වාර්තාවක් අනුව ආයිෂා තුමියගේ ඥාති සොහොයුරෙකුවූ තුෆයිල් මෙසේ පවසා ඇත. දිනක් මට යුදෙව්වරුන් කණ්ඩායමක් හමුවිය. එවිට මම ඔවුන් අමතා මෙසේ කීවෙමි. "උසයිර් අල්ලාහ්ගේ පුත්‍රයාණන් යිය නොකිවානම් ඇත්ත වශයෙන්ම ඔබලා අල්ලාහ්ගේ අධිපාරේ ගමන් කරන්නවුන් බවට පත්වන්නේය." එය ඇසූ ඔවුන් මෙසේ පිලිතුරු දුන්හ. "අල්ලාහ් සහ මුහම්මද් එසේ අධිෂ්ඨාන කර තිබීම කෙතරම් පුදුම සහගතදැ යි නොකිවානම් ඔබලා ඇත්ත වශයෙන්ම අල්ලාහ්ගේ අධිපාරේ ගමන් කරන්නවුන් බවට පත්වන්නේය. ඉන්පසුව මට කිතු බැතිමතුන් කණ්ඩායමක් හමුවිය. එවිට මම ඔවුන් අමතා "ජේසු අල්ලාහ්ගේ පුත්‍රයාණන් යයි නොකිවානම් ඇත්ත වශයෙන්ම ඔබලා අලාහ්ගේ අධිපාරේ ගමන් කරන්නවුන් බවට පත්වන්නේය." යනුවෙන් පැවසුවෙමි. එවිට "අල්ලාහ් සහ මුහම්මද් එසේ අධිෂ්ඨාන කර තිබීම කෙතරම් පුදුම සහගතදැ"යි නොකිවානම් ඔබලා ඇත්ත වශයෙන්ම අල්ලාහ්ගේ මාර්ගයේ ගමන් කරන්නවුන් බවට පත්වන්නේ." යනුවෙන් පිලිතුරු දුන්හ. මම මෙම සිද්ධිය කිහිප දෙනෙකුට පවසා අනතුරුව නබි (සල්) වහන්සේ හමුවට ගියෙමි. එවිට උන්වහන්සේ මා මෙය අන් කිසිවෙකුට පැවසුවාදැයි ප්‍රශ්න කළවිට මම 'ඔව්' යයි පිලිතුරු දුන්නෙමි. මේ අවස්ථාවෙහි උන් වහන්සේ අල්ලාහ්ට ආශිර්වාද හා ප්‍රශංසා කොට මෙසේ වදාලහ: "තුෆයිල් විසින් ඔබලාගෙන් කිහිප දෙනෙකුට ඔහුගේ විනිශ්චය හෝ ඔහුට පහලවූ දෙය ප්‍රකාශ කොට ඇත. මවිසින් බොහෝ කලකට උඩදී තහනම් කළයුතුව තිබූ වදන් මාලාවක් ඔබලා මෙතෙක් කල් පාවිච්චි කළාහුය. මා අසවල් අසවල් හේතුන් නිසා එය මීට පෙරාතුව තහනම් නොකළෙමි. "අල්ලාහ්

සහ මුහම්මද් එසේ අධිෂ්ඨාන කර තිබීම කෙතරම් පුදුම සහගතද" යනුවෙන් මින්පසු නොකියනු. අල්ලාහ් එසේ අධිෂ්ඨාන කර තිබීම කෙතරම් පුදුම සහගතද යනුවෙන් කියනු."

## ඉස්මතුවන කරුණු

1. සුළු ෂිර්කය පිළිබඳව යුදෙව්වන්ට තිබූ දැනුම.

2. මිනිසාගේ අවබෝධ කර ගැනීමේ ශක්තියට අධිෂ්ඨානය හා හැඟීම් බලපාන බව.

3. ඔබ මා අල්ලාහ් සමඟ සාමානයෙක් බවට පත් කරන්නේද? යනුවෙන් නබි (සල්) වහන්සේ කළ ප්‍රකාශය: මේ අනුව බලනවිට "මිනිසුන් අතුරින් උදාරතමවූ මිනිසාණෙනි, ඔබ හැර මට පිහිට සෙවිය හැකි අන් කිසිවෙක් නැත..... යනාදිවූ පද්‍යයක් හෙළාදැකිය යුතු නොවේද?

4. මිට ඉහතදී එය තහනම් නොකිරීමට හේතූන් තිබුණු බවට උන්වහන්සේ විසින් කළ ප්‍රකාශය අනුව බලන විට මෙය මහා ෂිර්කයක් නොවන බව.

5. සදාචාරාත්මකවූ විනිශ්චය උදාර චින්තනයක් බව.

6. සදාචාරාත්මකවූ විනිශ්චය නීති සම්පාදනය සඳහා පාදක කරගත හැකි බව.

## 45 වන පරිච්ඡේදය

### අල් දහ්රයට දොස් පැවැරීම පූජනීයවූ දෙයකට අවමන් කිරීම වේ.

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: "අපට මෙලෝ දිවිය මිස අන් දිවියක් නැත. අප ජීවත්වී මිය යන්නෙමු. අපේ දිවිය අවසන් කරන්නේ කාලයයි (අල් දහ්ර්) යනුවෙන් ඔවුහු කියන්නෝය." [1]

අබූ හුරෙයිරා තුමා සහිහි වාර්තා කරන අන්දමට මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාරා ඇත: "කාලයට දොස් පැවරීම මගින් මිනිසා මට අවමන් කරයි. අල් දහර් මම වෙමි. දිවා කාලයෙන් පසුව රාත්‍රී කාලයද එමෙන්ම රාත්‍රී කාලයෙන් පසුව දිවා කාලයද ඇති කරන්නේ මමයි" තවත් කියමනක් අනුව "අල් දහර් මම වෙමි. අල් දහ්රයට අවමන් නොකරව."යි අල්ලාහ් පවසයි.

ඉස්මතුවන කරුණු

1. අල් දහ්රයට දොස් පැවැරීම තහනම්කර තිබීම.

2. අල් දහ්රයට දොස් පැවැරීම පූජනීය දෙයකට අවමන් කිරීම වශයෙන් සැලකීම.

3. "අල් දහ්ර් මම වෙමි" යන ප්‍රකාශයේ අර්ථය අවබෝධකර ගැනීම.

4. චේතනාවක් නොමැතිව වුවද මෙවන් අවමනක් සිදුවීමට අවකාශ ඇත.

පා සටහන්

[1] අල්කුර්ආන් 45:24

# 46 වන පරිච්ඡේදය

## විනිසුරුවන්ගෙනුත් විනිසුරු වැනි නම්බුනාම

අබූ හුරෙයිරාගේ සහිහි වාර්තාවන අන්දමට මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාලහ: අල්ලාහ්ගේ දෘෂ්ටිය අනුව මිනිසෙකු විසින තමන් වෙත පවරාගතහැකි බරපතල වරදක් නම් "ලෝකයේ අධිරාජයාණන්" යයි තමන් හදුන්වා ගැනීමයි." අල්ලාහ් හැර අන්කිසි අධිරාජයෙක් නොමැත. සුෆියාණන් පවසන අන්දමට හෙලා දැකිය යුතුවූ තවත් නම්බු නාමයක් නම් "ෂාහින්ෂා" යනුවෙන් හැඳින්වීමයි. මේ සම්බන්ධයෙන් ඇති තවත් අර්ථ දැවීමක් අනුව "විනිශ්චය දිනයේදී අල්ලාහ්ගේ ඉමහත් උදහසට භාජනය වන්නාවූ සහ ඉතාමත් දුෂ්ඨ යයි සලකනු ලබන පුද්ගලයා නම් "රජුන්ගෙන් රජු" වශයෙන් තමන් හදුන්වා ගන්නාවූ තැනැත්තාය.

### ඉස්මතුවන කරුණු

1. "ලෝකයේ අධිරාජයාණන්" යන නම්බුනාමය යෙදීම තහනම් කර තිබීම.

2. සුෆියාන්ගේ නිදර්ශනයෙහි දක්වා ඇති ආකාරයේ නම්බුනාමයන් සියල්ලක්ම තහනම්කර තිබීම.

3. චේතනාවක් නොමැතිව වුවද මෙවන් අන්දමේ අවමන් කිරීමක යෙදීම තහනම්කර තිබීම.

4. සියළු කීර්ති ප්‍රශංසා අල්ලාහ් සුබහානහුවතආලාට පමණක් අයත් බව මතක් කරදීම.

# 47 වන පරිච්ඡේදය

## අල්ලාහ්ගේ නාමයන්ට ගරු කිරීම සහ අවශ්‍ය වූවහොත් නම් වෙනස් කිරීම

අබූ දාවුද් සහ තවත් හදීස් සංස්කාරකයින් කිහිප දෙනෙකු වාර්තා කරන අන්දමට එක් වතාවක් නබි (සල්) වහන්සේ අබූ අල් හකම් යන අන්වර්ථ නාමයෙන් හැඳින්වූ අබූ ෂුරායි අමතා "අල් හකම් (විනිශ්චයකාරයාණන්) අල්ලාහ්ය. විනිශ්චය ඔහුගේය." යනුවෙන් ප්‍රකාශ කළහ. එවිට අබූ ෂුරායි (නිදහසට කරුණු වශයෙන්) "මගේ වැසියන් ඔවුන්ගේ ආරාවුල් විසඳා ගැනීම සඳහා මා වෙත පැමිණෙති. මා ඔවුන්ගේ ආරාවුල විසඳනු ලැබූ විට දෙපාර්ශවයම මගේ විනිශ්චය ගැන තෘප්තියට පත්වෙති. එම නිසා ඔවුන් මට "විනිශ්චයේ පියා" යන විරුදාවලියෙන් අමතති." යනුවෙන් පිළිතුරු දුන්නේය. එවිට නබි (සල්) වහන්සේ: කෙතරම් උදාරද? "ඔබට ළමුන් සිටින්නේද? යනුවෙන් ප්‍රශ්ණයක් නැගූ විට ඔහු ඔව්! ෂුරායි, මුස්ලිම් සහ අබ්දුල්ලා යන නම් වලින් යුත් පුතුන් තිදෙනෙකු මට සිටිනවා" යනුවෙන් පැවැසුවේය. එයින් වැඩුමහල් පුතානුවන් කවරෙක්දැයි ප්‍රශ්න කළවිට ෂුරායි යනුවෙන් ඔහු පිළිතුරු දුන්නේය. එවිට නබි (සල්) වහන්සේ "හොඳයි" එසේනම් මින් මතුවට ඔබ අබූ ෂුරායි යන නම භාවිතා කළ යුතු යයි වදාලහ.

**ඉස්මතුවන කරුණු**

1. අල්ලාහ්ගේ ගුණාංගයන් සහ නම්වලට ගරු කිරීම සහ චේතනාවක් නොමැතිව හෝ ඒවාට නිගරු කිරීමෙන් වැලකීම.

2. අල්ලාහ්ගේ නම්වලට ගරු කිරීමක් වශයෙන් තම නම වෙනස් කිරීම.

3. අනවර්ථ නාමය සඳහා තම වැඩුමල් පුතාගේ නම භාවිතා කිරීම.

# 48 වන පරිච්ඡේදය

## <u>අල්ලාහ්, කුර්ආනය හෝ රසූල්වරයාණන්</u>
## <u>සරදමට ලක් කිරීම</u>

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටි: "මුඹ ඔවුන්ගෙන් ප්‍රශ්න කෙළෙහිනම්" අපි කෙළි ප්‍රලාපයෙහි යෙදුණෙමි පමණක්මයැ"යි ඔවුහු කියති" [1]

ඉබ්න් උමර්, මුහම්මද් ඉබ්න් කාබ්, සයිද් ඉබ්න් අස්ලම් සහ කතාදා යන සියළු දෙනාම පහත සදහන් හදිසය වාර්තා කර ඇත. තබුක් යුද්ධය පවතින අවදියෙහි එක් මිනිසෙක් ඉදිරියට පැමිණ "අල්ලාහ්ගේ රසූල්වරයාණන් සහ ඔහුගේ අනුගාමිකයින්ට වඩා කැමට ගිජු, බොරා කියන සහ සටනේදී බියසුල්ලන් වශයෙන් කටයුතු කරන පිරිසක් අප දැක නැත්තෙමු." යනුවෙන් ප්‍රකාශ කළේය. එවිට අවුෆ් ඉබ්න් මාලික් නැගී සිට "බොරැකාරයා ඔබයි. ඔබ මුස්ලිමෙකුගේ වේශයෙන් පෙනී සිටින (මුනාෆික්) කුහකයෙක්. ඔබ ගැන මා නබි (සල්) වහන්සේට පැමිණිලි කරන්නම්" යනුවෙන් පැවසුවේය. අවුෆ් වහාම නබි (සල්) වහන්සේ හමුවීමට ගියේය. එහෙත් ඒ වනවිට උන්වහන්සේට වහි පහලවී තිබුනි. මෙය ආරංචිවූ එම පුද්ගලයා වහාම අසු පිට නැගී නබි (සල්) වහන්සේ වෙත ගොස් "අපි ගමනේ පාළුව මැකිම සදහා විහිළුවට එසේ කීවෙමු" යයි පැවැසුවේය. ඉබ්න් උමර්ගේ වාර්තාව අනුව එම පුද්ගලයා නබි (සල්) වහන්සේගේ දුවමින් සිටි ඔටුවාගේ සැදැල පටියේ එල්ලි

ඔහුගේ දෙපය රළු පොළොවේ ඇතිලෙමින් යද්දී "අපි විහිළුවට එසේ කීවෙමු." යයි නැවත නැවතත් පැවැසුවේය. එවිට නබි (සල්) එතුන්ගේ ඔහු දෙස හැරී නොබලාම" විහිළුවක් කළා, අල්ලාහ් සමඟත් ඔහුගේ වහී සමගත් ඔහුගේ රසූල්වරයා සමගත් විහිළු කලාදැ"යි ප්‍රශ්න කළහ.

<u>ඉද්මතුවන කරුණු</u>

1. <u>ඉතාමත් වැදගත්</u>: මෙවැනි කරුණු හාස්‍යයට ලක් කිරීම, විශ්වාසය නොකිරීමට සමානවේ.

2. කවරෙක් විසින් මෙම වරද සිදුකළත් මෙම පාඨයේ අර්ථ නිරූපනය මෙයවේ.

3. දුෂ් චේතනාවෙන් යුක්තව මෙවන් දෙයක් කීමේ ඇති බරපතලකම.

4. අල්ලාහ් ප්‍රිය කරන්නාවූ සමාව දීමේ ගුණාංගය සහ තම සතුරනට දැඩි දඬුවම් පැමිණවීම අතරේ ඇති වෙනස.

5. නිදහසට කරුණු වශයෙන් ඉදිරිපත් කරන සෑම දෙයක්ම පිළිගනු නොලබන බව, ඇතැම් කරුණු පිළිගත නොහැකි බව.

පා සටහන්

[1] අල්කුර්ආන් 9:65

# 49 වන පරිච්ඡේදය

## ඔහුට සිදුවූ විපතකින් පසුව දයාලු බවක් අප ඔහුට දැක්වී නම් මේ මගේ යහකම් වලින් ලබාගත් භාග්‍යයක් යයි ඔහු කියනු ඇත.[1]

ඉහත පාඨය පැහැදිලි කරන මුජාහිද් "මට ලැබී ඇති යසස හා සම්පත් මගේම පරිශ්‍රමයේ ප්‍රතිඵලයයි." යනුවෙන් ඇතැමෙක් උදම් අනන අතර ඉබ්න් අබ්බාස් වාර්තා කරන අදමට "සමාව ලැබෙන්නේ මගෙන් මිස අල්ලාහ්ගෙන් නොවේ." යිය තවත් සමහරෙක් කියති. අල්ලාහ්තආලා අල්කුර්ආනයෙහි මෙසේ වදාරා සිටී: "මට මෙම භාග්‍යය හිමිවී ඇත්තේ මගේ දැනුම නිසාය" යි ඔහු කිවේය.[2] මෙම පාඨය පැහැදිලි කරණ කතාදා "මගේ වාසනාවන්ත තත්ත්වයට හේතුවූයේ මගේම දැනුමයි" යනුවෙන් කෙනෙක් කියා සිටී.

මුස්ලිම් සහ බුහාරි වාර්තා කරන අන්දමට මුහම්මද් නබි (සල්) වහන්සේ පහත සඳහන් කථා පුවත කියා සිටිනු අබූ හුරෙයිරා (රලි) තුමාට ඇසී ඇත. "බනූ ඉස්රාඉල් ගෝත්‍රිකයින් තිදෙනෙකු පරීක්ෂණයට භාජනය කිරීම සඳහා අල්ලාහ්තආලා ඔවුන්ගෙන් එක් එක් අයෙක් ලාදුරු රෝගයට, හිසේ තට්ට භාවයට සහ අන්ධ භාවයට පත් කළහ. අනතුරුව ඔවුන් එක් එක් අය වෙත ඔවුන්ගේ ප්‍රථම ආශාව කුමක්දැයි විමසීම සඳහා මලාඉකාවරයෙකු යැව්වේය. ලාදුරු රෝගියා තමන් සෙසු

අයගේ පිළිකුලට භාජනය කරනු ලැබ ඇති රෝගය සුවකර තමන්ට මනා පැහැයක් සහ ශරීරයට ලක්ෂණ සමක් ලබාදෙන ලෙස ඉල්ලා සිටියේය. ඔහුගේ එම ඉල්ලීම ඉටු කරන ලදී. ඊළඟට ඔහු වස්තුව වශයෙන් කුමක් ප්‍රිය කරන්නේදැයි විමසනු ලැබූ විට "ඔටුවන් සහ වලදෙනුන්" යයි පිළිතුරු දුන්නේය. ඔහුට ගැබ් බර ඔටු දෙනක් දෙනු ලැබ ආශිර්වාද කරනු ලැබීය. තට්ටය පැදුනු මිනිසා තමන්ට හිස කෙස් සහ වලදෙනුන් හෝ ඔටුවන් ඉල්ලා සිටියේය. ඔහුට මනා කෙස් කලඹක්ද ගැබ්බර වලදෙනෙක් ද දෙනු ලැබ ආශිර්වාද කරනු ලැබීය. අන්ධ මිනිසා තමන්ගේ ඇස් පාදා දෙන ලෙසද එළු පට්ටියක්ද ඉල්ලා සිටියේය. ඔහුගේ එම ඉල්ලීම එපරිදිම ඉටු කරනු ලැබීය. මේ තිදෙනාම ඔවුන් වෙත පිරිනමනු ලැබූ දෙයින් සමෘද්ධියට පත්වූහ. අනතුරුව බලාඉකාවරයා අසරණ, අනාථ, අතරමංවූ පුද්ගලයෙකුගේ වෙස් ගෙන එම පුද්ගලයින් තිදෙනාගෙන් එක් එක් අය පිළිවෙලින් හමුවීමට ගොස් "ඔබට පැහැපත් සමක් ලබාදුන්නාවූද, මුදල් හදල් ලබාදුන්නාවූද ස්වාමීන්ද්‍රයාණන්ගේ නාමයෙන් අසරණ මට මගේ ගේදොර බලා ආපසු යෑමට හැකිවනු පිණිස යම් උපකාරයක් කරනු මැනව." යනුවෙන් ඇයද සිටියේය. පළමු දෙදෙනා ඔහුට යමක් දීම ප්‍රතික්ෂේප කළහ. පළමුවන පුද්ගලයා "දැන් හිඟන්නෙක් බෝවෙලා." යයි කී අතර, දෙවන පුද්ගලයා "ඔබගේ අසරණ භාවය මා පිළිගන්නා අතර ඔබේ ඉල්ලීම ඉටු කිරීමට මට හැකියාවක් නැත." යයි පිළිතුරු දුන්නේය. එවිට මලාඉකාවරයා ඔවුන් දෙදෙනාටම ඔවුන් තමන් මෙන් අසරණව සිටි අතීතය මතක්කර දුන්නේය. එය ඇසූ එම දෙදෙනා "අපට මෙම සම්පත් අපේ දෙමාපියන්ගෙන්ද ඔවුන්ට ඔවුන්ගේ දෙමාපියන්ගෙන්ද උරුම

වූයේය.” යනුවෙන් පිළිතුරු දුන්හ. මේ අවස්ථාවෙහි මලාඉකාවරයා ”මෙම කරුණ සම්බන්ධයෙන් ඔබ බොරුවක් කියන්නේ නම් ඔබ පෙර පැවැති ත්වයටම පත්වේවා” යයි ප්‍රාර්ථනා කළේය. මලාඉකාවරයා අනතුරුව කලින් අන්ධව සිටි මිනිසා වෙත ගොස් සිහමන් ඉල්ලා සිටියේය. එවිට එම පුද්ගලයා ”මම අන්ධයෙකුව සිටියෙමි. අල්ලාහ්තආලා මට නැවත නේත්‍රවල පෙනුම ලබාදුන්නේය. මම දුප්පත් සිටියෙමි. උන්වහන්සේ මට ධනය හිමිකර දුන්සේක. ඔබ කැමති දෙයක් අරගෙන යන්න. ඔබ එය ආපසුදීමට අවශ්‍ය නැත.” යයි පිළිතුරු දුන්නේය. මෙය ඇසූ මලාඉකාවරයා ”ඔබේ ධන සම්භාරය ඔබම තබාගන්න. අල්ලාහ් ඔබ ගැන ප්‍රසාදයට පත්ව සිටින්නෙහිය, එහෙත් උන්වහන්සේ ඔබේ සගහන් ගැන අප්‍රසාදයට පත්ව සිටින්නෙහිය” යනුවෙන් පැවසුවේය.

## ඉස්මතුවන කරුණු

1. සූරා අල් සජ්දා හි ඇති පාඨයේ[3] පැහැදිලි කිරීම.

2. එම පාඨයෙහිම ”....... යයි ඔහු කියනු ඇත.[4] යන ප්‍රකාශයේ අර්ථය පැහැදිලි කිරීම.

3. ”මගේ දැනුම නිසාය.[5] යන පාඨයේ අර්ථය.

4. මෙම කථා පුවතින් ඉගෙන ගතහැකි පාඩම් රාශිය.

## පා සටහන්

[1] අල්කුර්ආන් 41:50

[2] එම 28:78

[3] අල්කුර්ආන් 41:50

[4] එම 41:50

[5] එම 28:78

## 50 වන පරිච්ඡේදය

### ඔහු ඔවුනට යහපත්වූ දරු සම්පතක් ප්‍රදානය කළ කල්හි එම ත්‍යාගය පිරිනමනු ලැබූ ඔහුට ඔවුන් සමානයන් තබති.[1]

ඉබ්න් හස්ම් වාර්තා කරන අන්දමට වැඩි දෙනාගේ මතය වන්නේ අබ්ද් අල් මුතාලිබ් යනුවෙන් හැර අබ්ද් උමර්, අබ්ද් අල් කාබා යනාදි වශයෙන් අල්ලාහ්ට හැර අන් කිසිවෙකුට අබ්ද් (සේවය කරන බව හඟවන) යන නම එකතු කිරීම තහනම්කර ඇති බවය.

අබූ සාකිම් වාර්තා කරන අන්දමට ඉබ්න් අබ්බාස් මතු දැක්වෙන පාඨය පැහැදිලි කරමින් මෙසේ පවසයි: "ආදම් ඇය (ඒව) සමඟ වූසු කල්හි ඇය ගැබ්බර වූවාය."[2] එවිට සාතන් ඒ දෙපොළ වෙත පැමිණ "ඔබ දෙපොළ ස්වර්ගයේ සිට නෙරපනු ලැබීම සිදු කළේ මා විසින්මය. ඔබලා දැන් මට කීකරු විය යුතුය.

ඉපදීමට ඇති ඔබේ පුතනුවන්ට අබ්ද් අල් හාරිත් (ගොවියාගේ පුතා) යනුවෙන් නම් තබන බවට පොරොන්දු වන්න. මෙයට එකඟ නොවුවහොත් ගර්භයේ සිටින පුතනුවන්ගේ හිසෙහි මුවෙකුගේ මෙන්වූ අං දෙකක් ඇති කොට එමගින් මවගේ සිරුර සිදුරු කිරීමට සලසන්නෙමි යයි ඔවුන් බිය වැද්දුවේය. ඔවුහු එයට එකඟ නොවූහ. උපන් ළදරුවා ප්‍රසූතියේදීම මිය ගොස්

සිටියේය. මට නැවත ගැබ්ගත් විටද එසේම සිදුවිය. එම ලදරුවාද ප්‍රසූතියේදීම මිය ගොස් සිටියේය. මට තුන්වන වරට ගැබ්ගත් කල්හි තමන්ගේ දරුවා කෙරෙහි ඇති දාරක ප්‍රේමය නිසාම ඔවුහු සාතන්ගේ කොන්දේසි වලට යටත්වූහ. නිරුපද්‍රිතව උපත ලත් පුතනුවන්ටඅබ්ද් අල් හාරිත් යනුවෙන් නම් තැබූහ. කතාදා වාර්තා කරන මුජාහිද්ගේ හදීසයක් අනුව "ඔබ අපට යහපත් දරුවෙකු දෙන්නෙහි නම්"(3) යන ප්‍රාර්ථනාව කරනු ලැබුවේ ඔවුනට ලැබීමට සිටි දරුවා මිනිස් ප්‍රාණියෙකු නොවීමට ඉඩ ඇතැයි ඔවුන් තුල තිබූ දැඩි බියයි.

## ඉස්මතුවන කරුණු

1. අල්ලාහ් හැර අන් කිසිවෙකුට සේවය කරන බව හඟවන නම් තහනම් කර තිබීම.

2. ඉහත සඳහන් පාඨයන්ගේ පැහැදිලි කිරීම.

3. මෙයට ඇතුලත්ව ඇත්තේ අළුතින් උපත ලත් ළමයෙකුට නම් තැබීමේදී සිදුවීමට ඉඩ ඇති ශිර්කය පමණක් නොවේ.

4. යහපත් හා අංග සම්පූර්ණ ළමයෙකු බිහිවීම අල්ලාහ් විසින් මිනිසාට කරනු ලබන පරිත්‍යාගයකි.

## පා සටහන්

[1] අල්කුර් ආන් 7:190

[2] එම 7:189-190

[3] අල්කුර්ආන් 7:189

## 51 වන පරිච්ඡේදය

**ඉතාමත් ලක්ෂණ නම් අයත් වන්නේ අල්ලාහ්ටය. ඒ නම්වලින් ඔහුට අඬ ගසව. එම නාමයන්ට නිගරු කරන අය පිටු දකිවු.**[1]

ඉබ්න් අබ්බාස් උපුටා දක්වන අබු හාකිම් මෙසේ වාර්තා කරයි: "නිගරු කරන නාමයන් භාවිතා කිරීම" යනුවෙන් අදහස් කරනුයේ ෂිර්කයන් ඇතුවෙන නාමයන්ගෙන් ඔහු හැඳින්වීමයි. මෙම අර්ථ නිරූපනය තවදුරටත් තහවුරු කරන ඉබ්න් අබ්බාස් "අල්ලාත්" යන නම අල්ලාහ් යන වචනයෙන්ද උල් උස්සා යන වචනය අල් අසීස් යන වචනයෙන්ද බිහිවූ බව පවසයි. අල් අමාෂ් වාර්තා කරන අන්දමට "නිගරු කරන නාමයන් භාවිතා කිරීම" යන වන මාලාවෙන් අදහස් කරනුයේ නමේ නියම අර්ථය තුළට වෙනත් අර්ථයක් කාවැද්දීම වේ.

**ඉස්මතුවන කරුණු**

1. අල්ලාහ්ගේ නාමයන් කවරේදැයි ඔප්පු කිරීම.

2. ඒවායේ උදාරතර අර්ථය දැක්වීම.

3. අල්ලාහ් එම නාමයන්ගෙන් ඇමතිය යුතු බවට ඇති විධානය.

4. නිගරු කරන දුෂ්ටයන් පිටු දකින ලෙසට ඇති විධානය.

5. නිගරු කිරීමක් ඇතිවන ස්වභාවය විග්‍රහකිරීම.

6. මෙම වරද සිදු කරන තැනැත්තා හෙළාදැක තිබීම.

### පා සටහන්

[1] අල්කුර්ආන් 7:180

## 52 වන පරිච්ඡේදය

### අල්ලාහ්ට සාමය ඇති වේවා" යනුවෙනු ශුභ පැතීම තහනම්කර තිබීම

ඉබ්න් මසූද් (රලි) තුමා සිය සගිහි මෙසේ වාර්තා කරයි: දිනක් අපි මුහම්මද් නබි (සල්) වහන්සේ සමඟ නැමදුම ඉටුකොට "අල්ලාහ්ට ඔහුගේ දාසයන්ගේ සාමය හිමිවේවා! මෙහි සිටින අසවල් අසවල් අයට සාමය ඇතිවේවා!" යනුවෙන් ප්‍රාර්ථනා කළෙමු. එවිට නබි (සල්) වහන්සේ "අල්ලාහ්ට සාමය හිමිවේවා යයි නොකියනු. අල්ලාහ් සාමයයි යනුවෙන් වදාලහ.

### ඉස්මතුවන කරුණු

1. "සාමය" විග්‍රහ කර තිබීම.

2. "සාමය හිමිවේවා" යන්න ආචාර කිරීමක්වේ.

3. නුසුදුසු වදනක් පාවිච්චි කිරීම පිළිබඳවූ අවවාදය.

4. ආචාර කිරීමේදී සුදුසු ක්‍රමය කුමක්ද නුසුදුසු ක්‍රමය කුමක්දැයි මුස්ලිම්වරුන්ට ඉගැන්වීම.

## 53 වන පරිච්ඡේදය

### "අල්ලාහ් දෙවියන් වහන්ස, ඔබ වහන්සේ කැමති නම් මට සමාව දෙනු මැනව" යනුවෙන් යාඥා කිරීම.

අබූ හුරෙයිරා තුමා වාර්තා කර ඇති අන්දමට නබි (සල්) වහන්සේ මෙසේ වදාරා ඇත: "අල්ලාහ් දෙවියන් වහන්ස, ඔබ වහන්සේ කැමති නම් මට සමාව දෙනු මැනව." යනුවෙන් හෝ "ඔබ වහන්සේ කැමති නම් මට අනුකම්පා කළ මැනව" යනුවෙන් නොකියව. අල්ලාහ්ට බලකර යමක් කිමට කිසිවෙකුට අයිතියක් නැත. එමනිසා මිනිසා යම් ඇයදිමක් කරන්නේ නම් එය නිශ්චිතව ඉදිරිපත් කළ යුතුය. කරනු ලබන කිසිදු ඉල්ලිමක් අල්ලාහ්ට ඉටුකළ නොහැකි එකක් නොවේ."

**ඉස්මතුවන කරුණු**

1. කොන්දේසි සහිතව කරනු ලබන ආයාචනයන් තහනම් කර තිබීම.

2. එසේ තහනම් කිරීමට හේතුව.

3. 'නිශ්චිත ඇයදිම' යන්නෙහි අර්ථය.

4. ආයාචනාත්මක නැමදුම පැහැදිලිව, අවධාරණයෙන්ම හා දැඩි භක්තියෙන් යුක්තව ඉටු කිරීම.

5. එසේ කිරීමේ සාධාරණත්වය.

## 54 පරිච්ඡේදය

### "මගේ සේවකයා" හෝ "මගේ දාසයා" යයි යමෙකු ඇමතීම තහනම්කර තිබීම.

අබූ හුරෙයිරා තුමා සහිහ් මුහම්මද් නබි (සල්) එතුමාණන්ගේ මෙසේ වදාරා සිටි බව වාර්තා කරයි: "ඔබේ ස්වාමීන්ද්‍රයාණන්ට ආහාර ගෙනඑනු; මගේ සේවකයා, මගේ දාසයා" වැනි වදන් පාවිච්චි නොකරනු." සේවකයෙකු විසින් සිය හාම්පුතා අමතන අවස්ථාවන්හි "මහත්මයා" (සයියිදි) 'සේවා යෝජකයා' වැනි වදන් පාවිච්චි කළ යුතු අතර, හාම්පුතා සිය සේවකයන් ඇමතීම සඳහා "ලමයා" වැනි වදන් පාවිච්චි කළයුතුය".

### ඉස්මතුවන කරුණු

1. සේවකයෙකු ඇමතීමේදී 'මගේ සේවකයා' 'මගේ දාසයා' වැනි වදන් පාවිච්චි නොකළ යුතුය.

2. හාම්පුතා ඇමතීමේදී 'මගේ ස්වාමීන්ද්‍රයාණෙනි' වැනි වදන් පාවිච්චි නොකළ යුතුය.

3. හාම්පුතා විසින් සිය සේවක සේවිකාවන් ඇමතීම සඳහා 'ලමයා' වැනි වදන් පාවිච්චි කළයුතුය.

4. සේවකයා විසින් සිය හාම්පුතා ඇමතීම සඳහා 'මහත්මයා' වැනි වදන් පාවිච්චි කළයුතුය.

5. වචන භාවිතයේදී පවා තවීහිදය රැකගත යුතුය.

## 55 වන පරිච්ඡේදය

## අල්ලාහ්ගේ නමින් යමක් ඉල්ලන තැනැත්තෙකුට ඉල්ලන දෙයදීම යුතුකමක් වේ.

ඉබ්න් උමර්ගේ හදිසයක් උපුටා දක්වන අබූ දාවූද් සහ අල් නසායි වාර්තා කරන අන්දම මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාර ඇත: කෙනෙක් අල්ලාහ්ගේ නාමයෙන් යමක් ඉල්ලා සිටියහොත් ඔහුට එය දිය යුතුය. යමෙක් අල්ලාහ්ගේ නාමයෙන් යමක් ඇසූ විට එයට පිළිතුරු දිය යුතුය. ඔබට යමෙක් අනුග්‍රහයක් දැක්වූවහොත් ඔබද ප්‍රතිඋපකාර කළ යුතුය. එසේ ප්‍රතිඋපකාර කිරීමට තරම් වත්කමක් ඔබට නොමැත්තේ නම් ඔබ විසින් ප්‍රමාණවත් ලෙසින් ඔහුට ප්‍රතිඋපකාර දක්වා ඇතැයි සෑහීමකට පත්වන තෙක් ඔහු වෙනුවෙන් යාඥා කළයුතුය.

### ඉස්මතුවන කරුණු

1. අල්ලාහ්ගේ නාමයෙන් රැකවරණය ඉල්ලා සිටින තැනැත්තෙකුට රැකවරණය සැලසීම යුතුකමක්වේ.

2. අල්ලාහ්ගේ නමින් යමක් ඉල්ලා සිටින තැනැත්තාට එය දීම යුතුකමක්වේ

3. අල්ලාහ්ගේ නමින් අමතනු ලැබූ කල්හි එයට පිලිතුරුදීම අත්‍යාවශ්‍යය.

4. යමෙක් ඔබට යහපතක් කළහොත් එයට ප්‍රතිඋපකාර කළයුතු බව.

5. ද්‍රව්‍යමය වශයෙන් ප්‍රතිඋපකාර කිරීමට තරම් වත්කමක් නොමැති නම් උපකාර කළ තැනැත්තාට පිං පැමිණවීම ප්‍රමාණවත්වේ.

6. ”ප්‍රමාණවත් ලෙසින් ඔහුට ප්‍රතිඋපකාර දක්වා ඇතැයි සෑහීමකට පත්වන තෙක් යාඥා කරනු.” යන ප්‍රකාශය.

## 56 වන පරිච්ඡේදය

### සාවද්‍ය ලෙසින් අල්ලාහ් ගැන සැක පහල කිරීම තහනම් කිරීම

”මෙම කාරණය සම්බන්ධයෙන් අපට යමක් කිරීමට ඉඩ තිබුනා නම් .....” යනුවෙන් ඔවුහු විශ්වාස නොකරන්නවුන් මෙන්, සාවද්‍ය ලෙස අල්ලාහ් ගැන සැක පහල කරති.... සිය දැය මුළුමනින්ම අල්ලාහ්ට බාරය.”යි කියව.[1]

අල්ලාහ් සුබහානහුවතආලා මෙසේ වදාරා සිටී: කුහකයින්ද, පිළිරූ අදහන්නන්ද සාවද්‍ය ලෙස අල්ලාහ් ගැන සැක පහල කරති. ඔවුනට නපුරක්ම සිදුවේ.”[2] ඉහත දැක්වෙන පාඨය පැහැදිලි කරමින් ඉබ්න් අල් කයියිම් මෙසේ කරුණු දක්වයි: ”අල්ලාහ් සුබහමානහුවතආලා නබි (සල්) වහන්සේට ජයග්‍රහණය හිමිකර නොදී ඉස්ලාමයේ දියුණුව අඩපන කරනු ඇතැයිද, මුස්ලිම්වරුනැට මුහුණ පෑමට සිදුවූ පසුබෑම අල්ලාහ් විසින් සිය ප්‍රඥා මහිමය අනුව සිදු නොකළේ යයිද විශ්වාස නොකරන්නවුන් සිතූහ.” අල්ලාහ්ගේ දූතයාණන්ගේ ව්‍යාපාරය සාර්ථක කර සියළු බලවේගයන් අභිබවා අල්ලාහ් විසින් සිය දේව කරුණාව (කද්රය) දක්වා මුස්ලිම්වරුන්ට විජයග්‍රහණය අත්පත්කර දෙනු ඇත යන්න ගැන විරුද්ධවාදීන් සැක පහල කළහ. සූරා අල් ෆත්හ් දැක්වෙන අයුරු කුහකයින්ද පිළිරූ අදහන්නන්ද එසේ සැක පහල කරගෙන සිටියහ. අල්ලාහ්ද අල්ලාහ්ගේ ප්‍රඥා හිමයද ඔහුගේ ආශිර්වාදයද ඔහුගේ ප්‍රතිඥාවද කෙරෙහි සැක පහල කරන

හෙයින් එය දුෂ්ඨ සිතුවිල්ලක් වන්නේය.

අල්ලාහ් විසින් සදාකාලිකවම සත්‍යය හා යහපතට එදිරිව අසත්‍යයට සහ දුෂ්ඨකමට ජයග්‍රහණය හිමිකරනු ඇතැයි සිතීමද, සෑම සිදුවීමක්ම අල්ලාහ්ගේ කද්රය හා විධානය අනුව සිදුවන බව ප්‍රතික්ෂේප කිරීමද, සෑම සිදුවීමක්ම අහම්බෙන් සිදුවූවා යයි සිතා අල්ලාහ්ගේ ප්‍රඥා මහිමය අනුව සිදුවූ සිදුවීම් සම්බන්ධයෙන් අල්ලාහ්ට කීර්ති ප්‍රශංසා පුද නොකිරීමද විශ්වාස නොකරන්නවුන්ගේ සැක පහල කිරීමෙන් හටගත් මානසික තත්වයකි. ඔවුනට නිරයේ ගිණිමැලයම හිමිවේ.

තමන්ට මෙන්ම සෙසු අයටද සිදුවූ සිදුවීම් සම්බන්ධයෙන් බොහෝ දෙනා මෙම සාවද්‍ය මනෝ තත්වයට පත්වෙති. අල්ලාහ් ගැනත් ඔහුගේ ගුණාංගයන් සහ ඔහුගේ ප්‍රඥා මහිමය ගැන දැනුමක් ඇත්තවුන් පමණක් මෙම තත්වයෙන් මිදී සිටිති. සැකයට ගොදුරුවූ සිටින බුද්ධිමත් පාඨකයාට මෙම අවවාදයෙන් ප්‍රයෝජනය ලැබේවා! වැරදීමට ක්ෂමාව අයදීමට උත්සුකවිය යුතුය. ඔබ දක්නා හඳුනන බොහෝ දෙනෙකු ගැන සිතන්න. ඔවුන් අල්ලාහ්ගේ කද්රයට එරෙහිව ඉරණමට දොස් පවරමින් සිටිනු ඔබට දකින්ට ලැබෙනු ඇත. සහෝදර පාඨකය, ඔබ ගැනම සිතා බලන්න; ඔබ මෙම සිතුවිල්ලෙන් මිදී සිටින අයෙක්ද? ඔබ එයනි මිදී සිටින්නේ නම් යහපති. ඔබ එයින් මිදී නොමැති නම් ඔබට වැරදී ඇති බව සලකන්න.

## ඉස්මතුවන කරුණු

1. සූරා අල් ඉම්රාන්හි ඇති පාඨයේ පැහැදිලි කිරීම.

2. සූරා අල්ෆත්හි ඇති පාඨයේ පැහැදිලි කිරීම.

3. සැකය විවිධ මාදිලියෙන් ඇතිවිය හැකි බව.

4. අල්ලාහ් ගැනද, ඔහුගේ නාමයන් හා ඔහුගේ ගුණාංගයන් ගැන දැනුමක් ඇති තැනැත්තා පමණක් සැකයෙන් මිදුනු පුද්ගලයෙක් වන්නේය.

### පා සටහන්

[1] අල්කුර්ආන් 3:154
[2] එම 48:6

# 57 වන පරිච්ඡේදය

## කොන්දේසි සහිතව යමක් කීම

අල්ලාහ් සුබහානහුවතආලා මෙසේ වදාරා සිටි: "මෙම කාරණය සම්බන්ධයෙන් අපට යමක් කිරීමට ඉඩ තිබුනා නම් අපි මෙහි විත් ඝාතනයට හා මරණයට පත් නොවෙන්නෙමු...." යයිද, තුමූ (යුද්ධයට නොගොස්) නැවතී තම සහෝදරයන් ගැන "ඔවුන් අපේ කීම් බස්වලට ඇහුම්කන් දුන්නේ නම් ඔවුහු ඝාතනය කරනු නොලබන්නෝය...." යනුවෙන් ඔවුහු කියති.[1]

සහිහි අබූ හුරෙයිරා තුමා වාර්තා කරන අන්දමට මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාලහ: ඔබට යහපතක් ගෙන දෙන දෙය ලබා ගැනීම සඳහා ප්‍රවේසමෙන් ක්‍රියා කරනු. අල්ලාහ්ගේ උපකාරය පතනු. යහමාර්ගයෙන් බැහැර නොයනු. පාඩුවක් සිදුවුවත් "මා අසවල් අසවල් ආකාරයට ක්‍රියා කළ නම් මෙසේ සිදු නොවන්න තිබුනි." යනුවෙන් ප්‍රකාශ කරමින් කම්පාවට පත් නොවෙනු. ඒ වෙනුවට අල්ලාහ් මෙසේ විධානය කර ඇත. අල්ලාහ්ගේ විධානය අනුව මෙසේ සිදුවී ඇත." යයි කියනු. එසේ හෝ මෙසේ ක්‍රියා කළා නම් යනුවෙන් අනුමාන කිරීම සාතන්ට දොර විවෘත කර දීම වේ.

## ඉස්මතුවන කරුණු

1. සූරා අල් ඉම්රාන්හි ඇති පාඨයන් දෙක[2] පැහැදිලි කිරීම.

2. ආපදාවකට මුහුණ දුන් අවස්ථාවක 'එසේ' හෝ 'මෙසේ' කළානම් යනුවෙන් අනුමාන කිරීමේ ඇති වැරදි සහගත බව.

3. සාතන්ට දොර විවෘතකිරීම පිළිබඳ අවවාද කිරීම.

4. යහපත් සිතුවිලි හා යහපත් වචන පිළිබඳ අවවාදය.

5. අල්ලාහ්ගේ පිහිට පතමින් යහපත් දෙය ලබාගැනීමට ක්‍රියා කිරීම.

6. එයට පටහැනිව ක්‍රියා කිරීම හෙළාදැක ඇත.

## පා සටහන්

[1] අල්කුර් ආන් 3:154, 3:168

[2] අල්කුර්ආන් 3:154ල 3:168

# 58 වන පරිච්ඡේදය

## සුලඟට දොස් නොපවරනු

උබෙයි ඉබ්න් කාබ්ගේ හදිසයක් උපුටා දක්වන අල් තිර්මිදි වාර්තා කරන අන්දමට මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාරා ඇත: "සුලඟට දොස් නොපවරනු. සුලඟ ඔබේ අභිලාසයන්ට හරස්වන්නේ නම් "ස්වාමින්ද්‍රයාණෙනි! මෙම සුලඟේ වාසිය අපට සලසා දෙනු මැව! අපට යහපතක්ම සලසා දෙන ලෙස විධාන කරනු මැනව. මෙම සුලඟින් සිදුවිය හැකි හානියෙන් අප අරක්ෂා කරනු මැනව. සිදුවීමට ඉඩ ඇති බරපතලම හානිය වලක්වාලනු මැනව." යනුවෙන් යාඥා කරනු.

### ඉස්මතුවන කරුණු

1. සුලඟට දොස් පැවරීම තහනම්කර ඇත.

2. ආපදාවකට මුහුණපාන අවස්ථාවකදී අල්ලාහ්ගේ පිහිට පැතිය යුතුය.

3. අයහපතක් වුවද දේව විධානය අනුව සිදුවන බව.

4. අල්ලාහ් විසින් ආපදාවක් මෙන්ම යහපතක්ද සිදුකරන බව.

## 59 වන පරිච්ඡේදය

### සාවද්‍ය ලෙසින් අල්ලාහ් ගැන සැක පහල කිරීම තහනම් කිරීම

"මෙම කාරණය සම්බන්ධයෙන් අපට යමක් කිරීමට ඉඩ තිබුනා නම්" යනුවෙන් ඔවුහු විශ්වාස නොකරන්නවුන් මෙන්, සාවද්‍ය ලෙස අල්ලාහ් ගැන සැක පහල කරති. සිය දැය මුළුමනින්ම අල්ලාහ්ට බාරය."යි කියව. [1]

අල්ලාහ් සුබ්හානහුවතආලා මෙසේ වදාරා සිටී : "කුහකයින්ද, පිළිරූ අදහන්නන්ද සාවද්‍ය ලෙස අල්ලාහ් ගැන සැක පහල කරති. ඔවුනට නපුරක්ම සිදුවේ." [2] ඉහත දැක්වෙන පාඨය පැහැදිලි කරමින් ඉබ්න් අල් කයියිම් මෙසේ කරුණු දක්වයි : "අල්ලාහ් සුබ්හානහුවතආලා නබි (සල්) වහන්සේට ජයග්‍රහණය හිමිකර නොදී ඉස්ලාමයේ දියුණුව අඩපන කරනු ඇතැයිද, මුස්ලිම්වරුනට මුහුණ පෑමට සිදුවූ පසුබෑම අල්ලාහ් විසින් සිය ප්‍රඥා මහිමය අනුව සිදු නොකළේ යයිද විශ්වාස නොකරන්නවුන් සිතූහ." අල්ලාහ්ගේ දූතයාණන්ගේ ව්‍යාපාරය සාර්ථක කර සියළු බලවේගයන් අභිබවා අල්ලාහ් විසින් සිය දේව කරුණාව (කද්රය) දක්වා

මුස්ලිම්වරුන්ට විජයග්‍රහණය අත්පත්කර දෙනු ඇත යන්න ගැන විරුද්ධවාදීන් සැක පහල කළහ. සූරා අල් ෆත්හ් දැක්වෙන අයුරු කුහකයින්ද පිළිරූ අදහන්නන්ද එසේ සැක පහල කරගෙන සිටියහ. අල්ලාහ්ද අල්ලාහ්ගේ ප්‍රඥා මහිමයද ඔහුගේ

ආශිර්වාදයද ඔහුගේ ප්‍රතිඥාවද කෙරෙහි සැක පහල කරන හෙයින් එය දුක්ඛ සිතුවිල්ලක් වන්නේය.

අල්ලාහ් විසින් සදාකාලිකවම සත්‍යය හා යහපතට එදිරිව අසත්‍යයට සහ දුක්ඛකමට ජයග්‍රහණය හිමිකරනු ඇතැයි සිතීමද, සෑම සිදුවීමක්ම අල්ලාහ්ගේ කද්රය හා විධානය අනුව සිදුවන බව ප්‍රතික්ෂේප කිරීමද, සෑම සිදුවීමක්ම අහම්බෙන් සිදුවූවා යයි සිතා අල්ලාහ්ගේ ප්‍රඥා මහිමය අනුව සිදුවූ සිදුවීම් සම්බන්ධයෙන් අල්ලාහ්ට කීර්ති ප්‍රශංසා පුද නොකිරීමද විශ්වාස නොකරන්නවුන්ගේ සැක පහල කිරීමෙන් හටගත් මානසික තත්වයකි. ඔවුනට නිරයේ ගිණිමැලයම හිමිවේ.

තමන්ට මෙන්ම සෙසු අයටද සිදුවූ සිදුවීම් සම්බන්ධයෙන් බොහෝ දෙනා මෙම සාවද්‍ය මනෝ තත්වයට පත්වෙති. අල්ලාහ් ගැනත් ඔහුගේ ගුණාංගයන් සහ ඔහුගේ ප්‍රඥා මහිමය ගැන දැනුමක් ඇත්තවුන් පමණක් මෙම
තත්වයෙන් මිදී සිටිති. සැකයට ගොදුරුවී සිටින බුද්ධිමත් පාඨකයාට මෙම අවවාදයෙන් ප්‍රයෝජනය ලැබේවා! වැරදිමට සමාව අයදිමට උත්සුකවිය යුතුය. ඔබ දක්නා හඳුනන බොහෝ දෙනෙකු ගැන සිතන්න. ඔවුන් අල්ලාහ්ගේ කද්රයට එරෙහිව ඉරණමට දොස් පවරමින් සිටිනු ඔබට දකින්ට ලැබෙනු ඇත. සහෝදර පාඨකය, ඔබ ගැනම සිතා බලන්න; ඔබ මෙම සිතුවිල්ලෙන් මිදී සිටින අයෙක්ද? ඔබ එයනි මිදී සිටින්නේ නම් යහපති. ඔබ එයින් මිදී නොමැති නම් ඔබට වැරදී ඇති බව සලකන්න.

ඉගෙනගත යුතු කරුණු

1. සූරා අල් ඉම්රාන්හි ඇති පාඨයේ පැහැදිලි කිරීම.

2. සූරා අල්ෆත්හි ඇති පාඨයේ පැහැදිලි කිරීම.

3. සැකය විවිධ මාදිලියෙන් ඇතිවිය හැකි බව.

4. අල්ලාහ් ගැනද, ඔහුගේ නාමයන් හා ඔහුගේ ගුණාංගයන් ගැන දන්නා තැනැත්තා පමණක් සැකයෙන් මිදුනු පුද්ගලයෙක් වන්නේය.

පාද සටහන්

[1] අල් කුර්ආන් 3 : 154

[2] අල් කුර්ආන් 48 : 6

## 60 වන පරිච්ඡේදය

## කද්ර් ප්‍රතික්ෂේප කරන්නෝ

මුස්ලිම් වාර්තා කරන අන්දමට ඉබ්න් උමර් මෙසේ පවසා ඇත: "උහද් කන්ද තරමට සුවිශාල රන් තොගයක් සතු මිනිසකු ඒ සියල්ලම අල්ලාහ්ගේ මාර්ගයෙහි වියදම් කළත් ඔහු කද්ර් ගැන විශ්වාස නොකරන්නේ නම් අල්ලාහ් ඔහුගේ ත්‍යාගශීලිත්වය පිලිනොගන්නා බව මම මගේ ජීවිතයද ආත්මයද රඳවාගෙන සිටින අල්ලාහ්ගේ නමින් ප්‍රකාශ කර සිටිමි." මෙම කියමන සනාථ කිරීම සඳහා ඔහු මුහම්මද් නබී (සල්) වහන්සේගේ ප්‍රකාශයක් මෙසේ උපුටා දක්වයි: "ඊමාන් යනුවෙන් අදහස් කරනුයේ අල්ලාහ්තආලා ගැනත්, ඔහුගේ මලාඉකාවරුන් ගැනත්, ශුද්ධ පුස්තකයන් ගැනත්, අනාගත වක්තෘන් වහන්සේලා ගැනත්, විනිශ්චය දිනය ගැනත් සෑම යහපතක් හෝ අයහපතක් සම්බන්ධයෙන් අල්ලාහ්ගේ කද්ර් ගැන විශ්වාස කිරීමවේ." සෑම දෙයක්ම එම අවස්ථාවෙහි ලියන්ට යෙදුනි." ඉබ්න් වහබ් වාර්තා කරන අන්දමට "යමෙක් කද්ර් ගැන - එනම් යහපත් හා අයහපත් සිදුවීම් ගැන - විශ්වාස නොකරන්නේද අල්ලාහ්තආලා විසින් ඔහු නිරයේ ගිණිමැලයට හෙලනු ඇත."

ඉබ්න් අල් දයිලාමේගේ මුස්නාද්හිද අල් හකීම්ගේ සහිහි ද මෙසේ දැක්වේ: "මම උබෙයි ඉබ්න් කාබ් වෙත පැමිණ කද්ර් පිළිබඳ මගේ අදහස ඔහුට පැවසුවෙමි. මගේ සිතේ යම් සැකයක්

ඇති වන්නේ නම් අල්ලාහ් විසින් එම සැකය දුරු කරනු ඇත යන බලාපොරොත්තුවෙන් ඔහු මට උපදෙස් දුන්නේය. අනතුරුව ඔහු මට මෙසේ පැවසුවේය. "ඔබට සිදුවූ හෝ සිදු නොවූ දේ ඒකාන්තයෙන්ම එසේ සිදුවීමට හෝ සිදුනොවීමට අල්ලාහ් විසින් සැලසුම්කර තිබූ බව ඔබ විශ්වාස කළ යුතුය. ඔබ විසින් උහද් කන්දේ බරට රත්‍රං දන්දෙනු ලැබුවත් කද්ර් ගැන ඔබ විශ්වාස කරන තෙක් අල්ලාහ් එය භාර නොගනු ඇත. එවන් ස්ථිරසාර නිගමනයකට එළඹීමට පෙරාතුව ඔබ මිය ගියහොත් ඔබ හෙලනු ලබන්නේ නිරයේ ගිණි මැලයටයි." අනතුරුව මම අබ්දුල්ලා ඉබ්න් මසූද්, හුදෙයිෆා ඉබ්න් අල් යමාන් සහ සයිද් ඉබ්න් තාබිත්ගේ උපදෙස් පැතුවෙමි. ඔවුන් සියළු දෙනාම මුහම්මද් නබි (සල්) වහන්සේගේ එම හදීසය අනුමත කළහ.

## ඉස්මතුවන කරුණු

1. කද්ර් ගැන විශ්වාස කිරීම යුතුකමක්වේ.

2. කද්ර් ගැන විශ්වාස කිරීම යන්නෙහි අර්ථය.

3. කද්ර් පිළිබඳ විශ්වාස නොකරන පුද්ගලයා හෙලාදැකීම.

4. කද්ර් ගැන විශ්වාස කරන තෙක් ඊමානය පරිපූර්ණ නොවේ.

# 61 වන පරිච්ඡේදය

## පිළිරූ තනන්නෝ

මුස්ලිම් සහ බුහාරි වාර්තා කරන අන්දමට අබූ හුරෙයිරා (රළි) තුමාගේ හදීසයක් අනුව මුහම්මද් නබි (සල් වහන්සේ මෙසේ වදාලහ: අල්ලාහ්තාආලා මෙසේ වදාරා සිටි: ”මවිසින් මවනු ලබන ආකාරයට තමන්වද මැවිය හැකියයි ප්‍රකාශ කරන තැනැත්තාට වඩා අසාධාරණවූ අයෙක් නැත. ඔවුනට පරමාණුවක් හෝ මැවිය හැකිද? එක් ධාන්‍ය ඇටයක් හෝ මැවිය හැකිද? ආයිෂා (රළි) තුමියගේ හදීසයක් උපුටා දක්වමින් ඔවුහු මෙසේ වාර්තා කරති. මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාලහ: ”විනිශ්චය දිනයේදී වඩා බරපතල දඬුවම් පමුනුවනු ලබන්නේ අල්ලාහ්ගේ මැවිලි සමඟ තරඟ වදින තැනැත්තාටය”. ඔවුන් වාර්තා කරන අබ්බාස්ගේ හදීසයක් අනුව මුහම්මද් නබි (සල්) මෙසේ වදාරා ඇත: ”සෑම සිත්තරෙකුම නිරයේ ගිණි මැලය දෙසට ගමන් කරයි. ඔහුගේ සෑම චිත්‍රයකටම ජීවය දෙනු ලැබ එමගින් නිරයේදී වේදනාත්මක දඬුවමක් ඔහුට දෙනු ඇත.” තවත් හදීසයක් අනුව පිළිරුවක් තනනු ලබන තැනැත්තා වෙත එය දෙනු ලැබ එයට ජීවය දෙන මෙන් අණ කරනු ලැබේ. එහෙත් ඔහුට කිසි කලෙක එම කාර්යය සිදු කළ හැක නොවේ.”

මුස්ලිම් වාර්තා කරන අන්දමට අබූ අල් හයියාර් මෙසේ පැවසිය. ”දිනක් අලි මගෙන් මෙසේ ප්‍රශ්නයක් ඇසුවේය.

මුහම්මද් නබි (සල්) එතුමන්ගේ විසින් මා වෙත පවරනු ලැබූ කාර්යයක් මා ඔබ වෙත පවරන්නද? කිසිදු පිළිරුවක් පොළොවට සමතලා නොකොට ඉතිරිව නොතබනු. තවද කිසිදු උස් මිනීවලක් පොළොවේ මට්ටමට සමතලා නොකර ඉතිරිව නොතබනු."

## ඉස්මතුවන කරුණු

1. පිළිරූ තනන්නන් තදබල ලෙසින් හෙළාදැක තිබීම.

2. එයට හේතුව පැහැදිලි කිරීම. "මවිසින් මවනු ලබන ආකාරයට තමන්වද මැවිය හැකි යයි ප්‍රකාශ කරන තැනැත්තා වඩා අසාධාරනවූ අයෙක් නැත." යනුවෙන් අල්ලාහ්තආලා විසින් කර තිබෙන ප්‍රකාශයෙන් මෙය මොනවට ඔප්පුවේ.

3. අල්ලාහ් සතු බලය මිනිසාගේ නොහැකියාව සමඟ සංසන්දනය කර පෙන්වීම. "ඔවුනට පරමාණුවක් හෝ මැවිය හැකිද? ඔවුනට ධාන්‍ය ඇටයක් හෝ මැවිය හැකිද?" යන ප්‍රකාශයෙන් මෙය ඉස්මතුකර දැක්වේ.

4. ඔවුනට දෙනු ලබන දඬුවම ඉතාමත් බරපතල වන බව.

5. පිළිරු තනන්නා විසින් තනනු ලැබූ සෑම පිළිරුවකටම ජීවය දෙනු ලැබ එමගින් එම තනනු ලැබූ තැනැත්තාට වේදනාත්මක දඬුවම් පමුණුවන් ලබන බව.

6. සෑම සිත්තරෙකුටම තමා විසින් අඳිනු ලැබූ චිත්‍රවට ජීවය දෙන මෙන් විධානය කරනු ලබන බව.

7. සෑම පිළිරුවක්ම බිඳ විනාශ කර දමන ලෙසටවූ විධානය.

## 62 වන පරිච්ඡේදය

## නිතර දිවුරීම

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: "තොපගේ දිවුරුම් ආරක්ෂා කරවු."[1]

සල්මාන්ගේ හදීසයක් උපුටා දක්වන අල් තබ්රානී වාර්තා කරන අන්දමට මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාරා ඇත: "තුන්වන වර්ගයක පුද්ගලයන් සමඟ අල්ලාහ් කථා නොකරනු ඇත; ඔවුනට ආශිර්වාද කරනු ලබන්නේ නැත. ඔවුනට හිමිවන්නේ දැඩි දඬුවම්ය. ඔවුන් එනම්: කාමයේ වරදවා හැසිරෙන පුද්ගලයා, උඩඟු පුද්ගලයා සහ විකිනීම්, මිලයට ගැනීම් වැනි වානිජ කටයුතු සඳහා නිතර නිතර අල්ලාහ්ගේ නමින් දිවුරන පුද්ගලයාය."

ඉම්රාන් ඉබ්න් හුසෙයින් (රලි) තුමා සහිහි වාර්තා කරන අන්දමට මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාරා ඇත: "මගේ ජනතාවගෙන් හොඳම අයවලුන් සිටින්නේ මගේ සකාලීනයන් අතරෙහිය. ඊළඟට හොඳම අය සිටින්නේ ඔවුනට පසුව එන පරම්පරාවෙහිය." ඉම්රාන් වැඩිදුරටත් මෙසේ පවසයි: "උන්වහන්සේ තමන්ගෙන් පසුව එන පරම්පරා දෙකක් ගැන සඳහන් කළේද යන්න මට හරියාකාරව මතක නැත. එහෙත් උන්වහන්සේ මෙසේද වදාරා සිටියහ: ඊලඟට එන පරම්පරාව කිසිවෙකුගේ ඉල්ලීමක් නොමැතිව සාක්ෂිදීමට ඉදිරිපත්වෙති.

කිසිදු විශ්වාසයක් තැබිය නොහැකි ඔවුන් අනෙක් අය පාවා දෙති. දෙනු ලබන පොරොන්දුවක් ඉටු නොකරති."

ඉබ්න් මසූද් විසින්ද සහිහි වාර්තා කරන අන්දමට මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාරා ඇත: "මගේ ජනතාවගෙන් හොඳම අයවලුන් වන්නේ මගේ සමකාලිනයන්ය. ඊළඟට හොඳ අයවලුන් වන්නේ ඔවුන්ගෙන් පසුව එක පරම්පරාවකි. ඊළඟට හොඳ අයවලුන් වන්නේ ඔවුන්ටත් පසුව එන පරම්පරාවයි. ඔවුන්ටත් පසුව එන පරම්පරාව හදිසි තීරණ අනුව සාක්ෂි දරති." ඉබ්‍රාහිම් මෙසේ පවසයි: "අපි නොමේරූ කුඩා කාලයෙහි හදිසි තීරණයක් උඩ සාක්ෂිදීම හේතුකොට ගෙන අපේ වැඩිහිටියන්ගෙන් ගුටි කෑවෙමු.

## ඉස්මතුවන කරුණු

1. පොරොන්දුවක් වූ කල්හි එය ඉටුකළ යුතු බව.

2. බරපතලකම හා බැරෑරුම්කම ගැන නොතකා දිවුරුම්දීම හෙළාදැක ඇත.

3. කිසිදු ඉල්ලිමක් නොමැතිව දිවුරුම්දීම.

4. නබි (සල්) වහන්සේ ප්‍රථම පරම්පරා තුන හතර ප්‍රශංසාවට භාජනය කර තිබීම.

5. බැරෑරුම්කම ගැන නොතකා හදිසි තීරණ මත දිවුරුම්දීමට ඉදිරිපත්වන ලාබාල වියේ අය වැඩිහිටියන්ගේ දඬුවමට ලක්වීම.

### පා සටහන්

[1] අල්කුර්ආන් 5:89

# 63 වන පරිච්ඡේදය

## අල්ලාහ්ගේ සහ රසූල්වරයාගේ පොරොන්දු

අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටී: තොප අල්ලාහ් වෙත ප්‍රතිඥාවක් දුන් කල්හි එය ඉටු කරවු. පොරොන්දුවක්වී එය ස්ථිර කිරීමෙන් පසු එම පොරොන්දුව කඩ නොකරව.”[1]

බුරෙයිදා උපුටා දක්වමින් මුස්ලිම් මෙසේ වාර්තා කරයි: ”අණදෙන නිලධාරියෙකුගේ නායකත්වය යටතේ සේනාංකයක් යවනු ලැබූ සෑම අවස්ථාවකම මුහම්මද් නබි (සල්) වහන්සේ අණදෙන නිලධාරියාට මෙන්ම සාමාන්‍ය සෙබළුන්ටද අල්ලාහ් කෙරෙහි බිය බැතියෙන් ක්‍රියා කරණ ලෙස උපදෙස් දුන්හ. උන්වහන්සේ මෙසේ අනුශාසනා කළහ: ”අල්ලාහ්ගේ නමින් පෙරමුණට යනු. ඔහු නාමයෙන් ජය අත්පත් කරගනු. වෛරයෙන් තොරව විශ්වාස නොකරන්නවුන් සමඟ සටන් කරනු. මියගිය අයගේ මෘත ශරීර විකෘති නොකරනු.

ළදරුවන් නොමරනු. බහුදේවවාදී සතුරු පිරිසක් හමුවී විට ගිවිසුමකට එළඹීමට යෝනා කරන. අනතුරුව ඉස්ලාමය වෙත ඔවුන් කැඳවනු. ඔවුන් එම යෝජනාවට කැමති වුවහොත් ගිවිසුමක් ඇතිකර ගෙන ඔවුන්ගේ ප්‍රදේශයේ සිට වහාම මුහාපිරදන් බල ප්‍රදේශය වෙත සංක්‍රමණය වන ලෙස අඬගසනු. ඔවුන් ඊට එකඟ වන්නේ නම් මුහාපිරුන් වරුන්ගේ අයිතීන් හා වරප්‍රසාදයන් සියල්ලක්ම ඔවුනට හිමිවන බවට පොරොන්දුවක්

දෙනු. ඔවුන් ඊට එකඟ නොවන්නේ නම් මුස්ලිම් කඳවුරේ ස්ථිර පදිංචි කරුවන් වශයෙන් ඔවුන් සලකනු නොලබන බවත්, අල්ලාහ්ගේ නීතියට ඔවුන් යටත්විය යුතු බවත්, මුස්ලිම්වරුන් සමඟ එකතුවී සටන් නොකළහොත් යුද්ධයෙන් ලැබෙන වස්තුවෙන් කොටසක් ඔවුනට හිමි නොවන බවත් දන්වනු. මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන්නේ නම් ඔවුන් විසින් ජිස්යා (මුස්ලිම්වරුන් විසින් ගෙවිය යුතු Zසකාත් දුගීබද්ද වෙනුවට මනා සෞඛ්‍යයෙන් යුත් වැඩීහිටි මුස්ලිම් නොවන අයගේන අය කරනු ලබන බද්ද) ගෙවිය යුතු බව දන්වනු. එය ගෙවීමට එකඟ වන්නේ නම් ඔවුන් සමඟ සටන් කිරීම නවත්වනු. එයටද ඔවුන් එකඟ නොවන්නේ නම් අල්ලාහ්ගේ සහාය පතමින් ඔවුන් සමඟ සටන් වදිනු. ඔබලා සතුරු කඳවුරක් වටලා සිටින අවස්ථාවෙහි ඔවුන් අල්ලාහ් හා රසූල්වරයා සමඟ ගිවිසුමකට එළඹෙන බව දන්වා සිටියහොත් එයට එකඟ නොවනු. ඔබලා සහ ඔබලාගේ හමුදාව සමඟ ගිවිසුමකට එළඹීමට ඉඩ දෙනු. අල්ලාහ් සහ ඔහුගේ රසූල්වරයා වෙත කරනු ලබන පොරොන්දුවක් උල්ලංඝනය කිරීමට වඩා සාමාන්‍ය මිනිසුන් වෙත කරනු ලබන පොරොන්දුවක් කඩ කිරීම වරදේ බරපතල කමින් අඩුය. වටලනු ලැබූ පිරිස සම්බන්ධයෙන් අල්ලාහ්ගේ විනිශ්චය ලබාදෙන ලෙස ඉල්ලා සිටියහොත් එයට එකඟ නොවී ඒ වෙනුවට ඔබලාගේ විනිශ්චය දෙනු. ඔබලාගේ විනිශ්චය අල්ලාහ්ගේ විනිශ්චයට සම වන්නේද යන්න ඔබලා නොදන්නාහුය.

## <u>ඉස්මතුවන කරුණු</u>

1. අල්ලාහ්ගේ සහ රසූල්වරයාගේද පොරොන්දු සහ මුස්ලිම්වරුන්ගේ පොරොන්දුව අතරේ ඇති වෙනස.

2. අවදානමින් අඩුවූ විකල්පය තෝරාගන්නා ලෙසට ඇති අවවාදය.

3. අල්ලාහ්ගේ නමින් පෙරට යනු. "ඔහුගේ නාමයෙන් ජය අත්පත් කරගනු." යන විධානය.

4. "අල්ලාහ් ප්‍රතික්ෂේප කරන අය සමග සටහන් වදිනු" යන විධානය.

5. "අල්ලාහ්ගේ සහාය පතමින් ඔවුන් සමඟ සටන් වදිනු." යන විධානය.

6. "අල්ලාහ්ගේ විනිශ්චය සහ උලමාවරුන්ගේ විනිශ්චය අතර ඇති වෙනස.

7. සහාබිවරුන්ගේ විනිශ්චය අල්ලාහ්ගේ විනිශ්චයට අනුකූල වීමටත් නොවීමටත් ඉඩ ඇති බව.

පා සටහන්

(1) අල්කුර්ආන් 16:91

# 64 වන පරිච්ඡේදය

## අල්ලාහ්ගේ නමින් දිවුරීම

ජුන්දුබ් ඉබ්න් අබ්දුල්ලාගේ හදීසයක් උපුටා දක්වන මුස්ලිම්ගේ වාර්තාවක් අනුව මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාරා ඇත: එක් මිනිසෙක් මෙසේ පැවසුවේය: අල්ලාහ් දෙවියන් වහන්සේ පල්ල අල්ලාහ් ඔහුට සමාව නොදෙනු ඇත." එම අවස්ථාවෙහි අල්ලාහ්තආලා මෙසේ වදාරා සිටියහ: "අසවලාට මම සමාව නොදෙන බව කියන්නේ කවරෙක්ද? ඇත්ත වශයෙන්ම මම ඔහුට සමාව දෙමින් එම කියමන බිඳ හෙළුවෙමි." අබූ හුරෙයිරාගේ හදීසයක් අනුව මෙසේ දිවුරා ප්‍රකාශ කළ පුද්ගලයා දැහැමිවූ අයෙකි. එහෙත් ඔහු විසින් කරනු ලැබූ එම ප්‍රකාශය මගින් මෙලොව හා මතු ලොව ඔහුගේ දිවිය විනාශ විය.

### ඉස්මතුවන කරුණු

1. අල්ලාහ් දෙවියන් වහන්සේ පල්ල යනුවෙන් අල්ලාහ්ද පාර්ශවකරුවෙකු කර දිවිරීම වැරදි බවට වූ අවවාදය.

2. නිරයේ ගිණිමැලය කෙනෙකුට තම දෙපතුලට වඩා සමීප බව.

3. ස්වර්ගයද එසේමය.

4. සැම ප්‍රකාශයක්ම අල්ලාහ් දැන සිටින බව.

5. මිනිසා බලාපොරොත්තු නොවන්නාවූ කරුණක් සම්බන්ධයෙන් වුවද අල්ලාහ්තආලා විසින් සමාව දීමට ඉඩ ඇති බව.

## 65 වන පරිච්ඡේදය

### අල්ලාහ් විසින් මවනු ලැබූ අයෙකුට විරුද්ධව ක්‍රියා කරන ලෙස අල්ලාහ් ගෙන් ඉල්ලා සිටිය නොයුතුය

ජුබයිර් ඉබ්න් මුතයිම් (රලි) තුමාගේ හදීසයක් උපුටා දක්වමින් අබූ දාවුද් මෙසේ වාර්තා කරයි: දිනක් එක් එඩේරෙක් මුහම්මද් නබි (සල්) වහන්සේ වෙත පැමිණ "අල්ලාහ්ගේ දූතයාණෙනි; මිනිසුන් මිය යති! පවුල් රාශියක් සාගින්නෙන් පෙළෙති; වස්තු විනාශ වන්නේය, අපට වැසි වස්සවන ලෙස ඔබේ ස්වාමින්ද්‍රයාණන්ට ආයාචනා නොකරන්නේ ඇයි? අප ඔබට විරුද්ධව අල්ලාහ්ගෙන් අයැද සිටින්නෙමු." යයි ප්‍රකාශ කළේය. නබි (සල්) වහන්සේ එයට සවන්දී සිට "සුබහාන අල්ලාහ්" (අල්ලාහ්ට කීර්ති ප්‍රශංසා හිමිවේවා) යයි පමණක් කීහ. උන්වහන්සේ කෝපය සහාබාවරුන්ට දැකගත හැකිවන තෙක්ම "සුබහාන අල්ලාහ්" යයි කියමින් සිටියහ. අන්තිමේදී උන්වහන්සේ මෙසේ වදාලහ: "ඔබට අයපතක්ම වේවා! අල්ලාහ් කවරෙක්දැයි ඔබ නොදන්නේද? යමෙකුට විරුද්ධව කටයුතු කරන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටින්නේ කෙසේද? ඔහු අද්විතීයය. අති උත්කෘෂ්ඨය."

## ඉස්මතුවන කරුණු

1. යමෙකුට විරුද්ධව කටයුතු කරන මෙන් අල්ලාහ්ගෙන් අයැද සිටීම හෙළාදැක ඇත.

2. නබි (සල්) වහන්සේට ඇතිවූ කෝපය සහාබාවරුන්ගේ මුහුණුවලින්ද පිළිබිඹු විය.

3. තමන් වෙනුවෙන් අල්ලාහ්ට ආයාචනා කරන ලෙසට කරනු ලැබූ ඉල්ලීමට සාවධානව සවන්දීම.

4. "සුබහාන අල්ලාහ්" යන වදන්වල අර්ථය.

# 66 වන පරිච්ඡේදය

## නබි (සල්) වහන්සේ විසින් තවුහිදය පුරැකීම සහ ෂිර්කය කරා ඇති මාර්ගය ඇහිරීම

අබූ දාවුද් වාර්තා කරන අන්දමට අබ්දුල්ල ඉබ්න් අල් ෂික්ෂිර් (රලි) තුමා මෙසේ ප්‍රකාශ කාට ඇත: මම මුහම්මද් නබි (සල්) වහන්සේ බැහැ දැකීමට ගිය බනූ අඑර් ගොත්‍රික නියෝජිත පිරිසේ සාමාජිකයෙකුව සිටියෙමි. අපි උන්වහන්සේ හමුවූ විට "අපේ ස්වාමීහු ඔබයි." යනුවෙන් පැවසුවෙමු. එය ඇසූ උන්වහන්සේ "අපේ ස්වාමිහු අල්ලාහ්ය, උන්වහන්සේට කීර්ති, ප්‍රශංසා හිමිවේවා." යයි වදාලහ: අනතුරුව අපි "ඔබ වහන්සේ මහත් ත්‍යාගශීලිය, සුචරිතවත්ය, බලසම්පන්නය." යයි කීවෙමු. එවිට උන්වහන්සේ "ඔබලා පැමිණි කාරණය කියා සිටිනු. සාතන්ගේ පෙළඹවීම්වලට යටත් නොවනු." යයි ප්‍රකාශ කළහ.

අල් නසායි වාර්තා කරන අන්දමට අනාස් (රලි) තුමා මෙසේ ප්‍රකාශ කළේය: වරක් එක් රිසක් "අල්ලාහ්ගේ දූතයාණෙනි, අප අතුරින් ප්‍රමුඛයාණෙනි, උසස්තමයාගේ පුත්‍රයාණෙනි, අපේ ස්වාමිනි, අපගෙ ස්වාමින්ද්‍රයාණන්ගේ පුත්‍රයාණෙනි," යනුවෙන් අමතනු ලැබූවිට නබි (සල්) වහන්සේ ඔවුන්ගේ ඇමතුමට බාධා කරමින් මෙසේ වදාලහ: "වැසියනි, ඔබලා කියන්න පැමිණි කරුණ කියා සිටිනු. ඔබලාගේ හැඟීම් සාතන්ට යටත් නොකරනු. මම මුහම්මද්ය. අල්ලාහ්ගේ

සේවකයා සහ දූතයා පමණක් වෙමි. අල්ලාහ්තආලා විසින් මට පවරනු ලැබ ඇති තත්වයෙන් ඉහලට මා ඔසවා නොතබනු. අල්ලාහ්ට සියලු කීර්ති ප්‍රශංසා හිමිවේවා!

**<u>ඉස්මතුවන කරුණු</u>**

1. අතිශයෝක්තියෙන් වර්ණනා නොකරන ලෙසට අවවාද කිරීම.

2. "අපේ ස්වාමිණී" යනුවෙන් අමතනු ලැබූ විට පිලිතුරැ දිය යුතු ආකාරය.

3. ඔවුන් සත්‍යය පමණක් කියා තිබියදිත් "සාතාන්ගේ පෙළඹවීම්වලට යටත් නොවනු" යයි විධානය කිරීම.

4. "මගේ තත්වයෙන් ඔබ්බට මා ඔසවා නොතබනු" යන ප්‍රකාශය.

# 67 වන පරිච්ඡේදය

## අල්ලාහ් අගය කළයුතු ප්‍රමාණයට ඔවුහු ඔහු (අල්ලාහ්) අගය නොකරති. විනිශ්චය දිනයේදී මුළු මහත් පොළෝ තලය ඔහුගේ හස්තයේය.[1]

ඉබ්න් මසූද් මෙසේ වාර්තා කරයි! දිනක් පූජකයෙකු මුහම්මද් නබි (සල්) වහන්සේ වෙත පැමිණ, "මුහම්මද්, අල්ලාහ් අහස්තලයන් එක් ඇඟිල්ලකද, පොළෝ තලයන් එක් ඇඟිල්ලකද, ගස් කොළන් ඇඟිල්ලකද, ජලය ඇඟිල්ලකද, මිනිස් වර්ගයා ඇඟිල්ලකද රඳවාගෙන මමයි රජු යයි කියන බව ශුද්ධ පුස්තකයන්හි සඳහන්වේ. මෙයින් අදහස් කරන්නේ කුමක්දැයි විමසුවේය. එවිට නබි (සල්) වහන්සේ සිනාසී අල්ලාහ් සම්බන්ධයෙන් පූජකවරයා කළ ප්‍රකාශය තහවුරු කරමින් පහත දැක්වෙන පාඨය කියවා පෙන්නුවේය. "අල්ලාහ් අගය කළයුතු ප්‍රමාණයට ඔවුහු ඔහු (අල්ලාහ්) අගය නොකරති. විනිශ්චය දිනයේදී මුළු මහත් පොළෝ තලය ඔහුගේ හස්තයේය. අහස්ද ඔහුගේ දුරනෙහි හකුළුවා තිබෙනු ඇත. ඔහු සුවිශුද්ධය. ඔවුන් සමානයන් තබන දෙයට වඩා ඔහු අත්‍යුත්කෘෂ්ටය.[2]

මුස්ලිම් වාර්තා කරන හදීසයක් අනුව මෙසේ කියැවේ: කඳු සහ ගස් කොළන් එක් ඇඟිල්ලක රඳවාගෙන සිටින ඔහු ඒ සියල්ලම සොලවා "මම රජයු. මම අල්ලාහ්ය." යනුවෙන් ප්‍රකාශ කරයි. බුහාරියේ ප්‍රකාශයක් අනුව අල්ලාහ් ආකාශයන්

එක ඇඟිල්ලකද, පොළෝ තලය සහ ජලය එක් ඇඟිල්ලකද, මිනිස් වර්ගයා තවත් ඇඟිල්ලකද රඳවා ගනී. ඉබ්න් උමර්ගේ හදීසයක් උපුටා දක්වමින් මුස්ලිම් මේ සම්බන්ධයෙන් මෙසේ වාර්තා කරයි! "විනිශ්චය දිනයේදී අල්ලාහ්තආලා ආකාශයන් සිය දකුණු අතේ හකුළුවා ගෙන "මමයි රජ. දුෂ්ට පාලකයින් කෝ? ප්‍රතික්ෂේප කළවුන් කෝ? යනුවෙන් වදාරා සිටී:

ඉබ්න් අබ්බාස් වාර්තා කරන අන්දමට මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාරා සිටියහ: "ආකාස හත සහ පොළෝ හත අල්ලාහ්තආලා විසින් ඔබලා අබ ඇටයක් අතේ මිට මොලවාගෙන සිටින අන්දමට සිය අතේ හකුලාගෙන සිටිනු ඇත." යූනුස් සහ ඉබ්න් වහබ් උපුටා දක්වමින් ඉබ්න් ජාර් වාර්තා කරන අන්දමට ඉබ්න් සහිද් සිය පියාගෙන් අසා දැනගත් හදීසයක් අනුව මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වාර්තා කොට ඇත: අල්ලාහ්ගේ සිහසුන සමඟ ආකාශයන් හත සසඳා බලන කල්හි ඒවා රණකාමියෙකුගේ පලිහේ විසිරී ඇති දිර්හාම් කාසි හතක් බදුය. අබු දාර් (රලි) තුමා වාර්තා කරන අන්දමට මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ වදාරා ඇත. අල්ලාහ්ගේ ආසනය (ආකාශයන් හා පෘථිවින්ට ඉහළින් පැතිරී ඇති බවට කුර්ආනයෙහි විස්තරවී ඇත) ඔහුගේ සිහසුන සමඟ සසඳා බලන විට විවෘත පොළොවේ ඇති එක් දම්වැල් පුරුකක් මෙනි."

ඉබ්න් මසූද් මෙසේ වාර්තා කරයි: පහතම සහ එයට ඉහලින් ඇති අහසද ඉතිරි අහස් පහේ එක් ඒක අහස අතරද වසර පන්සියයක පරතරයක්ද, හත්වන අහස සහ අසුන අතර

තව වසර පන්සියයක පරතරයක්ද, අහස සහ ජලය අතර තවත් වසර පන්සියයක පරතරයක්ද ඇත. සිහසුන ඇත්තේ ජලයට ඉහළින්ය. අල්ලාහ් සිටින්නේ සිහසුනට උඩින්ය. එබඟේ කිසිදු ක්‍රියාවක් අල්ලාහ්ගේ දෘෂ්ටියට මඟහැරෙන්නේ නැත.

අබූ දාවූද් සහ තවත් හදීස් සංස්කාරකයින් කිහිප දෙනෙක් වාර්තා කරන අන්දමට අබ්බාස් ඉබ්න් අබ්ද් අල් මුතාලිබ් මෙසේ පවසයි: මුහම්මද් නබි (සල්) වහන්සේ මෙසේ විචාළේය: අහස සහ පොළොව අතරේ ඇති දුර ප්‍රමාණය ඔබලා දන්නේද? "එය මැනවින් දන්නේ අල්ලාහ් සහ ඔහුගේ රසූල්වරයාය." යි අපි පිළිතුරු දුන්නෙමු. එවිට උන්වහන්සේ ඒ දෙක අතරේ වසර පන්සියයක් ගමන් කිරීමේ දුරක් ඇත. එමෙන්ම එක් එක් අහස් තලයන් අතරේ එවැනිම දුරක් ඇත. එක් එක් අහසේ පළල වසර පන්සියයක් ගමන් කිරීමේ දුර ප්‍රමාණයයි. සත්වන අහස සහ සිහසුන අතරේ පිහිටා ඇත්තේ මුහුදකි. එහි මතුපිට සිට පතුලට ඇති දුර ප්‍රමාණයද වසර පන්සියයකි. අති උත්කෘෂ්ටවූ අල්ලාහ් වැඩ සිටින්නේ එයටත් ඉහළිනි. මිනිසුන්ගේ කිසිදු ක්‍රියාවක් ඔහුගේ දෘෂ්ටියෙන් මඟ නොහැරේ.

## ඉස්මතුවන කරුණු

1. "මුළු මහත් පොළෝ තලය ඔහුගේ හස්තයේය.[3] යන පාඨයේ පැහැදිලි කිරීම.

2. මුහම්මද් නබි (සල්) වහන්සේගේ කාලයෙහි මෙවන් ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුමක් යුදෙව්වන් තිබුනි. ඔවුහු එය

වසන් නොකළහ. එමෙන්ම ඔවුන් උරුම කරගත් සම්ප්‍රදායයන් අනුව අල්ලාහ් ප්‍රතික්ෂේප කළේද නැත.

3. පූජකවරයාගේ ප්‍රකාශය මුහම්මද් නබි (සල්) වහන්සේ විශ්වාස කළ අතර, එම අදහස කුර්ආනය මගින්ද තහවුරු කර ඇත.

4. පූජකවරයාගේ ප්‍රකාශය අසා නබි (සල්) වහන්සේ සිනා සුනහ. එය ප්‍රීතිය පල කිරීමේ හා අනුමත කිරීමේ සිනහවකි.

5. අල්ලාහ්ගේ හස්තයන් පිළිබඳව ඇති සදහන. ආකාශයන් ඔහුගේ දකුණු අතෙහිද, පොලෝ තලයන් ඔහුගේ වම් අතෙහිද ඇති බව.

6. අල්ලාහ්ගේ හස්තය ඔහුගේ වම්අත වශයෙන් හැදින ගැනීම.

7. උඩඟු පුද්ගලයන් සහ දුෂ්ට පාලකයන්.

8. ”ඔබලාගේ අතේ මිට මොලවාගෙන ඇති අබ ඇටයක් මෙනි” යන්නෙහි අර්ථය.

9. ආකාශයන් සමඟ සසදා බලන විට සිහසුනේ සුවිශාලත්වය.

10. අසුන සමඟ සසඳන විට සිහසුනේ සිවිශාලත්වය.

11. සිහසුන ආසනයට වෙනස් බව.

12. එක් ආකාශයක් තවත් එකකින් වෙන් කිරීමේ දුර ප්‍රමාණය.

13. සත්වන ආකාශය අහුනෙන් වෙන්කරන දුර ප්‍රමාණය.

14. අහුන ජලයෙන් වෙන් කිරීමේ දුර ප්‍රමාණය.

15. සිහසුන ජලයට ඉහලින් ඇති බව.

16. අල්ලාහ් සිහසුනට ඉහලින් වැඩ සිටින බව.

17. පොළොව ආකාශයෙන් වෙන් කිරීමේ දුර ප්‍රමණය.

18. එක් ආකාශයක දුර ප්‍රමාණය අවුරුදු 500 ක් බව.

19. අහස් තලයට ඉහලින් ඇති ජලයේ ඉහල හා පහල
කෙලවරයන් අතරෙ ඇති දුර ප්‍රමාණය අවුරුදු 500 ක් බව.

සකල විශ්වයේ අධිපතින්වූ අල්ලාහ්තආලාට සියළු ප්‍රශංසා හිමිවේවා. මුහම්මද් නබි (සල්) වහන්සේටත් ඔහුගේ බන්ධූන් හා ශ්‍රාවකයින්ටත් අල්ලාහ්ගේ ආශිර්වාදය හිමිවේවා! ආමීන්.

## පා සටහන්

[1] අල්කුර්ආන් 39:67

[2] අල්කුර්ආන් 39:67

[3] අල්කුර්ආන් 39:67

الدار العالمية للكتاب الإسلامي
ص.ب ٥٥١٩٥ ـ الرياض ١١٥٣٤
هاتف ٤٦٥٠٨١٨ ـ ٤٦٤٧٢١٣ ـ فاكس ٤٦٣٣٤٨٩